2023 ජනවාරි-මාර්තු
07 වෙළුම 02 කලාපය
ISSN 2279 - 1027
මිල රු.200/=

අරගලයට අවි තනන

# Left

# පෞද්ගලීකරණය කෝකටත් තෛලයද?



අරගලයට
අවි තනන
# Left
න්‍යායික දේශපාලන සඟරාව

2023 ජනවාරි-මාර්තු
07 වෙළුම
02 කලාපය
ISSN 2279 - 1027

**ප්‍රධාන සංස්කාරක**
ප්‍රසන්න පෙරේරා

**කර්තෘ මණ්ඩලය**
වෛද්‍ය එච්.පී. ධම්මික
සුජීව දිසානායක
වෛද්‍ය සුසිල් රණසිංහ
බිමල් රත්නායක
සුනිල් ගමගේ
ඇන්ටන් ජයකොඩි

**ආරාධිත ලේඛකයෝ**
මහාචාර්ය චන්දන අබේරත්න
මහාචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි

**පරිගණක පිටු සැකසුම**
බන්දුල පුෂ්පකුමාර

**මුද්‍රණය**
ටී.ඩී.එල්. ප්‍රින්ටර්ස්
43/43, වලව්වත්ත පාර,
ගංගොඩවිල, නුගේගොඩ.

**බෙදාහැරීම**
Lanka First Rate Publishers (Pvt) Ltd
0714 492 252

**විමසීම්**
298, කලපළුවාව, රාජගිරිය.
0777 802 707
magazineleft@gmail.com

## පෙළගැස්ම

| | |
|---|---|
| පෞද්ගලීකරණයේ ගමන් මඟ | 03 |
| මිත්‍යාව හා යථාර්ථය | 09 |
| ප්‍රතිව්‍යුහගතකරණය | 16 |
| ජාත්‍යන්තර අත්දැකීම් | 23 |
| ධනවාදී රටවල රාජ්‍ය ව්‍යවසාය | 30 |
| සමාජවාදී ආර්ථිකය | 35 |
| පෞද්ගලික අයිතිය | 39 |
| සංවාදය | 44 |
| කවි | 54 |
| සඳ මතුපිට මිනිස් කඳවුරක් | 57 |
| දැනුමෙන් ඔබ්බට | 62 |
| වැව රවුම | 66 |



## රට කරවන්ට නම්

රට කරවන්ට නම් මසුරං ඇතුව කැටේ
වටිනා කියන දේ විකිණිය යුතුය රටේ
අමන දනන් කෑ ගැසුවත් හතර වටේ
ඒවා නොවික්කොත් අපි හැම මකර කටේ

දළදා මැදුර අධිකව මිල කළ හැකිය
සිරිමහ බෝධියේ ලංසුව පැහැදිලිය
කළුගල්වලට විකුණා ගෙන සීගිරිය...
සීගිරි කුරුටු ගී බයිලා කළ හැකිය


රට කරවන්ට නම්...
රට කරවන්ට නම් මසුරං ඇතුව කැටේ
වටිනා කියන දේ විකිණිය යුතුය රටේ
අමන දනන් කෑ ගැසුවත් හතර වටේ
ඒවා නොවික්කොත් අපි හැම මකර කටේ

හෝටන් තැන්න දී ක්‍රීඩා පිටියකට
පවරා සිංහරාජය ලී මෝලකට
දුංහිඳ ඇල්ල හරවා ජල විදුලියට...
සමනල කන්ද බදු දෙමු හෝටලයකට

රට කරවන්ට නම්....
රට කරවන්ට නම් මසුරං ඇතුව කැටේ
වටිනා කියන දේ විකිණිය යුතුය රටේ
අමන දනන් කෑ ගැසුවත් හතර වටේ
ඒවා නොවික්කොත් අපි හැම මකර කටේ

ගායනය - නන්දා මාලිනී
ගී පද - සුනිල් ආරියරත්න
සංගීතය - රෝහණ වීරසිංහ

ලැබුණා යැයි කියනු ලබන නිදහසින් පසු වසර 74ක් ගෙවී ගොසිනි. එයින් ආසන්න වසර 45ක කාලයක් ගත වී ඇත්තේ නව ලිබරල් ආර්ථික ක්‍රමය තුළය. රාජ්‍ය ආයතන, මහජන දේපළ විකිණීම නව ආර්ථික උපායමාර්ගයේ ප්‍රධාන කොටස් බවට පත් කරගත් පාලකයන්ට රේස් දුවවනු ලබන අසුනට මෙන් බාහිර දැක්මක් නැත; ඔවුන්ට පෙනෙන්නේ පෞද්ගලීකරණයම පමණි. නන්දා මාලිනියගේ මේ පැරණි ගීතය අදටද අදාළ වන්නේ මේ තත්වය තුළය. මෙවර Left මේ දුෂ්ට විනාශකාරී ගමනින් රට මුදාගන්නා වසර බවට 2023 පත්කර ගැනීම වෙනුවෙනි; ඒ වෙනුවෙන් මතවාදී අවි තැනීම වෙනුවෙනි.



“නිෂ්පාදනය සමාජමය වන්නේය. නමුත් හිමි කර ගැනීම පෞද්ගලිකව කෙරෙන්නේය. සමාජමය නිෂ්පාදන මාර්ග අතළොස්සක් දෙනාගේ පෞද්ගලික දේපළ වී පවතී. නාමික වශයෙන් පිළිගනු ලබන නිදහස් තරගයේ පොදු රාමු තට්ටුව පවතින අතර අතළොස්සක් වන ඒකාධිකාරීන්ගේ විය ගසෙහි බර සිය ගුණයකින් වැඩිවී සෙසු ජනගහනයේ කරපිට වැටෙන්නේය. එය වඩාත් පීඩාදායක හා වඩාත් නොඉවසිය හැකි වන්නේය.”

**වී.අයි. ලෙනින්**
තෝරාගත් කෘති
04 වෙළුම, 49-50 පිටු




# ලංකාවේ පෞද්ගලීකරණයේ ගමන්මඟ

**චන්ද්‍රික අධිකාරි**

දේශපාලන ආර්ථික විද්‍යාවේ වඩාත් පුළුල් දේපළ ආකාර තුනක් ගැන සඳහන් කරයි. එනම් පෞද්ගලික දේපළ, රාජ්‍ය දේපළ සහ සාමූහික දේපළ වශයෙනි. පෞද්ගලීකරණය යනුවෙන් අදහස් වන්නේ රාජ්‍ය භාරයේ ඇති දේපළ හෝ සේවාවන් පෞද්ගලික අයිතියට පවරා දීමයි.

දේපළ යනු ඓතිහාසික විකාශනයකි. ලෝකයේ පැවති කිසිවකට හිමිකරුවන් නොමැති ඓතිහාසික යුගයක්ද විය. ඉංග්‍රීසි නීතිවේදියෙකු වූ විලියම් බැලැක්ස්ටෝන් (1723 - 1780) පවසන්නේ ආරම්භයේ ලෝකයේ සියලු දේ පොදු වූ අතර යම් කෙනෙක් මුලින් භාවිතා කරන්නට පටන් ගත් අයට එය හිමි වූ අතර ඔහු එය භාවිතා කරනතාක් පැවති තාවකාලික අයිතියක් පමණක් පැවැති බවයි.

ලංකාවේද ආරම්භක ස්වභාවය මෙය විය හැකි අතර ලාංකේය සමාජ විකාශනයේ ධනවාදයට පෙර පැවති ආසියාතික සමාජය තුළ දේපළ වශයෙන් ප්‍රධාන ලෙස පැවතියේ ඉඩම් වන අතර ඉඩම්වල අයිතිය රජු සතු වූ බව පිළිගැනීමයි. රජු විසින් විවිධ ආකාරයෙන් ඉඩම් බෙදා වෙන්කර දෙනු ලැබ තිබුණි. ඒ අනුව සෘජුවම රජුගේ පරිහරණයට නතු වූ ඉඩම් ගබඩා ගම් ලෙසද, ආගමික මධ්‍යස්ථාන සඳහා වෙන් වූ ඉඩම් විහාරගම් සහ දේවාල ගම් ලෙසද, පුද්ගලයින්ට ලබා දුන් ඉඩම් නින්දගම් හා සේවාගම් ලෙස පැවතියද අවසාන වශයෙන් ඒවා රජුගේ අයිතියට යටත් සේ සැලකිණි.

මේ අනුව අපට විශාල ප්‍රමාණයේ පුද්ගලික දේපළ බිහි වීම දැකගත හැක්කේ, ලංකාව තුළ යුරෝපීයයන් විසින් ධනේශ්වර ක්‍රමය උත්තරාරෝපිත කොට විශේෂයෙන්ම ඉංග්‍රීසීන් විසින් වතු වගාව ආරම්භ කිරීමෙන්ද පසුවය. 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගින් රාජකාරි ක්‍රමය අහෝසි කොට දැමීම මෙන්ම ඉන්පසු ඉංග්‍රීසීන් විසින් අනුගමනය කළ ඉඩම් ප්‍රතිපත්තිය වතු වැවිලි කර්මාන්තය ඉහළ නැංවීම අරමුණු කරගනිමින් සිදු කරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකාව තුළ මෙතෙක් නොපැවති වතු වැවිලි කර්මාන්තයක් බිහි විය. මේවා පෞද්ගලික දේපළයි.

රජු සතුව පැවති යටත්වැසි ජනයා විසින් පරිහරණය කරන ලද ඉඩම් පෞද්ගලික දේපළ බවට පත් වූ ආකාරය ආචාර්ය තිස්ස ඊරියගම විසින් රචිත "ශ්‍රී ලංකා ආර්ථිකයේ නූතන යුගය" කෘතියේ 61 වන පිටුවේ මෙලෙස සටහන් වේ.

**"ඉංග්‍රීසීන්ගේ ඉඩම් ප්‍රතිපත්තියෙන් මෙය තවදුරටත් පැහැදිලි කරගත හැකිය. වැවිලිකරුවන්ගේ අවශ්‍යතා ඉටුකරලීම සඳහා ගැමියන්ගේ ඉඩකඩම් ලබාදීමට මේ අනුව ක්‍රියා කරන ලදී. 1840 රාජ්‍ය ඉඩම් අඥා පනත අනුව ගැමියන්ට නීත්‍යානුකූල අයිතිය ඔප්පු කළ නොහැකි වූ ඉඩම් රජය විසින් අත්පත් කරගෙන ඉතා අඩු මිලකට වතු කරුවන්ට ලබා දෙන ලදී. 1856 විහාර දේවාලගම් ආඥා පනත අනුව පන්සල් සතු ඉඩකඩම්ද ලබාගෙන වැවිලිකරුවන්ට අලෙවි කරනු ලැබීය. 1872 ධාන්‍ය බදු ආඥා පනත අනුව අධික බදු ගෙවා ගත නොහැකි වීමෙන් එම ප්‍රදේශ අත්හැර පලායන්නට ගොවීන්ට සිදු විය. රජය එකී ඉඩම්ද වැවිලිකරුවන්ට ලබා දුන්නේය. 1897 මුඩු බිම් ආඥා පනත පනවා, ඉතිරි ඉඩම්ද ගැමියන්ට අහිමි කොට රජයට පවරාගෙන වතුකරුවන්ට විකුණා දැමීය."**

වර්තමාන ලංකාවේ පවතින ධනේශ්වර පෞද්ගලික දේපළ ක්‍රමයෙහි ආරම්භය මේ ආකාරයෙන් සිදු වූ අතර වතු වැවිලි ආර්ථිකය සමඟ බැඳෙමින් ලාංකේය ධනවාදයේ නැගීමත් සමඟම එය වර්ධනය වී විකාශනය වුයේය.

වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ ඇති වී තිබෙන ආර්ථික දේශපාලන අර්බුදය සමඟ බලයට පැමිණි රනිල් - රාජපක්ෂ ආණ්ඩුව විසින් රාජ්‍ය ආයතන පෞද්ගලීකරණ ප්‍රතිපත්තිය ඉහළට ඔසවා ඇත. ශ්‍රී ලංකාව මුහුණ දී තිබෙන අර්බුදයෙන් මිදීමට නම් රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම අත්‍යවශ්‍ය කාරණයක් බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පවසයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ශ්‍රී ලංකාවට ලබාදීමට නියමිත ඇමරිකානු ඩොලර් බිලියන 2.9ක ණය මුදල ලබා ගැනීමට නම් ආණ්ඩුව මේ පෞද්ගලීකරණ කොන්දේසිය සපුරාලිය යුතුය.

පෞද්ගලීකරණ ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාව තුළ ඉහළටම එසැවී ඇති මේ මොහොතේ එහි විකාශනය, ගමන් මග කුමන ආකාරයෙන් සිදු වී ඇත්දැයි පරීක්ෂා කිරීම මේ ලිපියෙහි අරමුණ වේ. ශ්‍රී ලංකාව තුළ ධනේශ්වර සංවර්ධනයත්, පෞද්ගලික ව්‍යවසායයන් ඇති වීමත් 1830 ගණන්වලින් පසු, විශේෂයෙන්ම කෝල්බෲක් ප්‍රතිසංස්කරණවලින් පසු සිදුවන්නට පටන් ගත් බව අපි ඉහතින් සඳහන් කළෙමු.

ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය ව්‍යවසායයන්ගේ විකාශනය පිළිබඳ සොයාබැලීමේදී එහි ආරම්භය දෙවන ලෝක යුද සමය දක්වා දිව යන බව ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව පවසයි.

**"1939 - 1945 අතර කාලය තුළ පැවති දෙවන ලෝක යුද සමයේදී, සැපයීම සීමා වූ අත්‍යවශ්‍ය භාණ්ඩ ලබාදීම සඳහා රාජ්‍යය ව්‍යවසායයන් කිහිපයක් පිහිටුවීම සිදු වූ කාලය දක්වා අතීතයට දිව යයි. 1950 දශකයේ මැද භාගයේදී, සෝවියට් සංගමය ලැබූ සාර්ථකත්වය සහ එම කාල පරිච්ඡේදයේදී ඉන්දියාව තුළ සමාජවාදී සංවර්ධන මතවාදයක් අනුගමනය කිරීමත් සමඟම**

**මේ අනුව අපට විශාල ප්‍රමාණයේ පුද්ගලික දේපළ බිහි වීම දැකගත හැක්කේ, ලංකාව තුළ යුරෝපීයයන් විසින් ධනේශ්වර ක්‍රමය උත්තරාරෝපිත කොට විශේෂයෙන්ම ඉංග්‍රීසීන් විසින් වතු වගාව ආරම්භ කිරීමෙන්ද පසුවය.**




**සමාජවාදය කෙරෙහි ඇති උනන්දුව ඉහළ ගියේය. ඒ අනුව රටේ සංවර්ධනය සඳහා රජය මූලික කරගත් මධ්‍යම ආර්ථික සැලසුම්කරණය අත්‍යවශ්‍ය අංගයක් ලෙස සැලකීය."**

**(ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2021 - 206 පිටුව)**

රාජ්‍ය ව්‍යවසායයන් බලගැන්වීම වේගවත් කිරීම අරමුණු කර ගනිමින් 1955 අංක 19 දරන රාජ්‍ය අනුග්‍රහය ලත් සංස්ථා පනත බලාත්මක කරන ලදී. මෙම පනත මඟින් දැනට පවතින ව්‍යවසායයන් නීතිගත කිරීම සිදු කරන ලදී. 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත මඟින් ඕනෑම කර්මාන්ත ආශ්‍රිත ක්‍රියාකාරකමක් ආරම්භ කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා රජයට බලතල ලබාගන්නා ලදී. 1957 වසර වන විට සිමෙන්ති, කඩදාසි, පිඟන් භාණ්ඩ, පාවහන් සහ සම් ආශ්‍රිත නිෂ්පාදන ඇතුළු ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් කිහිපයකම මෙහෙයුම් කටයුතු ආරම්භ කෙරිණි. එමෙන්ම 1958 වසරේදී බස් සංගම් ජනසතු කිරීම සිදු කරන ලදී. පසුව ලංකා ගමනාගමන මණ්ඩලය පිහිටුවනු ලැබිණි.

**"1959 වසරේදී, ආනයන ආදේශන මත පදනම් වූ කාර්මීකරණය පිළිබඳ අවධාරණය කෙරෙන දස අවුරුදු සැලැස්මක් හඳුන්වා දෙන ලද අතර, එම සැලැස්ම පූර්ණ වශයෙන් ක්‍රියාත්මක නොවූවද, පසු කාලයේදී මෙම සැලැස්ම ආර්ථික ප්‍රතිපත්ති සඳහා සමීප මග පෙන්වීමක් ලබාදුණි. ඒ අනුව සිමෙන්ති, වානේ, කඩදාසි, ටයර්, ඛනිජ වැලි, ලුණු, පිටි ඇඹරීම, තුනීලෑලි (ප්ලයිවුඩ්), ඛනිජ තෙල් පිරිපහදු කිරීම සහ පොහොර වැනි මූලික කර්මාන්ත රජය විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත විය."**

**(මහ බැංකු වාර්තාව 2021 - 207 පිටුව)**

මේ ආකාරයෙන් නව රාජ්‍ය ව්‍යවසායයන් ඇති කිරීම මෙන්ම පුද්ගලික ව්‍යාපාර ජනසතු කිරීම මගින්ද රාජ්‍ය ව්‍යවසායයන් පද්ධතියක් ඇති විය.

**"..... අනෙකුත් කර්මාන්ත අතරින් වරාය සේවා, මගී ප්‍රවාහනය සහ වැවිලි කර්මාන්තය වැනි අංශවල ක්‍රියාත්මක වූ පෞද්ගලික ව්‍යාපාර ජනසතු කිරීම සිදු විය. 1970 දශකයේ මැද භාගය වන විට, බැංකු, වැවිලි, මහා පරිමාණ කර්මාන්ත, ප්‍රවාහන රක්ෂණ, විදුලි සංදේශ, තැපැල් සේවා, වරාය, විදුලි බලය, ඛනිජ තෙල් ආනයනය හා බෙදාහැරීම, මහාමාර්ග, සෞඛ්‍යය හා අධ්‍යාපනය වැනි ප්‍රධාන ආර්ථික**

**රාජ්‍ය ව්‍යවසායයන් බලගැන්වීම වේගවත් කිරීම අරමුණු කර ගනිමින් 1955 අංක 19 දරන රාජ්‍ය අනුග්‍රහය ලත් සංස්ථා පනත බලාත්මක කරන ලදී. මෙම පනත මඟින් දැනට පවතින ව්‍යවසායයන් නීතිගත කිරීම සිදු කරන ලදී.**

**හා සමාජ ක්‍රියාකාරකම් රාජ්‍ය අංශයේ ඒකාධිකාරයක් ලෙස හෝ බොහෝ දුරට රාජ්‍ය ව්‍යවසායයන් විසින් ක්‍රියාත්මක කරන ලදී."**

**(ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2021 - 207 පිටුව)**

මේ අනුව සලකා බැලූ විට අපට පෙනී යන්නේ 1935 පමණ කාලයේ සිට 1970 කාලය දක්වා දශක 04 ක පමණ කාලයක් ශ්‍රී ලංකාව තුළ ව්‍යවසායයන් සහ සේවාවන් රාජ්‍ය අයිතිය යටතේ වර්ධනය වූ බවය.

1977 පැවති මහ මැතිවරණයෙන් බලයේ සිටි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පරාජය කරමින් එක්සත් ජාතික පක්ෂය බලයට පැමිණියේය. ශ්‍රී ලංකාවේ එතෙක් පැවති ආර්ථික රටාව වෙනුවට නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම ඇරඹෙන්නේ මෙතැන් සිටය. විශාල වශයෙන් රාජ්‍ය ව්‍යවසායයන් පෞද්ගලීකරණය ආරම්භ වන සංධිස්ථානය වන්නේද මෙයයි. 1977ට පෙර ශ්‍රී ලංකාවේ පැවති ආර්ථික ප්‍රතිපත්තිය සමාජවාදී එකක් වශයෙන් සමහර වාමාංශිකයන් පවා හඳුන්වා දුන්නද එය අපට හඳුනා ගන්නට වන්නේ රාජ්‍ය ධනවාදය වශයෙනි. 1960 මැද භාගය වනවිට මෙම රාජ්‍ය ධනවාදී ආර්ථික ක්‍රියාවලිය තුළ අර්බුදකාරී තත්වයන් මතු වන්නට පටන්ගෙන තිබුණි.

නව ලිබරල් ආර්ථිකයේ සහ පෞද්ගලික ක්‍රියාවලියේ ඇරඹුම ලෙස 1977 යැයි බොහෝ දෙනා සැලකුවද 1975 වන විටත් මේ පිළිබඳ මූලික ලක්ෂණ පහළව තිබුණි. 1975 වසරේදී නිදහස් වෙළඳ කලාප පිහිටුවීම පිළිබඳ යෝජනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට සම්මත කොටගෙන තිබුණි. එහෙත් එය ක්‍රියාත්මක කිරීමට ඉඩකඩක් නොවීය. 1977 සිට මේ දක්වා බලයට පැමිණි සෑම ආණ්ඩුවක් යටතේම පෞද්ගලීකරණ ක්‍රියාවලිය ඉදිරියටම ගලා ගියේය. අනෙක් කරුණ නම් මෙම පෞද්ගලීකරණ ක්‍රියාවලිය හුදෙක් රට තුළම පැන නගින කරුණකට වඩා ලෝක ආර්ථික දේශපාලන තත්වය සමඟ ගැට ගැසී ජාත්‍යන්තර මෙහෙයුම් අනුව සහ වුවමනාවන් අනුව සිදුවන කටයුතු වේ. විශේෂයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව වැනි ආයතනයන් මෙන්ම ණය ලබා දෙන බලවත් රටවල්ද අප රටේ සම්පත් සහ රාජ්‍ය ව්‍යවසායයන් විකුණා දැමීමට බල කරමින් සිටී.

1977 විශාල ජන බලයක් සහිතව බලයට පැමිණියද එක්සත් ජාතික පක්ෂයට එක වරම පෞද්ගලීකරණය ක්‍රියාවට නැංවීමට හැකි නොවීය. පෞද්ගලීකරණයට එරෙහි ජන මතයද ලාංකේය සමාජය තුළ ප්‍රබල එකක් විය. එබැවින් එජාපයට පෞද්ගලීකරණය සඳහා පසුබිම සකස් කර ගැනීමට මුල් කාලය යෙදවීමට සිදුවිය. ඒ සඳහා දේශීය සහ විදේශීය පුද්ගලික අංශයට දේශීය ආර්ථිකයට සම්බන්ධ වීම සඳහා දිරිගන්වන ලදී. දේශීය වෙළඳපොළ තුළ තරගකාරීත්වයක් ඇති කරන ලදී. පෞද්ගලික අංශයට රාජ්‍ය අංශය සමග තරග කිරීමට ඉඩ සලසන ලදී. රාජ්‍ය ව්‍යවසායන්ගේ වාණිජමය පදනම ඉහළ දමන ලදී. පාඩු ලැබූ සමහර රාජ්‍ය ව්‍යවසායයන් වසා දැමීම මෙන්ම සමහර රාජ්‍ය ආයතනවල කළමනාකාරීත්වය කොන්ත්‍රාත් පදනම මත පුද්ගලික අංශයට පැවරීමද සිදු කෙරිණි. කෙසේ වුවද පුද්ගලීකරණය රාජ්‍ය ප්‍රතිපත්තියක් වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දේ 1987 වසරේදීය.

එමෙන්ම 1987 අංක 22 දරන රාජ්‍ය සංස්ථා පනත මගින් රාජ්‍ය සතු වෙළඳ ව්‍යාපාර රාජ්‍ය සංස්ථා බවට පත් කිරීමට ඉඩ සලසන අතර 1987 අංක 23 දරන රාජ්‍ය සමාගම් පනත මගින් රාජ්‍ය සංස්ථා සහ රජය සතු වෙළඳ ව්‍යාපාර පොදු සමාගම් බවට පත් කිරීම සඳහා ඉඩකඩ සැලසීය.



**නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තිය යටතේ 1977 වසරේ සිට මේ වන විට ශ්‍රී ලංකාව දශක 05කට ආසන්න කාලයක් ගතකොට තිබේ. මේ මුළු කාලය තුළම ක්‍රියාත්මක කරන ලද ආර්ථික ප්‍රතිපත්තිය මගින් රට සංවර්ධනය කරා ගමන් කරනු වෙනුවට සිදුව ඇත්තේ බංකොලොත්භාවයට පත් වීමය.**

එමෙන්ම 1987 වසරේදී ලංකාවේ පෞද්ගලීකරණය පිළිබඳ ජනාධිපති කොමිසම පත් කරන ලදී. මේ වන විට පැවති එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව සහ එහි ආර්ථික ප්‍රතිපත්තිය රටේ පොදු ජනතාවගේ අප්‍රසාදයට ලක්ව පැවතියේය. පෞද්ගලීකරණ ක්‍රියාවලියටද තදබල විරෝධයක් මතුව තිබුණි.

1989 වන විට බලයට පැමිණි රණසිංහ ප්‍රේමදාස පෞද්ගලීකරණ ක්‍රියාවලියම ජනතාකරණය වශයෙන් නාමකරණය කළේය. ඒ අනුව 1987 ඇතිකරන ලද පෞද්ගලීකරණය පිළිබඳ ජනාධිපති කොමිසම 1989 වසරේදී ජනතාකරණ කොමිසම වශයෙන් නම් කරන ලදී. ජනතාකරණ කොමිසම වෙනුවෙන් පෞද්ගලීකරණය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය ආයෝජන හා කළමනාකාරීත්ව මණ්ඩලය ස්ථාපිත කරන ලදී. මීට අමතරව පෞද්ගලීකරණ ක්‍රියාවලිය සඳහා තවත් ව්‍යවසායන් ගණනාවක් මේ කාලය තුළ සකස් කෙරිණි. 1989 රාජ්‍ය ව්‍යවසාය ගැලපීමේ ඒකකයක් කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලදී. ඒ, ලෝක බැංකුවේ ව්‍යුහාත්මක ගැළපුම් ණය වැඩසටහන යටතේය.

ශ්‍රී ලංකාවේ පෞද්ගලීකරණ වැඩපිළිවෙළ වඩාත් කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුතුව කිරීම සඳහා ඊට බලයක් ඇති ආයතනයක් වශයෙන් 1995දී රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය කිරීමේ කොමිසම පිහිටුවනු ලැබිණි. 1996 අංක 01 දරන රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ පනත මගින් ඉහත කොමිසම වෙත පෞද්ගලීකරණය පිළිබඳ තීරණ ගැනීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය ලබා දුන්නේය. රාජ්‍ය ව්‍යවසායන් පුද්ගලීකරණය කිරීමෙන් පසු අසාර්ථක වූ ඒවා පුනරුත්ථාපනය කිරීමේ බලයද ඉහත කොමිසමට ලබා දෙන ලදී. මේ ආකාරයෙන් දිගින් දිගටම පෞද්ගලීකරණ ක්‍රියාවලිය ඉදිරියට ගමන් කළ අතර පෞද්ගලීකරණය කරන ලද ආයතනවල කොටස් අලෙවියද දිගටම සිදු කරන ලදී.

කෙසේ වෙතත් මෙතෙක් විවිධ හේතූන් මත ආරක්ෂා වී තිබූ රටකට අත්‍යවශ්‍ය උපායමාර්ගික වැදගත්කමක් සහිත ආයතනද පෞද්ගලීකරණ ක්‍රියාවලියට තල්ලු කිරීම 2004 වන විට සිදු විය. මේ සඳහා 2004 වසරේදී උපායමාර්ගික ව්‍යවසාය කළමනාකරණ ඒජන්සිය නමින් නව රාජ්‍ය ආයතනයක් පිහිටුවන ලදී. මෙම ඒජන්සියේ අධීක්ෂණය යටතට ගනු ලැබූ ආයතන ලෙස ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා ගුවන්තොටුපළ අධිකාරිය, ශ්‍රී ලංකා දුම්රිය සේවය, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, රාජ්‍ය ඖෂධ නීතිගත



සංස්ථාව යන ආයතන ඇතුළත්ය.

නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තිය යටතේ 1977 වසරේ සිට මේ වන විට ශ්‍රී ලංකාව දශක 05කට ආසන්න කාලයක් ගතකොට තිබේ. මේ මුළු කාලය තුළම ක්‍රියාත්මක කරන ලද ආර්ථික ප්‍රතිපත්තිය මගින් රට සංවර්ධනය කරා ගමන් කරනු වෙනුවට සිදුව ඇත්තේ බංකොලොත්භාවයට පත් වීමය.

එසේ තිබියෙදීත් වත්මන් ආණ්ඩුවද එම මගේම ගමන් කරමින් පෞද්ගලීකරණ ප්‍රතිපත්තියම ඉදිරියට ගෙන යමින් සිටී. ආරම්භයේදී පෞද්ගලීකරණය වශයෙන් හැඳින්වූ ක්‍රියාවලිය පසුව ජනතාකරණය වශයෙන්ද, දැන් එය ප්‍රතිව්‍යුහගතකරණය යනුවෙන්ද හඳුන්වයි. නමුත් සිදු වන්නේ එකම දෙයකි. ශ්‍රී ලංකාව පත්ව ඇති ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට නම් පාඩු ලබන රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගතකරණය කළ යුතු බවට කොන්දේසියක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් පනවා ඇත. වත්මන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාද මෙම ප්‍රතිව්‍යුහගතකරණය සිදු කරන බවට සඳහන් කොට ඇත. කඩිනමින්ම ප්‍රතිව්‍යුහගතකරණය කළ යුතු යැයි මේ වන විට ආයතන 35ක් හඳුනාගෙන ඇත. සත්තකින්ම මෙම ආයතන ප්‍රතිව්‍යුහගතකරණය කළ යුතු බවට නැතිනම් පෞද්ගලීකරණය කළ යුතු බවට වන යෝජනාව පෙර මුදල් අමාත්‍යවරයාව සිටි බැසිල් රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කොට තිබූවකි.

■■■

පහත දැක්වෙන්නේ එසේ ප්‍රතිව්‍යුහගත කළ යුතු යැයි හඳුනාගෙන ඇති ආයතනවල නාමලේඛනයයි.

1. **විදේශ සම්පත් දෙපාර්තමේන්තුව**
2. **ජාතික වැටුප් කොමිසම**
3. **සේවක නියුක්තිකයන්ගේ බාරකාර අරමුදල**
4. **ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය**
5. **ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව**
6. **ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව**
7. **ශ්‍රී ලංකා මධ්‍යම ගමනා ගමන මණ්ඩලය**
8. **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**
9. **සිවිල් ගුවන් සේවා අධිකාරිය**
10. **සීමා සහිත ගුවන්තොටුපොළ සහ ගුවන් සේවා සමාගම**
11. **විදේශගත රාජ්‍ය දූථ මණ්ඩලය**
12. **කම්කරු දෙපාර්තමේන්තුව**
13. **සේවක අර්ථ සාධක අරමුදල**
14. **ජාතික වෘත්තීය සුරක්ෂිති සහ සෞඛ්‍ය ආයතනය**
15. **මාර්ග නාඩත්තු භාර අරමුදල**
16. **ජාතික ජල සම්පාදන හා ජල පවාහන මණ්ඩලය**
17. **ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය**
18. **රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව**
19. **දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය**
20. **රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව**
21. **රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව**
22. **දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**
23. **ශ්‍රී ලංකා රේගුව**
24. **සුරාබදු දෙපාර්තමේන්තුව**
25. **වාණිජ දෙපාර්තමේන්තුව**
26. **පාරිභෝගික කටයුතු අධිකාරිය**
27. **සීමා සහිත ලංකා සතොස**
28. **ලංකා ධීවර සංස්ථාව**
29. **ලංකා තේ මණ්ඩලය**
30. **පොල් වගා කිරීමේ මණ්ඩලය**
31. **ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය**
32. **වී අලෙවි මණ්ඩලය**
33. **සීමාසහිත ශ්‍රී ලංකන් එයාර් ලයින් සහ එහි පාලිත සමාගම් හා ඒ ආශ්‍රිත සමාගම්**
34. **තැපැල් දෙපාර්තමේන්තුව**
35. **ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංස්ථාව**

**ඉහත ආයතන ලැයිස්තුව තුළ අප රටට අත්‍යවශ්‍ය උපායමාර්ගික වශයෙන් අතිශයින්ම වැදගත් ආයතන රාශියක්ම වෙයි.**



## ශ්‍රී ලංකාවේ පෞද්ගලීකරණය

# මිත්‍යාව හා යථාර්ථය

**ප්‍රසන්න පෙරේරා**

වසර 74ක ධනේශ්වර ආර්ථික ක්‍රමයේ අවුල සහ පාලකයින්ගේ වැරදි ආර්ථික කළමනාකරණයේ තර්කානුකූල ප්‍රතිඵලයක් ලෙස සහ ශ්‍රී ලංකාව ආර්ථික අර්බුදයක ගිලී ගොස් අවසන්ය. මේ අර්බුදයෙන් ගොඩයාම වෙනුවෙන් ධනවාදයට 'නව' විසඳුම් නැති අතර ඉදිරිපත් වෙමින් ඇත්තේ නව ලිබරල් ගොඩවෙදුන්ගේ පැරණි වට්ටෝරුවල සඳහන් විසඳුම්ය. එහි ප්‍රධානම නිර්දේශයක් වනුයේ රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය කළ යුතු බවටය. "රාජ්‍ය ස්වභාවයෙන්ම අකාර්යක්ෂමය. ඒවා රාජ්‍ය ආදායම ගිල දමන ඒවාය. එහෙයින්ම රජයට බරකි. එබැවින් ඒවා ප්‍රතිව්‍යූහගත කිරීමේ ලේබලය යටතේ විකුණා දැමිය යුතුය; බදු දිය යුතුය; ඈවර කළ යුතුය. කොටින්ම රජය ඒවායේ භාරකාරිත්වයෙන් ඉවත් විය යුතුය." අර්බුදය තුළ ජනතාවගේ මනසට කාවැද්දීමට උත්සාහ දැරෙන මතවාදය එබඳුය. තමන් අත්විඳින ආර්ථික පීඩනයේ බර, තමන් පරිභෝජනය කරන භාණ්ඩ හා සේවාවල ගුණාත්මකභාවය කඩා වැටීම, මිල ඉහළ යාම, හිඟය ආදී සාධකවල මූලය ඒවා රාජ්‍ය අයිතිය සතු වීම බවට

අර්බුද මොහොතකදී කෙනෙකුට හැඟීයාමට ඇති ඉඩකඩ වැඩිය. රාජ්‍ය ආයතනවල හෝ අනුබද්ධ ආයතනවල පාඩුවේ බරෙන් රාජ්‍යය නිදහස් වූ වහාම ආර්ථිකය අහසට නගින්නට පටන් ගනු ඇත යන්න සහ අඩු මිලට, හිඟයකින් තොරව, ගුණාත්මක භාණ්ඩ සේවා ලබා ගත හැකි වනු ඇත යන්න මවා පෙන්වීමට උත්සාහ දැරෙන චිත්‍රයයි.

රාජ්‍ය ආයතනවල පාඩුවට අදාළව මූලික භූමිකාව ඇත්තේ බලයට පත් දූෂිත ආණ්ඩුවල දේශපාලන භාවිතය යන්න සඟවමින් (ඒවායේ ප්‍රධානීන් පත් කිරීම, ප්‍රතිපත්තිමය තීන්දු ගැනීම, සේවකයින් බඳවාගැනීම් ආදිය ඇතුළු දූෂිත, වංචනික, නාස්තිකාරී හා අවිධිමත් ක්‍රියාවලිය) හා එහි සැබෑ වගඋත්තරකරුවා සඟවමින්  ඒවා රාජ්‍ය අයිතිය තුළ පැවතීමම අවුලක්ය යන්න තහවුරු කිරීමට උත්සාහ දැරෙනු පෙනෙන්නට තිබේ. නව ලිබරල්වාදී දේශපාලනය විසින් දිගේලි කරන මෙම මතවාදය, අර්බුදයේ පතුළට වැටී අසරණව සිටින, නැතහොත් තවමත් වැටෙමින් සිටින ජනතාවකට එල්ලිය හැකි විසඳුමක් ලෙස ඒත්තු ගැන්විය හැකි වනු ඇතැයි නව ලිබරල් ඔස්තාද්ලා උපකල්පනය කරනවා විය හැකිය. කෙසේ වුවද පෞද්ගලීකරණයේ පක්ෂපාතීත්වය වෙනුවෙන් අඩසියවසකට වැඩි කාලයක් පුරා ඉදිරිපත් කරනු ලබන්නේ එකම වර්ගයේ දුබල තර්කයන්ය. වෙනස ඇත්තේ ඒවා ඉදිරිපත් වන අවස්ථාවට අනුව ප්‍රබල ලෙස දෘශ්‍යමාන වීමය.

## හුවා දැක්වූ මවාපෑම

1970 ගණන්වල අග බ්‍රිතාන්‍යයේ තැචර්වාදයත් 80 ගණන්වල මුල එක්සත් ජනපදයේ රේගන්වාදයත් සමග කරළි ගත කරන ලද නව ලිබරල්වාදී මතවාදයේ ප්‍රධාන තේමාවක් වූයේ පෞද්ගලීකරණයි. ඒ හා සමගාමීව ධනේශ්වර සංවර්ධන උපායමාර්ගයක් ලෙස හුවා දැක්වීමට ලක්වුණු එය 80 ගණන්වල මැද භාගයෙන් පසු අන්තර්ජාතික මූල්‍ය ආයතනයන්හි ප්‍රධාන ණය කොන්දේසියක් බවටද පත් විය. 80 ගණන්වල අග සහ 90 දශකයේ මුල සෝවියට් දේශය ප්‍රමුඛ සමාජවාදී කඳවුර බිඳවැට්ටවීමෙන් පසු පෞද්ගලීකරණ ආර්ථික උපාමාර්ගය සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථික මොඩලයක් බවට පත් වෙමින් තවත් වේගවත් පිම්මක් අත්පත් කරගත්තේය. එහිදී ශ්‍රී ලංකාව තුළ පෞද්ගලීකරණය හඳුන්වා දීමේදී  මූලිකව ඉලක්ක පහක් පෙන්වා දෙනු ලැබිණි.

i. කාර්යක්ෂමතාව වර්ධනය කිරීම හා එමගින් වඩා යහපත් පාරිභෝගික සේවාවක් ලබා දීම සඳහා කළමනාකාරිත්වය වැඩි දියුණු කිරීම

ii. විදේශීය දායකත්වය දිරි ගන්වමින් ඵලදායීතාවය හා වර්ධනය ඉහළ නැංවීමට තාක්ෂණය ලබා ගැනීම සහ නවීකරණය කිරීම

iii. පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායන්ට සහන ලබා දීම සහ පවත්වා ගැනීම වෙනුවෙන් රාජ්‍යයට දරන්නට වන බර අඩුකර ගැනීම

iv. ජනගහනයෙන් පුළුල් කොටසකට කොටස් අයිතිය ලබා දීම

v. රාජ්‍ය ඒකාධිකාරයන් බිඳ දැමීම මගින් තරගකාරිත්වයක් ඇති කිරීම සහ පාරිභෝගිකයාට සහන මිලක් ලබා දීම

මෙම අරමුණු ඉලක්ක කර ගනිමින් පෞද්ගලීකරණය, ජනතාකරණය, ප්‍රතිව්‍යුහගතකරණය යන විවිධ නාමකරණයන් යටතේ 1987දී පමණ සිට රාජ්‍ය ආයතන පෞද්ගලික අංශයේ අයිතියට පත්

වානේ සංස්ථාව 1965, 1967



කරනු ලැබීය. ඒ 1987දී එවකට එජාප ආණ්ඩුව පෞද්ගලීකරණය රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස පිළිගැනීමෙන් (1987 අංක 22 සහ 1987 අංක 23 පනත) අනතුරුවය. මේ වැඩපිළිවෙළ ක්‍රමවේද 05ක් ඔස්සේ ක්‍රියාත්මක වීම ඇරඹිණි.

01. කළමනාකාරිත්වය පෞද්ගලික අංශයට බදු දීම

02. අයිතිය රජය යටතේ තබාගෙන කළමනාකාරිත්වය පෞද්ගලික අංශයට ලබාදීම 03. වැඩි කොටස් ප්‍රමාණයක් රාජ්‍ය අයිතියේ තබාගෙන ඉතිරි කොටස් හා කළමනාකාරිත්වය පෞද්ගලික අංශයට පැවරීම

04. සුළු කොටස් ප්‍රමාණයක් රාජ්‍ය අයිතියේ තබාගෙන ඉතිරි කොටස් සහ කළමනාකාරිත්වය පෞද්ගලික අංශයට පැවරීම

05. අයිතිය හා කළමනාකාරිත්වය පූර්ණ ලෙස පෞද්ගලික අංශයට පැවරීම මේ යටතේ සිදු කරයි. කෙසේ වුවද මේ සියල්ලෙහි අවසන් අරමුණ රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලික අංශයට විකුණා දැමීමය.

### යථාර්ථයේ සිදු වූ දේ

● 1989 සිට 2001 කාලය තුළ වතු සමාගම් 20ක් ඇතුළු රාජ්‍ය ආයතන 80ක් පෞද්ගලීකරණය කර තිබූ අතර ඒවායින් පේෂකර්ම කම්හල් ඇතුළු ආයතන ගණනාවක් සහන බදු කාලය අවසන් වීමෙන් පසු ආයෝජකයින් විසින් ඒවා අත්හැර දැමීම නිසා වසා දැමිණි; තවත් ඒවා බංකොලොත් විය. මේ අතරින් අසාර්ථක ආයතන 07ක් නැවතත් රජයට පවරාගෙන තිබිණි. විකිණීමෙන් කෙටි කාලීනව රජයට ආදායමක් ලැබුණද (2001 මහ බැංකු වාර්තාවට අනුව මෙය රු.මි. 49,113.5කි) ඒවායින් දිගු කාලීනව රාජ්‍ය භාණ්ඩාගාරයට ලැබෙමින් තිබුණු ආදායම් නොලැබීම සහ බදු සහන ලබා දීම රාජ්‍ය ආදායමට ඍණාත්මකව බලපෑවේය. මෙහි අවසන් ප්‍රතිඵලය වී ඇත්තේ අයවැය හිඟය ඉහළ නැගීමය.

● එසේම නැවත පවරා ගත් ආයතන පුනරුත්ථාපනය කිරීම වෙනුවෙන් විශාල මුදලක් වැය කිරීමට රජයට සිදුව තිබිණි. පෙහෙකම්හල්, කඩදාසි කම්හල් වැනි ආයතන මිලදී ගත් කූට ව්‍යාපාරිකයෝ ඒවායේ ඉඩම් හා උපකරණ බැංකුවට උකස් කර පලා ගියහ. කන්තලේ හා හිඟුරාණ වැනි සීනි කම්හල් මිලදී ගත්තවුන් ඒවා සංවර්ධනය නොකර වසා දැමූ අතර කන්තලේ අක්කර 23,000ක උක් වගාව සහ අක්කර 3000ක පැල තවානට අදාළ භූමිය පාළු විය. තුනීලෑලි සංස්ථාව වසා දැමිණි. වසා දැමූ ආයතන හේතුවෙන් සේවා වියුක්තිය ඉහළ ගිය අතර ඒ සේවකයින් පත්වූ අසරණභාවය වෙනුවෙන් විශාල වන්දි මුදල් ගෙවීමට රජයට සිදුවිය.

**"විකිණීමෙන් කෙටි කාලීනව රජයට ආදායමක් ලැබුණද (2001 මහ බැංකු වාර්තාවට අනුව මෙය රු.මි. 49,113.5කි) ඒවායින් දිගු කාලීනව රාජ්‍ය භාණ්ඩාගාරයට ලැබෙමින් තිබුණු ආදායම් නොලැබීම සහ බදු සහන ලබා දීම රාජ්‍ය ආදායමට ඍණාත්මකව බලපෑවේය. මෙහි අවසන් ප්‍රතිඵලයවී ඇත්තේ අයවැය හිඟය ඉහළ නැගීමය.**


● 1989 සිට 1995 දක්වා පෞද්ගලීකරණ ක්‍රියාවලියේ දේශපාලන අධිකාරිය සහ නිලධාරිවාදය තුළ අතිවිශාල දූෂණ ප්‍රමාණයක් සිදු විය. විශේෂයෙන් මුදල් රෙගුලාසි සහ ටෙන්ඩර් පටිපාටිය නිසි ලෙස ක්‍රියාත්මක නොකර අතයට ගනුදෙනු විශාල ලෙස සිදුව තිබිණි. රාජ්‍ය දේපොළ නිසි පරිදි තක්සේරු නොකරන ලද්දෙන් වෙළඳපොළ මිලට වඩා අඩු මිලට රාජ්‍ය ව්‍යාපාර විකුණා දැමිණි. තුල්හිරිය පෙහෙකම්හල ඇ.ඩො.මි. 100කට තක්සේරු කරනු ලැබ තිබුණද එය විකුණනු ලැබුවේ ඩො.මි. 70කටය. ඛනිජ තෙල් සංස්ථාවේ නයිලෝන් 6 ව්‍යාපෘතිය එක් ව්‍යාපාරිකයෙකුට විකුණා දැමුණේ එහි වෙළඳපොළ වටිනාකමෙන් 30%කටත් වඩා අඩු මුදලකටය. රජයට පවරාගත් සිලෝන් ඔක්සිජන් සමාගමේ වත්කම ඇ.ඩො.මි. 68කට තක්සේරු කර තිබුණද අවසානයේ එය විකුණා දැමුණේ ඇ.ඩො.මි. 07කටය. 1993දී හිඟුරාන සීනි කම්හල විකිණීමේදී එම භූමියේ අක්කර 7000ක උක් වගාවක් තිබිණි. ගබඩාවේ සීනි තොග විය. රු.මි. 70ක ස්ථාවර තැන්පතුවක්ද කම්හල සතු විය. එහෙත් සීනි සමාගම විකුණා දමා

තිබුණේ ගබඩාවේ තිබූ සීනිවල වටිනාකමටත් වඩා අඩු මුදලකටය. මෙම තත්වය මෙම ක්‍රියාවලිය තුළ සිටි පිරිස අතරමැදි අයුතු ලාභ ලැබූ අතර රජයට ලැබිය යුතු මුදල අහිමි විය.

● රාජ්‍ය ව්‍යවසායන් කිහිපයක් පෞද්ගලීකරණයේදී එහි කොටස් අයිතිය ජනතාව අතට පත්කිරීම මහත් සේ ඔසවා තබන ලද ප්‍රචාරක කටයුත්තක් විය. 1996දී චන්ද්‍රිකා කුමාරතුංග ආණ්ඩුව යටතේ පිහිටවූ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ පර්ක් (PERC) ආදර්ශ පාඨයක් වී තිබුණේම 'එහි කොටසක් ඇත ඔබටත්' යන්නය. මේ යටතේ රාජ්‍ය ආයතන විකිණීමේදී 10%ක කොටස් සේවකයන් අතර බෙදා දීම නිසා ඔවුන් කොටස් හිමියන් (අයිතිකරුවන්) බවට පත්වනු ඇති බවටත් තමන්ගේ හැඟීමෙන් වැඩ කරනු ඇති බවටත් අර්ථකථනය කරනු ලැබිණි. කෙසේ වුවද බොහෝ සේවකයෝ තමන්ට හිමි වූ කොටස් පසුව විකුණා දැමූවෙන් අපේක්ෂිත අරමුණු ඉටු වූයේ නැත. ප්‍රාග්ධන වෙළඳපොළ නොදියුණු තත්වයක ඇති තත්වයක සහ කොටස් වෙළඳපොළ සීමිත පිරිසක් විසින් හසුරුවන තත්වයක් තුළ විකුණනු ලබන ආයතනයන්ට දේශීය ප්‍රග්ධනය ගලා ආවේ අඩු වශයෙනි. මේ තත්වය තුළ අපේක්ෂිත වෙළඳපොළ තරගකාරී තත්වයක් වර්ධනය කරගැනීමට අවස්ථාව ලැබී නැත.

● පෞද්ගලීකරණයට අදාළව 1996දී මනෝ තිත්තවැල්ල ප්‍රධානත්වයෙන් පිහිට වන ලද පර්ක් ආයතනය රටට උපරිම ලාභ ලැබෙන දැක්මකින් යුතුව ප්‍රතිව්‍යුහගතකිරීම්, පෞද්ගලීකරණය ක්‍රමවේද සලකා බලනු ඇති බව සිය ප්‍රතිපත්ති රාමුව තුළ ප්‍රකාශයට පත් කර තිබිණි. එසේ වුවද එය මගින් දියත් කරන ලද පෞද්ගලීකරණ ක්‍රියාවලියද දූෂිත බවට බොහෝ චෝදනා එල්ල විය. පාකිස්ථානයේ තවක්කාල් සමාගමට පුත්තලම සිමෙන්ති සමාගම විකුණා දැමීමේදී එල්ල වූ දූෂණ චෝදනා වාණිජ මහාධිකරණය හමුවට පවා ගිය අතර 1997දී තවක්කාල් සමාගම අයුතු ලාභ ලැබූ බවට වරදකරු වූයෙන් රුපියල් මිලියන 900ක් සහ පොලිය රු.මි. 455.2ක් ලෙස රු.මි. 1355.2ක් අමතර මුදලක් පුත්තලම සිමෙන්ති සමාගමට ගෙවීමට නියම විය. ඔරියන්ට් ලංකා ලිමිටඩ් ආයතනය පෞද්ගලීකරණය කිරීමේදීද අගලවත්ත, හොරණ, කෑගල්ල, කොටගල, බොග වත්තලාව සහ කැලණිවැලි වැනි විශාල ලාභ ලබමින් තිබූ වතු කළමනාකරණය පෞද්ගලීකරණය කිරීමේදීද අතිමහත් පාඩු රටට සිදු වූ බවට චෝදනා එල්ල විය. ඒවායේ කළමනාකරණය පමණක් පෞද්ගලීකරණය කරන බව ප්‍රකාශ වුවද අවසානයේ උකස් තැබීමේ අයිතියද සහිතව අතිවිශාල වතු ඉඩම් දිගු කාලීන කල්බදු මත ලබා දුන්නේ සින්නක්කර ගැනුම්කරුවන්ට ලබා දෙන අයුරිනි. මේ යටතේ පෞද්ගලීකරණය කෙරුණු කොළඹ ගෑස් සමාගම, වානේ සංස්ථාව, ශ්‍රී ලංකා ටෙලිකොම්, එයාර්ලංකා සමාගම්වලට අදාළ විකිණීමේ ගිවිසුම්ද රජයට අවාසි සහගත ඒවා බවට බරපතළ චෝදනා එල්ල විය.

● ලංකාවේ පෞද්ගලීකරණය කරන ලද ඇතැම් වතු සමාගම් ඇතුළු ආයතන විශාල ප්‍රමාණයක අපේක්ෂිත අන්දමින් කළමනාකරණය කාර්යක්ෂම නොවූ අතර නවීන ශිල්ප ක්‍රම වෙනුවෙන් ආයෝජනයන්ද සිදු නොවිණි. මේ තත්වය තුළ නිෂ්පාදනය ඉහළ නොගිය අතර වතු වැනි ක්ෂේත්‍රයක සිදු වූයේ කළමනාකරණ ව්‍යුහයන් ද්විත්වයක් වෙනුවෙන් වියදම් ඉහළයාම පමණි. කම්කරුවන්ට ප්‍රමාණවත් වැටුප් හා දීමනා



SLIC Sri Lanka Insurance




ගෙවීමට පෞද්ගලික සමාගම් අසමත් වූයෙන් රැකියා අවදානම හේතුවෙන් ඒවා පෙරළා රජයට බරක් වෙමින් තිබේ. විශේෂයෙන් වතු කම්කරුවන්ට අවම දිනකට රු.1000/-ක වැටුපක් ගෙවීමට වතු සමාගම් අසමත්ය. එම තත්වය තුළ කම්කරුවන් සේවයට කැඳවා ගැනීමට නොහැකි වීම තුළ පුහුණු ශ්‍රම හිඟයක් වර්ධනය වෙමින් ඇත. එසේම ඔවුන්ට අදාළව බැර කළ යුතු අර්ථසාධක අරමුදල් නොගෙවීම පිළිබඳ ගැටලුද නිසි කලට පාරිතෝෂික නොගෙවීමද වතු ක්ෂේත්‍රය නොසන්සුන් කරවා තිබේ.





● රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණයේදී බොහෝ විට ඒවායේ අයිතිය පැවරුණේ තනි අයිතිකරුවෙකුටය. ලාභය උපරිම කරගැනීම වෙනුවෙන් එසේ කරන බව ප්‍රකාශ විය. කෙසේ වුවද මෙම තත්වය තුළ ඒවා රාජ්‍ය ඒකාධිකාරයක සිට පෞද්ගලික ඒකාධිකාරයක් යටතට පත්වූවා පමණි. නිදසුනක් ලෙස 1996දී රජයට අයත් කොළඹ ගෑස් හා ජල සමාගම ඩො.මි. 37කට රෝයල් ඩච් ෂෙල් සමාගම විසින් මිලදී ගන්නා ලදී. එමගින් ගෑස් ක්ෂේත්‍රයේ ඒකාධිකාරය ෂෙල් සමාගම සතු විය. මෙම තත්වය ලාංකේය සමාජය මත ඇති කරන ලද පීඩනය බලවත් විය. 2001දී ලාෆ්ස් ගෑස් සමාගමට ගෑස් බෙදා හැරීමේ ඉඩ ලබා දීමෙන් පවා එම ඒකාධිකාරිත්වයේ බලපෑම සමහන් කරගැනීමට හැකි වූයේ නැත. අවසානයේ ආණ්ඩුවට සිදු වූයේ 2010දී ෂෙල් සමාගමට ඩො.මි. 63ක් ගෙවා අයිතිය ආපසු රජයට පවරා ගැනීමටය.

● පෞද්ගලීකරණය කරන ලද ලාභ ලැබූ ආයතන බොහොමයක් මිලදී ගනු ලැබුවේ විදේශීය බහුජාතික සමාගම් විසිනි. කෘෂි ගොවිපළවල් සහ බීජ නිෂ්පාදනාගාර සමාගම් අයිතියට පත්වීම මත බහුජාතික සමාගම්වල බලපෑමට ලක්වීමට සිදු වී ඇති අතර මෙම විදේශීය සමාගම් තම ලාභ තම රටවලට ගෙනයාම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂයට බලපෑම් එල්ල කර තිබේ. සෝවියට් සංගමයේ අනුග්‍රහයක් ලෙස 1960 දශකයේ මුල ලංකාවට ලැබුණු ලංකා ටයර් සංස්ථාව ප්‍රේමදාස යුගයේදී 1992දී ඉන්දියානු සියට් සමාගමටත්, ලංකා වානේ සංස්ථාව චන්ද්‍රිකා යුගයේදී 1996දී කොරියානු හන්ජුන් ස්ටීල් සමාගමටත් විකුණා දැමිණි. ප්‍රේමදාස යුගයේදී 1991දී තෙල් හා මේද සංයුක්ත මණ්ඩලය සිංගප්පූරුවේ ප්‍රීමා සමාගමටත් විකුණා දැමුණේ නොවටිනා මුදලකටය. සේවකයින්ට වන්දි හා පාරිතෝෂික ගෙවීමත් සේවක භාරකාර සහ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමත් සිදු වූයේ රජයෙනි. මෙම පෞද්ගලීකරණ ගනුදෙනුවේදී මුදල් අමාත්‍යාංශයේ ඉහළම නිලධාරියෙකුට විශාල මුදලක් ලැබුණු බව කියවිණි.

● මේ අනුව මෙතෙක් ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකාවේ පෞද්ගලීකරණ ක්‍රියාවලිය තුළ කිසිදා ආරම්භයේදී හුවා දක්වන ලද අපේක්ෂිත අරමුණු කරා ළඟා වූයේ නැති අතරම පාරිභෝගිකයාට සිදුවූයේ භාණ්ඩ හා සේවා වෙනුවෙන් දරා ගත නොහැකි මිලක් හා ගාස්තුවක් ගෙවීමටත් තමන් ගෙවන මිලට ගුණාත්මක සේවාවක්






නොලැබීම ඇතුළු සෘණාත්මක ප්‍රතිඵලයන්ය. අනෙක් අතට තමන් සතු ව්‍යවසායන් පෞද්ගලීකරණයේ ප්‍රතිඵලය ලෙස ලැබූ කෙටි කාලීන ආදායම් වෙනුවට රජයට දිගු කාලීනව සමාජීය පිරිවැයක් දැරීමට සිදුව තිබේ.

## නැවතත් එන විකිණීම

ආර්ථික පීඩාව තුළ ජනතාවගේ මනෝභාවය පාවිච්චි කරමින් නැවතත් පෞද්ගලීකරණ ප්‍රතිකාර වට්ටෝරුව ඉදිරිපත් කෙරෙද්දී එය සිදුවන්නේද පෙර සිට අදටද නොවෙනස් ජරාජීර්ණ ලාංකේය දේශපාලන සංස්කෘතියක් තුළමය. එබැවින් එකම දෙය එකම ආකාරයට සිදු කර වෙනස් ප්‍රතිඵල අපේක්ෂා කළ නොහැක. පළමු සාධකය පෞද්ගලීකරණ යෝජනාව කෙරෙන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් යෝජනා කරන ආර්ථික උපායමාර්ගයට තමන් අනුගතව සිටින බව පෙන්වීමට රනිල්ගේ ආණ්ඩුවට අවශ්‍ය වීමය. දෙවැන්න රට මුහුණ දී සිටින ඩොලර් සංචිත හිඟය හමුවේ ආනයන හා ණය ගෙවීම වෙනුවෙන් කෙටි කාලීන ආදායම් සොයාගැනීමේ අවශ්‍යතාවයය. මෙම නව පෞද්ගලීකරණ ක්‍රියාදාමය මගින් ඩො.බිලියන 04ක් සෙවීමට අපේක්ෂා කරන බව ප්‍රකාශ වී තිබේ. තෙවැනි කරුණ දූෂිත පාලකයින්ට මේ විකිණීම් අතයට කොමිස් මුදල් සෙවීමේ හැකියාවක් ඇති තවත් ව්‍යාපාරික ගනුදෙනුවක් පමණක් වීම සහ ඒ පිළිබඳව ඔවුන්ගේ ඇති ලැදියාවය. රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණයට යෝජනා කළද පෞද්ගලික ආයෝජකයා තමන්ගේ ලාභ තීරුවට උඩින් සමාජීය වගකීම තැබීමේ සම්ප්‍රදායකට අදාළ නිදසුන් ලාංකේය යථාර්ථය තුළ නොමැති නිසාම ඉදිරියේදීද එසේ තබනු ඇතැයි උපකල්පනය කළ නොහැකියි. රාජ්‍ය නියාමන ආයතන පාවිච්චි කරමින් යම් පාලනයන් යෝජනා කළ හැකි නමුදු බලශක්ති, විදුලි සංදේශ වැනි ආර්ථික මර්මස්ථායන්ට අදාළව ගොඩනැගෙන පෞද්ගලික ඒකාධිකාරයන් සහ එවැනි තත්වයක් ගොඩනගා ගන්නා සමාගම් කාටලයන් සමග මිල, ගාස්තු හා අනෙකුත් සේවා කොන්දේසි සම්බන්ධයෙන් දුබල ආණ්ඩුවලට කළ හැකි නියාමනය කුමක්ද යන්න අපැහැදිලිය. අකාර්යක්ෂමභාවය ආයතනය රාජ්‍යය සතුද නැතහොත් පෞද්ගලිකද යන්න මත පමණක් තීරණය නොවන්නකි. එය මෙම ආයතන පාලනය කිරීමට ආණ්ඩු විසින් තෝරා ගන්නා ලද පරිපාලකයින්ගේ දූෂිත බව, දුබල කළමනාකරණය, නොහැකියාව, අත්දැකීම් නොමැති බව සහ සාම්ප්‍රදායික ආයතනික ව්‍යුහයන් වැනි තවත් හේතු ගණනාවක් බලපායි. ඒ අනුව දේශපාලන බලපෑමෙන් තොර දූෂිත නොවන, දක්ෂ පරිපාලකයන් මෙම ආයතනවලට යෙදවීමට රජය සමත් විය යුතුය. ඔවුන් ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධයක් ඇති සහ නිර්මාණශීලී අය වනුයේනම් සහ දේශපාලන පත්වීම් ලෙස නොව අනුමත කාර්යමණ්ඩලය නොඉක්මවා සුදුසු දක්ෂයින් පමණක් බඳවා ගනු ලබන්නේනම් ආයතනයේ සමස්ත සේවක ප්‍රජාව සේවය කරන්නේ ඊට අනුරූපවය. අකාර්යක්ෂම යැයි රාජ්‍ය යන්ත්‍රණයේ අධිකරණ, පොලිසි, නියෝජිත ආයතන විකුණා දැමීමට කිසිවෙක් ඉදිරිපත් නොවෙයි. සැබැවින්ම විකුණා දැමෙන්නේ ලාභ ලැබීමේ විභවතාවක් සහිත ව්‍යවසායන්ය; මහජනතාවට භාණ්ඩ හා සේවා සපයන ආයතනයන්ය. අනෙක් අතට විකිණීමට ලන්සු තැබෙන්නේ රජයට බරක් වන පාඩු ලබන ආයතන පමණක්ම නොවේ. මේ වන විට ලාභ ලබන ටෙලිකොම්

ආයතනයේ ආණ්ඩුව සතුව 51%ක කොටස් අයිතිය විකිණීමට යෝජනා වී තිබේ. ඊට අමතරව 2003 සිට 2021 දක්වා රජයට බදු ගෙවූ, භාණ්ඩාගාරයට ලාභාංශ ගෙවූ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විකිණීමට යෝජනා වී ඇත. එසේම ශ්‍රී ලන්කන් ගුවන් සේවයට අයත් බිම් මෙහෙයුම් සේවාව සහ ආහාරපාන සැපයීම් සේවාව කොවිඩ් පැවති 2020-2021 වසරවල් හැරෙන්නට ලාභ ලබා තිබේ. පාඩු ලබන්නේ දේශීය හා විදේශීය ණය ගෙවීමට ඇති ගුවන්යානා මෙහෙයුම් අංශයයි. කෙසේ නමුත් ඩොලර් ණය ලෙස මි. 721කත් දේශීය ලෙස රුපියල් බි. 401කත් ණය බරක ගිලී ඇති ගුවන් මෙහෙයුම් සේවය කිසිවෙක් මිලදී නොගන්නා නිසා ආණ්ඩුවට සිදු වනු ඇත්තේ එහි ණය බර භාණ්ඩාගාරයට පවරා ගන්නටය. එබැවින් එවැනි විකිණීමකින් ආණ්ඩුවකට දිගුකාලීන වාසියක් අත් නොවනු ඇත.

## සියල්ලම ආණ්ඩුවද?

කෙසේ වුවද මෙහිදී රටට හිතකර සංවර්ධන උපායමාර්ගයක් තුළ පෞද්ගලික අංශයේ මැදිහත්වීම නොසලකා නොහැරෙන අතර මහජනතාව සම්බන්ධයෙන් වගවීමේදී රාජ්‍යයට පෞද්ගලික අංශය සමග පංච විධ ආකාරයකින් ගනුදෙනු කළ හැකිය. එමගින් නව ලිබරල්වාදය අනුදකින මුළුමනින්ම රාජ්‍යය තමන්ගේ ආර්ථික භූමිකාව හකුළා දැමීම මගින් විය හැකි අනතුර පාලනය කර ගත හැකිය.

i.. තෝරා ගන්නා ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ජනතාව වෙත ඇතිවන පීඩනය අවම කිරීම වෙනුවෙන් වෙළඳපොළ නියාමනය

ii. කුඩා පරිමාණ නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිති දිරි ගැන්වීම හා ශක්තිමත් කිරීම මගින් වෙළඳපොළ හැසිරවීම


iii. සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයන්ට ප්‍රාග්ධනය හා තාක්ෂණය ලබා දී සංවිධානය කිරීම මගින් ඒකාධිකාරයන්ට අභියෝග කිරීම

iv. තෝරා ගත් ක්ෂේත්‍ර තුළ නිදහස් වෙළඳපොළ තරගයට ඉඩ ලබාදීම

v. ජාතික ආර්ථික උපායමාර්ගයට අනුකූලව ආර්ථික මර්මස්ථාන තුළ රාජ්‍ය අයිතිය සතුව තබා ගැනීම

කෙසේ වුවද මේ එක් එක් ක්ෂේත්‍රයන්ට අවශ්‍ය රාජ්‍ය මැදිහත්වීම විද්‍යානුකූල ලෙස හඳුනාගනිමින් සහ උපරිම මහජන සේවාව ලැබෙන පරිදි රාජ්‍ය ව්‍යවසාය තුළ අවශ්‍ය අභ්‍යන්තර ප්‍රතිව්‍යුහගත කිරීම් සිදු කර ගනිමින් රජයේ ආර්ථික භූමිකාව ආරක්ෂා කර ගැනීමට ආණ්ඩුව සමත් විය යුතුව ඇත. ආර්ථික, මූල්‍ය හා දේශපාලන තීරණ ගැනීමේ බලය බහුජාතික සමාගම් අතට පත්වීමේ හා ඒ නිසාම ස්වෛරීත්වය අහිමි කරගත් රාජ්‍යයක් වීමේ අවදානමින් මිදිය හැක්කේ මේ බහු විධ අරමුණු සාක්ෂාත් කරගන්නා ආර්ථික උපායමාර්ගයකට රට ප්‍රවේශ වන්නේනම්ය.





# ඒකාධිකාරී ප්‍රාග්ධනයේ නූතන දේශපාලන උගුල ප්‍රතිව්‍යුහගතකරණය

***ඩී.එච්. වික්‍රමරත්න***

ශ්‍රී ලංකාව දැවැන්ත ආර්ථික හා දේශපාලන අර්බුදයක පවතින බව අවිවාදිත සත්‍යයකි. එය ආර්ථික විශේෂඥයින්ද දේශපාලඥයින්ද සාමාන්‍ය ජනතාවද පිළිගන්නා කරුණකි. එහෙත් එම අර්බුදයේ මූලයන් පිළිබඳවද උත්තේජනයන් පිළිබඳවද විසඳුම කුමක්ද යන්න පිළිබඳවද දැවැන්ත කතිකාවක් පවතී. විවිධ නන්දෙඩවිලි වැරැදි න්‍යායික විග්‍රහයන් මගින් මෙම තත්වය තවත් අවුල් ජාලාවක් කරන්නට පාලක පංතියද විවිධ වෙස්ගත් අවස්ථාවාදීන්ද වෙර දරමින් සිටිති. පවතින රනිල් රාජපක්ෂ පාලනය කෑදැත්තන් පිපාසය සංසිඳවන්නට වැසි වැටෙනතුරු අහස බලා සිටින්නාසේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල දෙසම බලා සිටී. වැස්ස වැටෙන්නද නොවැටෙන්නටද පුළුවන. වැසි වැටුණද එය ප්‍රමාණවත් විසඳුමක් නොවනු ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක සභාව 2022 පෙබරවාරි 25 දින පිටු 95කින් යුත් උපදේශාත්මක වාර්තාවක් නිකුත් කරන ලදී. ශ්‍රී ලංකාව වෙනුවෙන් වසර හතරක් සඳහා ඩොලර් බිලියන 2.9ක විස්තීර්ණ ණයක් වෙනුවෙන් මූල්‍ය අරමුදල කාර්ය මණ්ඩලය හා ශ්‍රීලංකාව අත්සන් කළ ගිවිසුමෙන් පසුව 2022 සැප්තැම්බර් 01 මාධ්‍ය නිවේදනය පෙර වාර්තාවේ කරුණුම අවධාරණය කෙරිණ. 2022 අගෝස්තු 30 රනිල් මුදල් ඇමති වශයෙන් මාස හතරක් සඳහා ඉදිරිපත් කළ විසර්ජන පනත සඳහා




**දේපළ හිමි සුළුතර පංතිය දේපළ අහිමි බහුතර පීඩිත පංතිය පාලනය කරන්නේ තමන් සතු ප්‍රාග්ධනයේ බලයෙනි. ප්‍රාග්ධනය යනු නිෂ්පාදන මාධ්‍ය හිමිකමයි. එයට මානව ශ්‍රමය මිලදී ගැනීමේ මූල්‍ය හැකියාව පවා අයත්ය. වැඩකරන පීඩිත ජනතාව සතුව පවතින්නේ හුදු වැඩකිරීමේ හැකියාව හෙවත් ශ්‍රමය පමණය.**

සංශෝධනය ඉදිරිපත් කරමින් පැවසුවේද නව ලිබරල් ප්‍රතිපත්ති මත ශ්‍රී ලංකාව ඇදගෙන යනු ලබන මූල්‍ය අරමුදලේ පෙර සඳහන් වාර්තාවලින් කියවෙන අදහස්මය. එහිදී රනිල් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රකාශකයකු වැනිය. ජා.මූ.අ. කොන්දේසි අතර බරපතළම කොන්දේසිය වන්නේ ජලසම්පාදන මණ්ඩලය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ඇතුළුව රටේ වැදගත් ආයතන 35ක් ප්‍රතිව්‍යුහගත කිරීමයි. මෙය පවතින අර්බුදය උදෙසා සැබෑ විසඳුමක්ද යන්න වටහාගත හැක්කේ ප්‍රතිව්‍යුහගත කිරීමේ අවංක වුවමනාව කුමක්ද එහි අවසාන අරමුණ කුමක්ද යන්න හා එහි පංති ස්වභාවය කුමක්ද යන්න න්‍යායිකවත් ප්‍රායෝගිකවත් වටහාගැනීමෙන් පමණි. මෙම ලිපියේ දරන උත්සාහය ඒ වෙනුවෙනි.

## ධනේශ්වර ප්‍රාග්ධනය පසු කළ මඟ

මිහිතලය සිසාරා පැතිරී මානව සමාජය එහි තම පැවැත්ම රැකගැනීමේ හිමිකම සම්බන්ධයෙන් දැවැන්ත විෂම බෙදීමකට ලක්ව පවතී. ඒ දේපළ හිමි සහ අහිමි වශයෙන්ය. දේපළ හිමි සුළුතර පංතිය දේපළ අහිමි බහුතර පීඩිත පංතිය පාලනය කරන්නේ තමන් සතු ප්‍රාග්ධනයේ බලයෙනි. ප්‍රාග්ධනය යනු නිෂ්පාදන මාධ්‍ය හිමිකමයි. එයට මානව ශ්‍රමය මිලදී ගැනීමේ මූල්‍ය හැකියාව පවා අයත්ය. වැඩකරන පීඩිත ජනතාව සතුව පවතින්නේ හුදු වැඩකිරීමේ හැකියාව හෙවත් ශ්‍රමය පමණය. මෙම මානව ශ්‍රමය නිෂ්පාදන මාධ්‍ය හා සම්බන්ධ නොවනතාක් නිෂ්ඵලමය හැකියාවකි. ශ්‍රමය නම් විශ්මිත මානව බලය ඵල දරන්නේ අමුද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර හා එය සම්බන්ධ වීමෙනි. අමුද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර, ගොඩනැගිලි, ගබඩා, බලශක්තිය යන සියල්ල ප්‍රාග්ධනය නම් මහා බලයෙහි අඩංගු දේය. සෑම සමාජ ආර්ථිකයකට මෙන්ම ධනපති සමාජයටද එයට අනන්‍ය දේපළ ආකාරයක් පවතී. ප්‍රාග්ධනය යනු ධනපති සමාජයට ආවේණික වර්ධිත, සංවිධිත උසස්තම පෞද්ගලික දේපළ ආකාරයයි. එය පුද්ගලික දේපළ යන්නෙහි වර්ධිතම අවස්ථාවයි. මෙම පරිච්ඡේදයෙන් අප බලාපොරොත්තු වන්නේ ප්‍රාග්ධනය මෙතෙක් පැමිණි ගමන් මඟෙහි ස්වභාවය වටහා ගැනීමයි.

ධනවාදය බිහිවන්නේ වෙළඳාම පදනම්වය. එය වැඩවසම් ප්‍රාදේශීය වෙළඳාමේ සිට ධනවාදී ජාතික රාජ්‍යද ඉක්මවා ලෝක වෙළඳාමක් දක්වා වර්ධනය විය. මානව ශ්‍රමයට යාන්ත්‍රික ජවයද එක්කරමින් ධනවාදී ව්‍යවසාය බිහිවිය. එම ව්‍යවසාය හසුරුවන බලය ප්‍රාග්ධනයයි. ප්‍රාග්ධනය යනු දෙයකට වඩා නිෂ්පාදන සම්බන්ධතාවයකි. ධනවාදය ආරම්භය සමන්විත වන්නේ තනි තනි ධනපතියන්ගේ ප්‍රාග්ධනයන් අතර තරගයෙනි. එය නිදහස් තරගය වශයෙන් හැඳින්විණ. එයට මඟපෙන්වූ මතවාදී දැක්ම වන්නේ ලිබරල්වාදයයි. ලිබරල්වාදය පෞද්ගලික නිදහස යන්න පදනම්ව බිහිවූ මතවාදයකි. ඒ අනුව යමකු සතුව ප්‍රාග්ධන බලය තිබේ නම් ඔහුට ලාභ උදෙසා කැමැති ක්ෂේත්‍රයක ආයෝජනය කළ හැකිය. ධනවාදය ආරම්භයේදීම එහි දැවැන්ත ආර්ථික බලයට පෞද්ගලික දේපළ ක්‍රමය බාධාවක් බව පෙන්වමින් අධිනිෂ්පාදන

අර්බුදයක් ජනිත කළේය. එනම් වෙළඳපොළ පිළිබඳ අන්ධ දැක්මෙන් භාණ්ඩ නිපදවීම හා ලාභ අරමුණ නිසා අවශ්‍යතාවය තිබුණද භාණ්ඩ ගැනීමට පාරිභෝගිකයාට නොහැකිවීම විසින් කිසිවක් විකුණාගත නොහැකි තරමට භාණ්ඩ ගොඩගැසීමය.

මෙය විසඳා ගනු ලබන්නේ ධනපති පංතිය සිය ලාභ අනුපාතය පහළ යෑමේ බියෙන් අන්ධව එනිසාම දැවැන්ත ආර්ථික කඩාවැටීමක් අරමුණු කොට අතිවිශාල මානව ශ්‍රම නිෂ්පාදන සමූහයක් දියබත් කරමින්, ගිනිබත් කරමින් මිහිදන් කර දැමීමෙන්ය. පුද්ගලික දේපළ සම්බන්ධතාවයක් සෑම විටම සිතන්නේ ලාභ පංගුව කේන්ද්‍ර කොට ගෙනය. ධනවාදයට එම අර්බුදය නැවත නැවතත් පැමිණෙන සාපයක් විය. නැවත නැවතත් පැන නැගි මෙම චක්‍රීය අර්බුදය ධනවාදයට වෙනත් ආර්ථික උපායක් හා ආකෘතියක් තෝරාගන්නට බල කළේය. එවන් වෙනසකට සමාජ ආර්ථිකයේ නව විෂයමූල තත්වයක් බිහිකළේය.

ඒ හේතුවෙන් 1860 - 1870 අවධියෙන් පසු ධනවාදී නිදහස් තරගය ඒකාධිකාරී මාවතට පිවිසෙන්නට විය. ප්‍රාග්ධන හිමියාගේ පෞද්ගලික නිදහස වඩාත් අවධාරණය නොකෙරෙන, සමාගම් කිහිපයක ඒකාබද්ධ ඒකාධිකාරීත්වයක් සමඟ ධනවාදය නව අවධියකට එළැඹුණේය. ඒකාධිකාරයට තත්වයන් සකස් කළේ නිදහස් තරගයේ වර්ධනය හා අර්බුදය විසිනි. 1873 ආර්ථික අර්බුදයෙන් පසු ඒකාධිකාරී දීර්ඝ මාර්ගයක් ඔස්සේ වර්ධනය විය. 1900 - 1903 අර්බුද කාලය විසින් මුල් ඒකාධිකාරී ආකාරයක් වූ කාටල ආර්ථික ජීවිතයේ පදනමක් සැකසීය.


**"තරගය ඒකාධිකාරය බවට පරිවර්තනය වේ. එහි ප්‍රතිඵලය නිෂ්පාදනය සමාජමය කිරීමේ දැවැන්ත ප්‍රගතියකි. විශේෂයෙන්ම තාක්ෂණික සොයාගැනීම් හා වැඩිදියුණු කිරීම් පිළිබඳ ක්‍රියාදාමය සමාජමය වන්නේය."**

**(ලෙනින් - අධිරාජ්‍යවාදය, ධනපති ක්‍රමයේ ඉහළම අවධිය, තෝරාගත් කෘති, 04 වෙළුම, 49 පිටුව)**

**"ධනපතියන් හා ඔවුන්ගේ පුවත්පත් විසින් යොදාගනු ලබන, සුළු දේපළ හිමියාගේ ශ්‍රමය පදනම් කරගත් පෞද්ගලික දේපළ නිදහස් තරගය, ප්‍රජාතන්ත්‍රවාදය යන උගුල් වදන් සියල්ලම, දුර අතීතයට එකතු වූ දේය."**

**(ලෙනින් - අධිරාජ්‍යවාදය, ධනපති ක්‍රමයේ ඉහළම අවධිය, තෝරාගත් කෘති 04 වෙළුම, 32 පිටුව)**

ධනවාදය ආරම්භ වන්නේ වෙළඳ භාණ්ඩ නැව්ගත කිරීමෙනි. ඉන් ධනවාදය සමස්ත මිහිතලය තම ගොදුරුබිම කොට ගනී. ඔවුහු අමුද්‍රව්‍ය, ලාභ ශ්‍රමය, වෙළඳපොළ උදෙසා රටවල් යටත්කොට කොල්ලකෑවෝය. ඒ යටත්විජිත යුගයයි. විමුක්ති ව්‍යාපාර සමඟ පසුබෑ ධනවාදය යටත්විජිත නව යටත්විජිත බවට පත් කරගත්තෝය. නව යටත්විජිත යනු අමුද්‍රව්‍ය, ලාභ ශ්‍රමය, වෙළඳපොළ උදෙසා නව ආර්ථික උපායන් මඟින් පරාධීන රටවලට ඒකාධිකාරී රටවල් විසින් කරනු ලබන බලපෑමයි. නව යටත්විජිතවාදයේ බලගතු උපකරණය ඊනියා ආධාර හෙවත්



**ධනවාදය ආරම්භ වන්නේ වෙළඳ භාණ්ඩ නැව්ගත කිරීමෙනි. ඉන් ධනවාදය සමස්ත මිහිතලය තම ගොදුරුබිම කොට ගනී. ඔවුහු අමුද්‍රව්‍ය, ලාභ ශ්‍රමය, වෙළඳපොළ උදෙසා රටවල් යටත්කොට කොල්ලකෑවෝය. ඒ යටත්විජිත යුගයයි. විමුක්ති ව්‍යාපාර සමඟ පසුබෑ ධනවාදය යටත්විජිත නවයටත්විජිත බවට පත් කරගත්තෝය.**

ණයයි. ණය, ආධාර, ආයෝජනයන් යනු ධනේශ්වර ව්‍යවසායන් උදෙසා නිෂ්පාදන මාධ්‍යයන්ගේ වර්ධනය හා ව්‍යාප්තිය අරමුණු කොට පවත්වා ගනු ලබන ස්වරූපයෙන් වෙනස් නමුත් හරයෙන් සහ අරමුණෙන් සමාන වන ධනේශ්වර පෞද්ගලික දේපළ ක්‍රමයේ ආර්ථික සබඳතාවයන්ය. එබැවින් ධනේශ්වර සංවර්ධනය යනු ධනේශ්වර ප්‍රාග්ධනය වෙනුවෙන් නිෂ්පාදන මාධ්‍යයන්ගේ සංවර්ධනයයි.

**"දුම්රිය මාර්ග ගොඩනැඟීම සරල ස්වාභාවික, ප්‍රජාතන්ත්‍රවාදී, සංස්කෘතික හා නිෂ්පාදන මාධ්‍යයන්ගේ සංවර්ධනයයි. ශීලාචාරකාරී ව්‍යවසායන් සේ පෙනෙන්නේය. ධනපති වහල්භාවය දීප්තිමත් වර්ණයෙන් අලංකාර කර ඉදිරිපත් කිරීම සඳහා කුලී ලබන ධනපති මහාචාර්යවරුන්ගේ අදහසේ හැටියට සහ සුළු ධනපති අමනයින්ගේ හැටියට, එය එසේය. නමුත් සත්‍ය කරුණ නම්, නිෂ්පාදන මාර්ගයන් පෞද්ගලිකව අයිති කර ගැනීමේ ක්‍රමයට මෙම ව්‍යවසායන් පොදුවේ බැඳ තබන, දහසක් ධනපති ලණු නිසා, මෙම දුම්රිය මාර්ග සියකෝටියක් (යටත්විජිත සහ නව යටත්විජිතවල සිටින) ජනයා, එනම් ලෝක ජනගහනයෙන් අර්ධයකට වැඩි පිරිසක් වෙසෙන ගැති රටවල ජනයාද, එමෙන්ම, "ශීලාචාර" රටවල ප්‍රාග්ධනයේ වේතන වහලුන්ද, පීඩාවට පත්කරන උපකරණයක් බවට පත්වී තිබීමයි."**

**ලෙනින්, තෝරාගත් කෘති, 04 වෙළුම, 32 පිටුව 31, 32 පිටු**

ධනවාදය උපත ලබන්නේ ජාතික රාජ්‍යය තම සෙවණ කොටගෙනය. එනම් ජාතික ආර්ථිකයක් ලෙසින්ය. මුල්කාලීනව ජාතික විමුක්ති අරගලයන් පැනනගින්නේද ධනේශ්වර ජාතික රාජ්‍ය බිහිකිරීමේ වුවමනාව විසින්ය. එහෙත් ධනේශ්වර ප්‍රාග "ධනයේ ස්වභාවය විසින්ම එය ආක්‍රමණශීලීය. එබැවින් එය ජාතික දේශ සීමා කඩාබිඳ දමමින් ඒකාධිකාරී, බලවතුන්ගේ ලාභ පිපාසය විසින් ජාත්‍යන්තර සූරාකෑමක් දක්වා ගෙන ගියේය. ප්‍රාග්ධනයේ මෙම ජාත්‍යන්තර බලය තහවුරු කිරීම ගෝලීයකරණය මඟින් සම්පූර්ණ කළේය. ගෝලීයකරණය යනු අන් කිසිවක් නොව ඒකාධිකාරී ප්‍රාග්ධනයට ලොව අස්සක් මුල්ලක් නෑර සැරිසැරීමේ සමාජ ආර්ථික, ව්‍යවස්ථානුකූල, සදාචාරාත්මක අයිතිය තහවුරු කිරීමයි. එහි මතවාදය හෙවත් දැක්ම මාග්‍රට් තැචර්ලා රේගන්ලා විසින් විදහා දැක්වූ නව ලිබරල්වාදයයි. නව ලිබරල්වාදය යනු පෞද්ගලික ව්‍යවසායට අනුග්‍රහය දක්වන අතර ආර්ථික සාධක පාලනය රජයෙන් පුද්ගලික අංශයට පැවරීම දිරිමත් කරයි. ඒ යටතේ රාජ්‍ය ඒකාධිකාරී ධනවාදයට එරෙහිව පෞද්ගලික අංශය ඔසවා තබයි. රාජ්‍ය දේපළ පෞද්ගලීකරණය කිරීමේ සංකල්පය එන්නේ මෙහිදීය.

කෙසේ වෙතත් නව ලිබරල්වාදයේ නිර්මාතෘන් අනාථ කරමින් ගෝලීයකරණයේ සුභවාදී පොරොන්දු බොරු විය. 2008 ඇමරිකානු ආර්ථික අර්බුදය, අරාබි වසන්තය ආදී ආර්ථික දේශපාලන කැලඹිලි විසින් ධනවාදයේ ජානමය රෝගය හෙවත් චක්‍රීය අර්බුදය යළි ප්‍රකාශ වන්නට විය. දිගින් දිගටම ප්‍රාග්ධනය තම පැවැත්ම උදෙසා ඒකාධිකාරී බලය සෙවුවද යටත්විජිත, නව යටත්විජිත වැනි මෙහෙයුම් දියත් කළද, ගෝලීයකරණය වැනි පුළුල් අවකාශයන් විවෘත කළද එහි භාවිතාව තුළ වන ප්‍රතිවිරෝධය විසින් යළි යළිත් වාරික වශයෙන් පැමිණෙන චක්‍රීය අර්බුදය ප්‍රමාණයෙන්ද ගුණයෙන්ද සර්පිලාකාරව ඉහළ යනවා මිස අඩුවීමක් තබා පමාවීමක් හෝ සිදුවන්නේ නැත. එසේ ප්‍රාග්ධනය විසින් එහි ප්‍රතිවිරෝධය තුළ මුහුණදෙන අනිවාර්ය ඉරණම මෙසේය.

i. ඒකාධිකාර වල ජානමය ගුණය වන නිෂ්පාදන සංකේන්ද්‍රණය හේතුවෙන් නිෂ්පාදන ක්‍රියාවලිය සමාජමය වීම හා පවතින්නේ පෞද්ගලික දේපළ ක්‍රමයක් බැවින් එහි ඵලයන් අයත් කර ගැනීම පෞද්ගලික සිදුවේ. හේතුව සූරාකෑම මුළුමහත් මානව සමාජය පුරාවට පුළුල් කිරීමත්, මිහිතලයේ සම්පත් සියල්ල අවසන් එක් කේන්ද්‍රයකට ඒකරාශි කිරීමත්ය.

ii. පෞද්ගලික දේපළ ක්‍රමයකට තවදුරටත් දරාගත නොහැකි තරම් දැවැන්ත ලෙස වර්ධනය වූ තාක්ෂණික දියුණුව විසින් එයට අනුරූපී පොදු දේපළ ක්‍රමයක් ඉල්ලා සිටියි. එක් අතකින් මෙම දැවැන්ත නිෂ්පාදන බලවේග යන් නමැති යෝධයාට ඉදිරියට යෑමට ධනවාදී පෞද්ගලික දේපළ සබඳතා නමැති විලංගුව බාධාවක් වීම සහ එම විලංගුව කඩාදැමීමට හැකි තරමට යෝධයා ශක්තිමත්ය.

## ප්‍රතිව්‍යුහගතකරණය නම් ඒකාධිකාරී වුවමනාව

ආර්ථික අර්බුද හමුවේ නිෂ්පාදනය කඩාවැටීම විසින් පියවරක් පසු පසට තබා යළි වර්ධනය වන මෙම ප්‍රතිවිරෝධය පෞද්ගලික දේපළ සබඳතා ක්‍රමයේ උච්චතම අවස්ථාව වන ධනේශ්වර පෞද්ගලික දේපළ බාධකය හමුවේ යළි වියරු වැටේ. ධනේශ්වර ආර්ථික අඩිතාලම බිඳ දමනතුරු




**ප්‍රතිව්‍යුහගතකරණය නම් ඒකාධිකාරී බල ව්‍යාපෘති නාඩගම රාජ්‍ය ඒකාධිකාරී ධනවාදය හා පෞද්ගලික ඒකාධිකාරී ධනවාදය අතර ප්‍රතිවිරෝධ මත දිගටම රඟදැක්වෙනු ඇත. මෙම මෙහෙයුමේ ප්‍රධාන අවිය නම් ණය උපකරණයයි.**

මෙම ආවේගය ධනවාදය කම්පා කරමින් නැවැත නැවැත පැමිණේ. ඒ අනුව ඒකාධිකාරී ප්‍රාග්ධනය වෙනුවෙන් නව උපායන් සොයන අධිරාජ්‍යවාදය දැන් සොයාගෙන තිබෙන්නේ ප්‍රතිව්‍යුහගතකරණයයි.

ප්‍රතිව්‍යුහගතකරණය යනු රාජ්‍ය ඒකාධිකාරී ධනවාදය හා පෞද්ගලික ඒකාධිකාරී ධනවාදයේ අනුපාතයන් වෙනස් කරමින් ධනවාදයේ අර්බුදයට බෙහෙත් සෙවීමයි. ප්‍රතිව්‍යුහගතකරණයේදී රාජ්‍ය ඒකාධිකාරී ධනවාදී පංගුව හකුළුවමින් පෞද්ගලික ඒකාධිකාරී ධනවාදයේ පංගුව පුළුල් කරයි. ධනවාදයේ ආර්ථික ස්වභාවය විසින් රාජ්‍ය අංශය මුළුමනින්ම හකුළුවාලිය නොහැක. එයට හේතුව කොතරම් ගෝලීයකරණ අඬහැරය මුරගෑවද ජාතික ආර්ථික සීමාව නම් ලියැදි ක්‍රමය අත්හැර එකම තනි යායකට යන්නට ධනවාදී පෞද්ගලික දේපළ ක්‍රමයේ කැමැත්ත ඉඩ නොතබන බැවිනි. හේතුව පෞද්ගලික දේපළ ක්‍රමයකට විශ්ව ව්‍යාප්ති විමුක්තියක් ලද නොහැකි බැවිනි. ප්‍රතිව්‍යුහගතකරණය නම් ඒකාධිකාරී බල ව්‍යාපෘති නාඩගම රාජ්‍ය ඒකාධිකාරී ධනවාදය හා පෞද්ගලික ඒකාධිකාරී ධනවාදය අතර ප්‍රතිවිරෝධ මත දිගටම රඟදැක්වෙනු ඇත. මෙම මෙහෙයුමේ ප්‍රධාන අවිය නම් ණය උපකරණයයි.

ඕනෑම ආර්ථික අර්බුදයක් අවසන් වන්නේ දේශපාලන අර්බුදයක් ලෙසිනි. එයට හේතුව ආර්ථික අර්බුද සමනය හෝ තාවකාලික විසඳුම බල ක්‍රීඩාවක් වීමයි. ප්‍රාග්ධන ඒකාධිකාර මෙහෙයවන්නෝද එහි හවුල්කරුවෝද බලය හිමි පංතියයි. ඒකාධිකාරී ධනවාදය හෙවත් අධිරාජ්‍යවාදය ප්‍රාග "ධන අපනයනය මගින් ලෝකයේ රටවලට ගොඩබැසීම එම රටවල් යටත් කිරීම මගින් මෙන්ම පරාධීන කිරීම මගින්ද සිදුවේ. ලෝක යුද්ධ දෙකක අත්දැකීමෙන් පසු සහ සමාජවාදී රාජ්‍ය පද්ධතියක පැවැත්ම විසින් රටක් තමනට නතුකරගැනීමේ පූර්ව තත්වයන් සකස් කරගත හැක්කේ එම රට මෘදු බලහත්කාරයක් මගින් ආර්ථික වශයෙන් ණය උගුලක හසුකරගත් පසුවය යන්න අධිරාජ්‍යවාදය දැන් උගෙන තිබේ. දීර්ඝකාලීනව ණය උගුලක සිරවන පරිධියේ රටවල් ණය ප්‍රතිව්‍යුහගත කිරීම කරා තල්ලු කරගත හැකිය. එහි අවසාන අන්තය රට ජා.මූ.අ. වැනි නිල ආයතනයක පිහිට හෝ සෘජුව ණය දෙන රටක පිහිට වෙත තල්ලු කිරීමයි. එය මගින් එම රට ණය ප්‍රතිව්‍යුහගත කිරීමකට තල්ලු කරන අතර එහි හිලව්වට රට ආර්ථික ප්‍රතිව්‍යුහගතකරණයකට හිලව් කරයි. මේ නිමේෂයේ ශ්‍රී ලංකාව එළඹ සිටින්නේද එවන් තත්වයකටය.

## ණය, ආධාර, ප්‍රදාන සමාජවාදයට එරෙහිව සම්බාධක

ණය යනු ඒකාධිකාරී ප්‍රාග්ධනය හමුවේ ආයෝජනයකි. එය විටෙක ආධාර ලෙසද ප්‍රදානයන් ලෙසද වෙස්වලාගනී. පරිධියේ රටවල් පරාධීන කිරීමේ අර්ථයෙන් එය අවියකි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රධාන නිල ණය දෙන ආයතනයයි. 1944 බ්‍රෙටන්වුඩ් සමුළුවේදී ලෝක යුද්ධයෙන් ඇදවැටුණු යුරෝපීය රටවල් ගොඩගැනීමේ අරමුණෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් ලෝක බැංකුවත් (ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳව ජාත්‍යන්තර බැංකුව) බිහිවේ. චීනය ආර්ථික බලවතෙකු වෙමින් සිටින අතර 1980දී එයට සම්බන්ධ විය. එහෙත්

කියුබාව 1959 සමාජවාදී විප්ලව ආරම්භයත් සමඟ ඉන් ඉවත් විය. බ්‍රෙට්න්වුඩ් සමුළුවට සෝවියට් දේශය සම්බන්ධ වන නමුත් එම රට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුව සමඟ ණය ගැතියකු ලෙස සම්බන්ධ වූයේ නැත.

ලෝක බැංකුව මෙන් නොව ආරම්භයේදීම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේදී එහි සභාපති වන්නේ බටහිර යුරෝපීය ජාතිකයෙකි. එහි නියෝජ්‍ය කළමනාකාර අධ්‍යක්ෂක හා බටහිර අර්ධගෝලීය අංශයේ ප්‍රධානියා උතුරු ඇමරිකානුවෙකි. එහි දෛනික කටයුතු පාලනය කරන විධායක අධ්‍යක්ෂකවරුන් පස් දෙනෙකු එක්සත් ජනපදය, ප්‍රංශය, බටහිර ජර්මනිය හා ජපානය යන බලවත් ඒකාධිකාරී සමාගම් සහිත රටවල් වලින් පත්කෙරේ. එහි විධායක මණ්ඩලයේ ඡන්ද බලය තීරණය වන්නේ සාමාජික රටවල පංගුව හා අරමුදල් පංගුව අනුවය. ඒ අනුව තීරණ ගැනීමේ බලවත් පිරිස සීමිත වේ. මූල්‍ය අරමුදලේ ගිවිසුම් වගන්ති වෙනස් කිරීමට ගනු ලබන ඕනෑම ප්‍රයත්නයක් ඇමරිකා එක්සත් ජනපදයේ නිෂේධ බලයෙන් වැළකිය හැකිය. එනිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නම් නිල ණය දෙන්නා ඇමරිකා එක්සත් ජනපදයේ සහ බටහිර යුරෝපයේ අතකොළුවකි. එනම් ඒකාධිකාරී ධනවාදයේ කැමැත්තය. එහි අරමුදල් රැස් කරන්නේද සාමාජික ගාස්තුවලින් පමණි. ලෝක බැංකුව ණය දෙන රටවල කාටලයක වගකීම දරයි. එය තම අරමුදල් සඳහා පෞද්ගලික බැංකු හා වෝල් ස්ට්‍රීට්හි මූල්‍ය ආයතන හා සම්බන්ධ වේ. මෙහිදී ලෝක බැංකුව එක්තරා ආකාරයකින් ණය ආයෝජනය කරන කාටලයක විධායක ආයතනය මෙනි. ලෝක බැංකුවට තනි තීරණ ගත නොහැකිය. එය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සහයෝගයෙන් කටයුතු කරයි. මෙම ආයතන දෙකම එක්සත් ජනපදයේ බලයට විධානයට නියමින් හා අනියමින් යටත්ය.

**"මට වැටහෙන හැටියට තත්වය නම්, එක්සත් ජනපදය යම් ණයකට විරුද්ධ වුවහොත් එම ණය අනුමත නොවන බවයි. විධායක මණ්ඩල රැස්වීමකදී එවැන්නක් සිදුවීම විරල වන්නේ නිල නොවන ක්‍රියාවලිය ක්‍රියාත්මක වන නිසාය. එක්සත් ජනපදයේ විරෝධය, බැංකුව මඟින් විධායක මණ්ඩලය වෙත ව්‍යාපෘති ඉදිරිපත් කිරීම කෙරෙහි බලපානු ලබයි. ඇත්තෙන්ම ණය යෝජනා ක්‍රම විධායක මණ්ඩලයට ඉදිරිපත් කෙරෙන්නේ එක්සත් ජනපදය අදහස් දැක්වීමේදී හඬ නඟා විරෝධය දක්වනු ඇතිමුත් පක්ෂව හෝ විපක්ෂව ඡන්දය දීමෙන් වළකිනු ඇතැයි කළමනාකාරිත්වය ස්ථිරවම දැනගත් පසුවය."** තෙරේසා හෙටර් සහ කැතරින් වොට්සන්ගේ 'ආධාර පුරාජේරුව සහ යථාර්ථය' කෘතිය තුළ උපුටා දැක්වූ ලෝක බැංකු නිලධරයෙකුගේ ප්‍රකාශනයක්

ඒකාධිකාරී ධනවාදය ණය විකුණමින් (මූල්‍ය ආයතන රාජ්‍ය හා පෞද්ගලික) ලාභ ලබන අතර රටවල් පරාධීන කිරීමේ හා අධිරාජ්‍යවාදී ප්‍රාග්ධන වුවමනාවන් වෙනුවෙන් එම ආර්ථිකයන් හැසිරවීම තම අතට ගැනීම සඳහා ණය අවියක් කොටගනී. සමාජවාදී රටවල් සම්බන්ධයෙන් ඒකාධිකාරී ධනවාදය හැසිරෙන්නේ සම්බාධක මඟින් එම රටවල ආර්ථිකය බාධාකරමින් ඒවා යළි වෙළඳපොළ ආර්ථිකයක් වෙත පොළඹ වන සේ සම්බාධක අවියක් කොට ගනිමින්ය.

## ණය ප්‍රාග්ධනයේ මෘග සහ කපටි හැසිරීම

ණය හෝ ආධාර යන්න රටවලට දෙනු ලබන්නේ තෑගි වශයෙන් හෝ දඩුවම් වශයෙන්ය. එය මිතුරාට උපකාර ලෙසද සතුරාට අපකාර ලෙසද වේ. උදාහරණ වශයෙන් 1979 ජූලිවල සැන්ඩිනිස්ටා ව්‍යාපාරය නිකරගුවාවේ විප්ලවය ජයගත් පසු ජා.මූ.අ. හැසිරීම ගත හැකිය. එය ධනවාදී නිකරගුවාවට ණය ගෙවීම සඳහාද ණය දෙමින් කටයුතු කළ අතර සමාජවාදී නිකරගුවාවට ණය වටයක් දෙමින් එය පෞද්ගලික දේපළ ක්‍රමය රකින පාලනයක් බවට පත්කරගැනීමට ගන්නා ලද උත්සාහය අසාර්ථකවීමෙන් පසු ණය දීමද රට හා සම්බන්ධතාවයද අත්හළේය. ජා.මූ.අ. බොහෝ අප්‍රිකානු රටවලට ණය ලබාදෙන්නේ මිතුරු ධනවාදී රටවල් ලෙස ගෙනය.

එහිදී ණය ආධාර දීමේ විධික්‍රම මෙසේය.

1. නව වෙළඳපොළවල් විවෘත කරගැනීම උදෙසා මෘදු කොන්දේසි යටතේ ණය හා ප්‍රදානයන් ලබාදීම. එම ණය මගින් එම රටවල් වැඩි ආනයනයට පොළඹවයි. එය ඒකාධිකාරී ධනවාදයේ වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීමකි.

2. පොදු සේවා ඇති කරන ව්‍යාපෘතිවලට ණය දීමෙන් ආයෝජනයන්ට පාර කැපීම. වික්ටෝරියා යෝජනා ක්‍රමයට ණය දී බ්‍රිතාන්‍ය බී.බී.එන්. සමාගමට ව්‍යාපෘතිය ලබාදීම

3. පෞද්ගලීකරණය දිරිගන්වමින් ධනවාදී දේපළ ක්‍රමය රැකගැනීම උදෙසා කටයුතු කිරීම

4. ආර්ථිකයේ රාජ්‍ය පංගුව අඩුකරමින් පෞද්ගලික අංශය වර්ධනය කරන

ප්‍රතිව්‍යුහගතකරණය සඳහා බලපෑම් කිරීම

5. ලෝකය පොදු දේපළ ක්‍රමයකට යෑමේ තත්වයන් පමාකරමින් කොමියුනිස්ට්වාදී රටවල් බිහිවීම පමාකිරීම හා සමාජවාදී රටවල් බිඳවැට්ටවීම සඳහා ණය අවියක් හා උපකරණයක් සේ යොදාගැනීම

## සියල්ල සංයුක්තව

මෙහි සාරාංශය වන්නේ,

1. වත්මන් ඒකාධිකාරී ධනවාදයේ මූල්‍ය ඒකාධිකාරී සමාගම් මුදල් හෙවත් ණය විකිණීම සඳහා උත්සුක වේ. මුල් අවධියේ තෙල් සමාගම් එම වෙළඳාමෙන් ලද අධික ලාභය ආයෝජනයට අප්‍රිකානු රටවලට ණය දීමට තෝරාගත්තේය.

2. ඒකාධිකාරී ධනවාදය ප්‍රාග්ධන අපනයනයේදී රාජ්‍ය ව්‍යාපෘති පෞද්ගලීකරණය කොට ඒවායේ ආයෝජනයට ඉඩ ඉල්ලා ගැනීම සඳහා පෞද්ගලීකරණය දිරිගැන්වීම මගින් ප්‍රාග්ධන අපනයනයට ගොදුරු බිම් සකසා ගැනීම

3. ණය කොන්දේසි මත පොළඹවමින් රාජ්‍ය පංගුවට වඩා පෞද්ගලික පංගුව වැඩිකරමින් ප්‍රතිව්‍යුහගතකරණය සඳහා ණය ආධාර මගින් බලහත්කාරය යෙදවීම

4. රාජ්‍ය පංගුව යනු නැතිනම් රාජ්‍ය දේපළ යනු පොදු දේපළ සම්බන්ධතාවය වෙත පිවිසීමට ආසන්න පහසු මාවතකි. එය වළකාලීමට නම් පෞද්ගලීකරණය ප්‍රතිව්‍යුහගතකරණය නමින් පැමිණ වීම වැදගත් බව අවධාරණයෙන් යුතුව ණය භාවිතය

5. පෞද්ගලික දේපළ ක්‍රමයට බාධා නොවන පසුබිමක් පරිධියේ රටවල විවෘත කරගැනීම

ඒ අනුව ණයද, ණය මගින් එන ප්‍රතිව්‍යුහගතකරණයද රටවල් මෙල්ල කරන, උපකරණයකි අවියකි; ඉන් මිදිය හැක්කේ ධනේශ්වර ප්‍රාග්ධන අධිපතිත්වයෙන්, වැඩකරන ජනතාව මුදා ගත හැකි පොදු දේපළ සම්බන්ධතා තහවුරු කළ ලෝකයකට පමණකි. එහෙත් එතෙක් පොදු දේපළ සම්බන්ධතා ක්‍රමයක් වෙනුවෙන් සටන් වදින වැඩකරන ජනතාවට ප්‍රතිව්‍යුහගතකරණය නමින් එන පෞද්ගලීකරණයට බාධාකරන අනවරත සටනක් පවතී. ධනේශ්වර ව්‍යවසායයන්ගේ රාජ්‍ය පංගුව සැම විටම ළංවන්නේ පොදු දේපළ ක්‍රමය දෙසටය. එය වැළැක්වීම ඒකාධිකාරී ධනවාදයේ අරමුණයි. එම ප්‍රයත්නය පරාජය කිරීමේ ප්‍රථම අදියර හෙවත් පියවර සමාජවාදයයි. මහා පරිමාණ රාජ්‍ය දේපළ පැවැතීම සමාජවාදී සංක්‍රමණීය අවධියේ ආර්ථිකයටද දේශපාලනයටද මහත් පහසුවක් වීම අප වටහාගත යුතු පරම සත්‍යයකි.




**ධනේශ්වර ව්‍යවසායයන්ගේ රාජ්‍ය පංගුව සැම විටම ළංවන්නේ පොදු දේපළ ක්‍රමය දෙසටය. එය වැළැක්වීම ඒකාධිකාරී ධනවාදයේ අරමුණයි. එම ප්‍රයත්නය පරාජය කිරීමේ ප්‍රථම අදියර හෙවත් පියවර සමාජවාදයයි.**




# පෞද්ගලීකරණයේ ජාත්‍යන්තර අත්දැකීම් බංග්ලාදේශය

***බිමල් රත්නායක***

**බංග්ලාදේශයට ඉතාමත් අවශ්‍ය වන්නේ වැඩිපුරම විදේශීය ආයතනවල බලපෑමෙන් ආරම්භ වන පෞද්ගලීකරණය ඉලක්ක කර ගත් දේශපාලන, ආර්ථික දැක්මෙන් තීරණාත්මකව කැඩී වෙන් වීමයි. සත්‍ය වශයෙන්ම බංග්ලාදේශ ආණ්ඩුව කළ යුත්තේ, අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල් සමඟ එක් වී ණය ලබා දීමේ දී කොන්දේසි ලෙසත්, තම ආයතනයේම ඇති දේශපාලන, ආර්ථික දැක්මත් මත පදනම් වී ඒවා ණය සහ ආධාර ලබන රටවල ප්‍රතිපත්ති වෙනස් කිරීමට බලපෑම් කරන මෙම බහුපාර්ශ්වීය ආයතනවලට ඒ සඳහා ඇති නීත්‍යනුකූල අයිතිය පිළිබඳව අභියෝග කිරීමයි."**

'බංග්ලාදේශයේ පෞද්ගලීකරණය'- සංස්කරණය : මහාචාර්ය රෙහ්මන් සෝභන්

(Privatization in Bangladesh - Edited by Prof. Rehman Sobhan)

1971දී අතිවික්‍රමාන්විත ජාතික විමුක්ති අරගලයකින් බිහි වුණු බංග්ලාදේශය එම යුගයේ තිබූ පොදු ලෝක දේශපාලන යථාර්ථයත්, සමාජවාදයේ විජයග්‍රහණයත් හේතුවෙන් ඇති වූ සමාජ, ආර්ථික බලපෑම් නිසාත්, දේශීය ආර්ථිකය, කර්මාන්ත ගොඩනැඟීම්, රටේ ආර්ථික

ස්වෛරීත්වයට අදාළ ආර්ථික සංවර්ධනයට අදාළ ක්ෂේත්‍ර දියුණු කිරීමේ අරමුණ ඇතිව ජාතික සැලසුම් මණ්ඩලයක්ද, පස් අවුරුදු සැලසුම් මත පදනම් වූ ක්‍රියාකාරී සැලැස්මක්ද සහිතව තම ගමන ආරම්භ කළ රටකි. ඊට සමාන්තරව අවශ්‍ය කරන රාජ්‍ය ආයතන, සංස්ථා ඒ ඒ ප්‍රමාණයන් අලුතින් පිහිටුවීමද සිදු කරන ලදී. එමෙන්ම එතෙක් තිබූ රාජ්‍ය ආයතන නව ඉලක්කවලට සහ සැලසුම්වලට ගැළපෙන පරිදි ප්‍රතිසංවිධානයද කරන ලදී.

### පෞද්ගලීකරණය සඳහා ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කළ අයුරු

බංග්ලාදේශය තුළ සහ ලොව තුළ 1945-1975 දක්වා ප්‍රධාන වශයෙන් පැවැතියේ රාජ්‍ය ධනවාදී මොඩලයයි. ඒ සමඟම නව යටත්විජිතවාදී ආර්ථික ක්‍රියාවලිය ලොවට හඳුන්වා දීමට අධිරාජ්‍යවාදී සංවිධාන 'ලෝක බැංකුව,' 'ජාත්‍යන්තර මූල්‍ය අරමුදල' වැනි ආයතන යොදාගෙන ලොව පුරාම ප්‍රධාන වැඩසටහන් පහක් ක්‍රියාත්මක කරන ලදී.


'රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය සහ රජය සතුව තිබෙන සේවාවන්වල අයිතිය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් හෝ අතහැරීම' යන ආර්ථික ක්‍රියාමාර්ග යෝජනා වූයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි (IMF) 'ව්‍යුහාත්මක ගැළපුම් පහසුකම්' ( Structural Adjustment Facilities - SAF) යටතේය. බංග්ලාදේශය තුළ මෙම ක්‍රියාවලිය 1986දී ආරම්භ කෙරුණු අතර, එය 'ව්‍යුහාත්මක ගැළපුම් පහසුකම්' (SAF) වැඩපිළිවෙළ ක්‍රියාවට නඟන ලද පළමු රටවල් 29න් එකක් විය. 1982 සිට 1991 දක්වා බංග්ලාදේශයේ පැවැති මිලිටරි ඒකාධිපති එර්ෂාඩ්ගේ පාලන කාලය තුළ - විශේෂයෙන්ම 1986 සිට 1991 වන විට - රාජ්‍ය ආයතන 125ක් විදුලි වේගයෙන් පෞද්ගලීකරණය කෙරිණි.

1979-1981, 1991-1996, 2001-2006 දක්වා තෙවරක් බංග්ලාදේශයේ මුදල් අමාත්‍ය ධුරය හෙබවූ සයිෆර් රහ්මාන් ( Saifur Rahman) ඔහුගේ කෘතියේ මෙසේ ලිවී ය :

**"ව්‍යුහාත්මක ගැළපුම් වැඩපිළිවෙළ ආරම්භ කළේ තමන් යැයි සමහර අවස්ථාවලදී ආඩම්බරයෙන් මේ ආණ්ඩුව ප්‍රකාශ කළත්, එම වැඩපිළිවෙළ නිසා බංග්ලාදේශය ආර්ථික**

**බංග්ලාදේශය තුළ අධිරාජ්‍යවාදී බහුපාර්ශ්වීය ආයතන ඇති කළ වැඩසටහන්**

| කාලය | | වැඩසටහනේ නම සහ ස්වභාවය | බිම් මට්ටමින්ම ඇති කරන ලද ප්‍රතිවිපාක |
|---|---|---|---|
| 1. | 1950 ගණන් | විදේශ ආධාර, අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන් ව්‍යාපෘති | ගංගාවල සහ ඇළවල පාලම් ඉදිකිරීම. ආධාර උපදේශනය මත ජීවත්වන නව වර්ගයක විශේෂඥයන් සහ ශ්‍රම බළකායක් ඇති වීම. |
| 2. | 1960 ගණන් | හරිත විප්ලවය (Green Revelution) | අධි අස්වැන්නකින් යුතු තනි භෝග වැවීම. රසායනික පොහොර, බීජ, කෘමිනාශක භාවිතය. |
| 3. | 1970 ගණන් | දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහන් (Poverty Alleviation Programmes) | නව රාජ්‍ය නොවන සංවිධාන (NGO) සහ සිවිල් සංවිධාන ජාලයක් බිහි විය. |
| 4. | 1980 ගණන් | ව්‍යුහාත්මක ගැළපුම් වැඩසටහන් (Structural Adjustment Programmes) | රාජ්‍ය දේපළ සහ සේවා පෞද්ගලීකරණය. |
| 5. | 1990 ගණන් | තීරු බදු සහ වෙළෙඳාම පිළිබඳ පොදු ගිවිසුම (GATT) | ගෝලීය ප්‍රාග්ධනයට නිදහසේ ගලා යාමට ඉඩ සැලැසීම. |
| 6. | 2001 ගණන් | දුප්පත්කම තුරන් කිරීමේ උපායමාර්ගික පත්‍රිකාව | සීනි තැවරූ ව්‍යුහාත්මක ගැළපුම් වැඩපිළිවෙළ. |



**පෞද්ගලීකරණයට පෙර සහ පෞද්ගලීකරණයෙන් පසු දළ ජාතික නිෂ්පාදිතයට කාර්මික ක්ෂේත්‍රයේ දායකත්වය වැඩි වූයේ සියයට 0.9කින් පමණකි. කාර්මික නිෂ්පාදනයේ වර්ධනය 1992-1993 කාලය තුළ සියයට 9.1ක්ව පැවැති අගය ව්‍යුහාත්මක ගැළපුම් වැඩපිළිවෙළෙන් පසු 1998-1999 කාලයේ දී සියයට 2.5 දක්වා අඩු විය.**

**අවපාතයකට ලක් විය. ශීඝ්‍රයෙන් කරන ලද රාජ්‍ය ආයතන අන්සතු කිරීමත්, පෞද්ගලීකරණයත්, පාලන කොන්දේසි ළිහිල් කරමින්, ව්‍යුහාත්මක ගැළපුම් පහසුකම් (SAF) වැඩපිළිවෙළ යටතේ ණය ගැනීම වැඩි කරන ලෙස කරන ලද අවධාරණයත් නිසා මේ වන විට බැංකු සහ මූල්‍ය ආයතන එම ණය අය කර ගැනීමට නොහැකි තත්වයකට පත්ව තිබේ. අප මුහුණ දී සිටින ණය අය කර ගැනීමට නොහැකි වීමේ බරපතළ අර්බුදය එහි ප්‍රතිඵලයකි."**

බංග්ලාදේශය තුළ පෞද්ගලීකරණය කරන ලද ක්ෂේත්‍ර සහ කර්මාන්ත රාශියක් පවතී. එය අපනයනවලට වඩා ආනයන දිරිමත් කළ දැක්මකින් සිදු කරන ලද එකකි. එය කෘෂිකර්මය, බැංකු, ජූට් කර්මාන්තය, බලශක්ති, ගල්අඟුරු, ගෑස්, තෙල්, රසායනික කර්මාන්ත, සන්නිවේදන, ඉඩම්, සෞඛ්‍යය ආදී මුළු ආර්ථිකයම වෙළා ගත් පෞද්ගලීකරණ ක්‍රියාවලියකි. අප ඉදිරියේදී උදාහරණ ලෙස සාකච්ඡා කරන්නේ ඉන් බලශක්ති ක්ෂේත්‍රය පිළිබඳව හා පෞද්ගලීකරණයේ ජයග්‍රහණ පිළිබඳව ගොඩනඟා ඇති මිථ්‍යාව හෙළිදරව් කිරීමට ප්‍රමාණවත් වන උදාහරණ කිහිපයක් පමණකි.

1. 'ව්‍යුහාත්මක ගැළපුම් වැඩපිළිවෙළ සමාලෝචනය කිරීම' (Structural Adjustment Facilities Programme Review Initiative - SAPRI), බංග්ලාදේශය - භට්ටාචාර්ය සහ ටයිටුමාර්, 2001 (Bhattacharya and Titumir, 2001). එහි ප්‍රධාන නිරීක්ෂණ කිහිපයක් පමණක් මෙහි දක්වමු.

I. ව්‍යුහාත්මක ගැළපුම් වැඩපිළිවෙළට ( SAP) පෙර සහ එයට පසු එනම්, පෞද්ගලීකරණයට පෙර සහ පෞද්ගලීකරණයෙන් පසු දළ ජාතික නිෂ්පාදිතයට කාර්මික ක්ෂේත්‍රයේ දායකත්වය වැඩි වූයේ සියයට 0.9කින් පමණකි. කාර්මික නිෂ්පාදනයේ වර්ධනය 1992-1993 කාලය තුළ සියයට 9.1ක්ව පැවැති අගය ව්‍යුහාත්මක ගැළපුම් වැඩපිළිවෙළෙන් පසු 1998-1999 කාලයේ දී සියයට 2.5 දක්වා අඩු විය. දළ ජාතික නිෂ්පාදිතයට (GDP) කාර්මික අංශයේ දායකත්වය 1992-1993 කාලයේ දී සියයට 10.5ක් වූ අතර, 1998-1999 වසරවල සියයට 11.2ක් දක්වා වැඩි විය.

II. ව්‍යුහාත්මක ගැළපුම් වැඩපිළිවෙළෙන් (SAP) පසු වෙළෙඳාම ඊට පෙර යුගයට වඩා පහළ වැටිණි.

III.ආර්ථිකයේ විවෘතභාවය (Economic Openness) : අපනයන සහ ආනයන අතර ප්‍රතිශතය ව්‍යුහාත්මක ගැළපුම් වැඩපිළිවෙළට (SAP) පෙර 1991දී සියයට 1.9ක් වූ අතර, 1999දී එය සියයට 35ක් වී තිබිණි.

IV. 1989 සිට 1996 දක්වා කාලය - ව්‍යුහාත්මක ගැළපුම් වැඩපිළිවෙළට (SAP) පෙර සහ පසු : කාර්මික අංශයේ රැකියා ප්‍රමාණය මිලියන 7.8 සිට මිලියන 5.2 දක්වා

සියයට 33කින් අඩු විය. නිෂ්පාදන ක්ෂේත්‍රයේ මෙම අඩු වීම 1989දී මිලියන 7 සිට මිලියන 4.1 දක්වා විය.

V. 1987දී බංග්ලාදේශයේ බැංකුවල වැඩිම ණය ලබා ගත් සියයට 1 විසින් සමස්ත ණයවලින් සියයට 72.36ක් ලබාගෙන තිබූ අතර, ව්‍යුහාත්මක ගැළපුම් වැඩපිළිවෙළෙන් (SAP) පසු 1998දී එනම්, වසර 10කදී එය සියයට 75.63ක් දක්වා වැඩි වී තිබිණි. එම කාලය තුළදීම අඩුම ණය ලබා ගත් ණයකරුවන් සියයට 95ක් ලබා ගත් ණය ප්‍රමාණය 1987දී සියයට 17.92 සිට 1998දී සියයට 12.8 දක්වා අඩු වී තිබිණි.


VI. 1985-1991 අතර කාලය තුළදී බංග්ලාදේශයේ පෞද්ගලික රෙදි කම්හල්වලින් සියයට 74ක් එම වසර හත තුළදී වසර පහක්වත් අලාභ ලැබීය. එම කාලය තුළම රාජ්‍ය අංශය තුළ රෙදි කම්හල්වලින් වසර හතෙන් වසර පහක් පමණ අලාභ ලැබූ ප්‍රමාණය සියයට 62ක් විය. රජය සතු ජූට් කර්මාන්ත ශාලා 35ක් 1982-1983 කාලය තුළ පෞද්ගලික අංශයට දෙන ලදී. ඉන් වසර 20කට පසුවද මින් අතිබහුතරයක් ලාභ ලබා නැති අතර, විශාල වශයෙන් බංකොළොත් වී තිබේ.

VII. බංග්ලාදේශයේ ඉඩම් අහිමි ජනතාව 1983-1984 කාලයේදී සියයට 46.3කි. ව්‍යුහාත්මක ගැළපුම් වැඩපිළිවෙළෙන් (SAP) පසු 1996දී එය සියයට 56කි.

VIII. පෞද්ගලීකරණය නිසා 1991-1997 දක්වා කාලය තුළ රැකියා අහිමි වූ සේවකයන් ප්‍රමාණය 89,971කි. 1997-2000 දක්වා කාලය තුළ පෞද්ගලීකරණයෙන් තවත් 88,612 දෙනකු රැකියාවලින් ඉවත් කරන ලදී. ඔවුන්ගෙන් සියයට 42ක් පුහුණු ශ්‍රමිකයෝය. සියයට 22.5ක් අර්ධ පුහුණු ශ්‍රමිකයෝය. සියයට 28ක් පමණක් නුපුහුණු ශ්‍රමිකයන් වූහ.

බංග්ලාදේශය තුළ ව්‍යුහාත්මක ගැළපුම් වැඩපිළිවෙළ (SAP) යටතේ කරන ලද පෞද්ගලීකරණයේ ප්‍රතිඵල දෙස බැලුවහොත්

1. කාර්මික නිෂ්පාදනය බිඳවැටීම (නිර්කාර්මිකකරණය)
2. ආනයන ඉහළ යාම
3. කාර්මික අංශයේ රැකියා අඩකින් පමණ අඩු වීම
4. බැංකු ධනවතුන්ට පමණක් ණය දෙන ආයතන බවට තව දුරටත් පත් වීම
5. ඉඩම් අහිමි ජනතාව වැඩි වීම
6. රැකියාවලින් නෙරපීම් වැඩි වීම
7. පෞද්ගලීකරණයෙන් පසුවද එම ආයතන ලාභ නොලැබීම



**බංග්ලාදේශයේ ඉඩම් අහිමි ජනතාව 1983-1984 කාලයේදී සියයට 46.3කි. ව්‍යුහාත්මක ගැළපුම් වැඩපිළිවෙළෙන් (SAP) පසු 1996දී එය සියයට 56කි.**

**ලෝක බැංකුව කළ අධ්‍යයන වාර්තාවකින් උපුටා ගන්නා ලද බංග්ලාදේශයේ පෞද්ගලීකරණයේ ප්‍රතිඵල**

| ආයතනය | | පෞද්ගලීකරණයට පෙර | පෞද්ගලීකරණයට පසු |
|---|---|---|---|
| 01. | චිතගොං සිමෙන්ති කැට කුඩු කිරීමේ සමාගම (Chittagong Cement Clinker Grinding Company) | ප්‍රාග්ධන උපයෝගීතාව 52%යි. වෙළඳම: ටකා කෝටි 49.58යි. සේවකයන් 316යි. ලාභදායී ව්‍යාපාරයකි. | ප්‍රාග්ධන උපයෝගීතාව 72% වෙළඳම: ටකා කෝටි 86යි. සේවකයන් 252යි. ලාභදායී ව්‍යාපාරයකි. |
| 02. | කොහිනූර් කෙමිකල්ස් (Kohinoor Chemicles) | අලාභය: ටකා කෝටි 6යි. | ලාභදායී ව්‍යාපාරයකි. ලාභය: ටකා ලක්ෂ 79යි. |
| 03. | සීමාසහිත 5 ආර් සමාගම (5 R Limited) | අලාභදායී ව්‍යාපාරයකි. අලාභය: ටකා කෝටි 5.64යි. | අලාභදායී ව්‍යාපාරයකි. අලාභය: ටකා ලක්ෂ 47යි. |
| 04. | සීමාසහිත කිෂෝර් ගැන්ගි ටෙක්ස්ටයිල්ස් සමාගම (Kishore Gangi Textile Limited) | අලාභදායී ව්‍යාපාරයකි. අලාභය: ටකා ලක්ෂ 64යි. | අලාභදායී ව්‍යාපාරයකි. අලාභය: ටකා කෝටි 2.16යි. |
| 05. | ඊගල් බොක්ස් සහ කාට්න් සමාගම (Eagle Box and Carton Company) | අලාභදායී ව්‍යාපාරයකි. අලාභය: ටකා කෝටි 1.85යි. | අලාභදායී ව්‍යාපාරයකි. අලාභය: ටකා කෝටි 3.13යි. |
| 06. | ස්ටයිල් ෆැබ්රික්ස් (Style Fabrics) | අලාභදායී ව්‍යාපාරයකි. අලාභය: ටකා ලක්ෂ 13යි. | අලාභදායී ව්‍යාපාරයකි. අලාභය: ටකා ලක්ෂ 30යි. |
| 07. | හමීඩියා ටෙක්ස්ටයිල්ස් මිල්ස් (Hamidia Textiles Mills) | ක්‍රියාත්මක විය. | වසා ඇත. |
| 08. | ඩකා වෙජිටබල් ඔයිල් සමාගම (Dhaka Vegetable Oil Company) | ක්‍රියාත්මක විය. | වසා ඇත. |
| 09. | බී.ඩී. සයිකල් ඉන්ඩස්ට්‍රීස් (B. D. Cycle Industries) | ක්‍රියාත්මක විය. | වසා ඇත. |
| 10. | මදාරිපූර් රෙදිපිළි සමාගම (Madaripur Textiles Limited) | ක්‍රියාත්මක විය. | වසා ඇත. |
| 11. | සිංහ ටෙක්ස්ටයිල්ස් සමාගම (Sinha Textiles Company) | ක්‍රියාත්මක විය. | වසා ඇත. |
| 12. | ක්වොන්ටම් ෆාමසියුටිකල් (Quantum Pharmaceutical) | ක්‍රියාත්මක විය. | වසා ඇත. |

**බංග්ලාදේශයේ බලශක්ති ක්ෂේත්‍රයේ පෞද්ගලීකරණ අත්දැකීම් :**

1. බංග්ලාදේශයට නිදහස ලැබීමත් සමඟම 1972දී බංග්ලාදේශ ඛනිජ තෙල් සහ ගෑස් නීතිගත සංස්ථාව (Bangladesh Mineral Oil and Gas Corporation) පිහිටුවීම - 'පෙට්‍රෝ බංග්ලා' (Petro Bangla). 1989දී බංග්ලාදේශ ඛනිජ තෙල් ගවේෂණ සහ නිෂ්පාදන සමාගම (Bangladesh Petroleum Exploration and Production Company) පිහිටුවා ගෑස් සහ ඛනිජ තෙල් ගවේෂණය ආරම්භ කිරීම.

2. ගෑස් අපනයනය කිරීමට 1981 සිටම ලෝක බැංකුව බංග්ලාදේශයට බලපෑම් කිරීම. එමඟින් 'දීප්තිමත් අනාගතයක්' සහතික කිරීම. ඉන්දියාවට ගෑස් අපනයනය කිරීමටත්, ගෑස් ගවේෂණය විදේශීය බහුජාතික සමාගම්වලට දෙන ලෙසටත් බලපෑම් කිරීම.

3. 1996දී පෞද්ගලික බලශක්ති නිෂ්පාදනය (IPP) සඳහා ආණ්ඩුවේ ප්‍රතිපත්ති සැකසීම.

4. එමඟින් බැරපුකුරියා (Barapukurla) - ගල් අඟුරු, ෂාහ්ජිබසර් (Shahjibazar) - ගෑස්, බඝබරි (Baghabari) ගෑස් - සිල්හෙට් (Sylhet) - ගෑස් ආදිය

**1993-1994 කාලයේ දී බහුජාතික සමාගම්වලට විශාල වශයෙන් පවරන ලදී.**

i. කේයර්න් එනර්ජි සමාගම- ඕලන්දය (Cairn Energy - Holland Sea Search) - ගෑස් නිධි 16

ii. හැලිබර්ටන් සහ සැන්ටොස් සමාගම් (Halliburton and Santos) - ගෑස් නිධි 15

iii. චෙව්රන් කෝපරේෂන් (Chevron Corporation) - ගෑස් නිධි 12, 13, 14

iv. ඕක්ලන්ඩ් සහ ටුලෝ (Okland and Tullow) සමාගම් - ගෑස් නිධි 17 සහ 18

v. යුනයිටඩ් මෙරිඩියන් (United Meridion) සමාගම - ගෑස් නිධිය අංක 22

vi. ෂෙල් - කේයර්න් එනර්ජි (Shell - Kairn Energy) සමාගම - ගෑස් නිධි 5 - 10



රාජ්‍ය අංශයෙන් ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ බලාගාරවල බලශක්ති නිෂ්පාදනය පෞද්ගලික වශයෙන් (IPP) සිදු කිරීමට තීරණය කිරීම.
'පෙට්‍රෝ බංග්ලා' (Petro Bangla) ආයතනය මඟින් සිදු කිරීමට නියමිතව තිබූ ගෑස් නිෂ්පාදනය 1993-1994 කාලයේ දී බහුජාතික සමාගම්වලට විශාල වශයෙන් පවරන ලදී.

මෙම පෞද්ගලීකරණය මඟින් බංග්ලාදේශයට සිදු වූයේ තමන්ගේම ගෑස් තමන් නිෂ්පාදනය කළ අගය මෙන් 30 ගුණයක වැඩි වටිනාකමකට ඇමෙරිකානු ඩොලර් ලබා දී මිලට ගැනීමටයි.

ඉන් සිදු වූයේ :

1. 'පෙට්‍රෝ බංග්ලා' (Petro Bangla) ආයතනය පාඩු ලැබීම. (පෙට්‍රෝ බංග්ලා මඟින් වසර 10කදී ටකා බිලියන 20කට මිලදී ගැනීමට හැකිව තිබූ ගෑස් ප්‍රමාණය බහුජාතික සමාගම්වලින් ටකා බිලියන 160කට මිලදී ගැනීමට සිදු වීම)

2. රටේ විදේශ විනිමය හිඟයක් ඇති වීම.

3. ගෑස් මිල සහ බදු බර අධික ලෙස වැඩි කිරීමට සිදු වීම. එමඟින් ජනතාවගේ ජීවන වියදම වැඩි වීම.
උදාහරණ :
1. ගෑස් ළිඳක් සඳහා පෙට්‍රෝ බංග්ලා ආයතනය 2010දී වියදම් කළ මුදල ටකා බිලියන එකකි. බහුජාතික සමාගම්වල වියදම් බිලියන 2 සිට 6 දක්වා වැඩි විය.
2. බහුජාතික සමාගම් ගෑස් ඝන අඩියක් බංග්ලාදේශයට විකුණනු ලැබුවේ ඇමෙරිකානු ඩොලර් 3 - 4 අතර මුදලකටය. පෙට්‍රෝ බංග්ලා ආයතනයට ඒ සඳහා වැය වූයේ ඇමෙරිකානු ඩොලර් එකක් පමණි. (උපුටා ගැනීම : මහාචාර්ය අනු මුහම්මඩ්ගේ 'සංවර්ධනය නැවත පරීක්ෂා කෙරිණි' (Development Re-examined' -Prof. Anu Muhammad) කෘතියෙනි.

බංග්ලාදේශයේ බලශක්ති ක්ෂේත්‍රය පෞද්ගලීකරණය කිරීම නිසා ඇති වී තිබෙන ආර්ථික, පාරිසරික, දේශපාලන හානිය, පෞද්ගලීකරණයේ විනාශකාරී ප්‍රතිඵල උපාධි පාඨමාලාවලට ඇතුළත් කළ යුතු මට්ටමේ එකකි.

සමස්තයක් වශයෙන් පෞද්ගලීකරණය මඟින් සිදු කෙරෙන්නේ ජනතාවට ලැබිය යුතු ලාභය ව්‍යාපාරිකයකුගේ සාක්කුවට දමා ගැනීම පමණක් නොවේ. පෞද්ගලීකරණය මත පදනම් වූ ආර්ථික මතවාදය විසින් රටවල් ආර්ථික වශයෙන් සුවිශාල කාලයකට නන්නත්තාර කර ආර්ථික මාවත විනාශ කර අදාළ රට නව යටත්විජිතකරණයේ බොකු බඩවැල් තුළටම උරා ගැනීමද සිදු කෙරේ. බංග්ලාදේශ අත්දැකීම මෙය මොනවට සනාථ කරයි.


මූලාශ්‍ර :

1. Development Re-examined - Construction and Consequences of Neo-Liberal Bangladesh - Prof. Anu Muhammad

2. Privatization in Bangladesh - An Agenda in Search of a Policy - Economist Rehman Sobhan



# දියුණු ධනවාදී රටවල රාජ්‍ය ව්‍යවසාය

***වෛද්‍ය එච්.පී. ධම්මික***

ශ්‍රී ලංකාව වැනි රටවල ආර්ථික සංවර්ධනයේදී හමුවන ප්‍රධාන බාධාවක් ලෙසට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ආයතනත් ඇතැම් ආර්ථික ගුරුකුලවල නියෝජිතයිනුත් විසින් ඉදිරිපත් කරන්නේ ආර්ථිකය තුළ රාජ්‍ය ව්‍යවසායන්ගේ පැවැත්මයි. ඊට විසඳුම් වශයෙන් ඔවුහු 'කෝකටත් තෛලයක්' ලෙස රාජ්‍ය ව්‍යවසායයන් පෞද්ගලීකරණය කිරීමට යෝජනා කරති. ශ්‍රී ලංකාව තුළදී රාජ්‍ය ව්‍යවසායයන් පිළිබඳ කෙරෙන සාකච්ඡාවේදී වඩාත් වැඩිපුර ඉස්මතු කිරීමට උත්සාහ ගන්නේ ආර්ථිකයේ මේ මහා ව්‍යසනයේ වගඋත්තරකරු රාජ්‍ය ව්‍යවසායයන් බවය. ශ්‍රී ලංකාව වැනි රටක ආර්ථිකයක් තුළ රාජ්‍ය ව්‍යවසායයන්ට කාර්යභාරයක් නොමැති බවය. ඒ බව තහවුරු කිරීම සඳහා ඔවුන් ගන්නා උත්සාහයේදී ලෝකයේ ආර්ථික වශයෙන් දියුණු රටවල රාජ්‍ය ව්‍යවසායයන් නොමැති බව හෝ රාජ්‍ය ව්‍යවසායයන්ට ඒ රටවල ආර්ථිකය තුළ කාර්යභාරයක් නොමැතිය යන්න ජනතාවට ඇඟවීමට වෙර දරති.

මේ පිළිබඳ සාකච්ඡාවේදී පළමුව රාජ්‍ය ව්‍යවසායයක් යන්නෙන් මෙම ලිපිය තුළින් අදහස් කරන්නේ කුමක්ද යන්න පැහැදිලි කර ගැනීම වැදගත් වේයැයි සිතේ. එදිනෙදා භාවිතයේදී එකිනෙකා අතර ඒ පිළිබඳ විවිධ සංකල්පනාවන් පවත්නා බැවිනි. රාජ්‍ය ව්‍යවසායයන් යන්නෙන් මෙහිදී අදහස් කරන්නේ රාජ්‍ය පාලනය සහිත සමගාමීව මෙම සමාගම්වල අයිතියේ ස්වභාවය සහ පරිපාලන ව්‍යූහය රටින් රටත්, ක්ෂේත්‍ර අනුවත් විවිධ විය හැකිය. එහිදී රජයේ හිමිකාරිත්වය ඉතාම කුඩා සහ සංවිධානමය හා කළමනාකරණයන් පුළුල් ස්වාධීනත්වයක් සහිතව කටයුතු කරන ව්‍යවසායයේ සිට මුළුමනින්ම රජයේ හිමිකාරිත්වයක් පවතින සහ අදාළ අමාත්‍යාංශයන් යටතේ පාලනය වන ව්‍යවසායයන් අතර පුළුල්



**සංවර්ධිත රටවල (OECD) රාජ්‍ය හිමිකාරිත්වය වැඩි රාජ්‍ය ආයතනවල එනම් 50%කට වඩා වැඩි හිමිකාරිත්වයක් සහිතව රජයට ඇති ව්‍යවසායයන් තුළ පමණක් මිලියන හයකට වැඩි රැකියා නියුක්තියක් ඇති අතර ට්‍රිලියන 02කට වැඩි වත්කම් ප්‍රමාණයන් අඩංගුව පවතී.**

පරාසයක රාජ්‍ය ව්‍යවසායන් පැතිර පවතී. (European Commission - Institutional Papers 31)

## ජාත්‍යන්තර වෙළඳාම තුළ

මේ වන විට ජාත්‍යන්තර වෙළඳපොළ තුළ රාජ්‍ය ව්‍යවසායයන්ගේ මැදිහත් වීමේ ප්‍රමාණයේ ඉහළ යාමේ ප්‍රවණතාවක් නිරීක්ෂණය කළ හැකිව තිබේ. මීට දශකයකට පමණ පෙරදී ලෝකයේ විශාලතම සමාගම් 500 අතරින් රාජ්‍ය සමාගම් ලෙස පැවතියේ සමාගම් 52ක් පමණි. එහෙත් දැන් (2022 වසර වන විට) එම සංඛ්‍යාව 132ක් දක්වා ඉහළ ගොස් තිබේ. එම සමාගම්වලින් වැඩි ප්‍රමාණය සංවර්ධිත රටවලට අයත් සමාගම් නොව නැගී එන ආර්ථිකයන් සහිත රටවල සමාගම් වේ.

## සංවර්ධිත රටවල්

සංවර්ධිත රටවල වත්කම් හා රැකියාවලින් විශාල කොටසක්ද රාජ්‍ය ව්‍යවසාය තුළ අඩංගුව පවතී. මෙහිදී අප සංවර්ධිත රටවල් යන්නෙන් අදහස් කරන්නේ ආර්ථික සහයෝගීතාව සහ සංවර්ධනය සඳහා වූ සංවිධානයේ (OECD - Organisation for Economic Cooperation and Development) සාමාජික රටවල්ය. 1961 වසරේදී පිහිටුවා ගැණුනු මෙම සංවිධානයේ රටවල් 38ක් සාමාජිකත්වය දරයි. මෙය 1948 වසරේදී මාර්ෂල් සැලැස්ම ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් එක්සත් ජනපදය මැදිහත් වී ගොඩනඟන ලද සංවිධානයේම දිගුවකි. තමන් ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් සහ වෙළඳපොළ ආර්ථිකයන් වෙනුවෙන් පෙනී සිටි බවත් මෙම සංවිධානයේ අරමුණ ආර්ථික වර්ධනය සහ ජාත්‍යන්තර වෙළඳාම ප්‍රවර්ධනය කිරීම බවත් පවසනු ලබයි. මෙහි සාමාජික රටවල් 38 අතරින් වැඩි ප්‍රමාණයක් ඉහළ ආදායම් ආර්ථියක් හා ඉහළ මානව සංවර්ධිත දර්ශකයන් ඇති පොදුවේ සංවර්ධිත රටවල් ලෙස හඳුන්වන රටවල්ය. යුරෝපා සංගමයට අයත් රටවල්ද යුරෝපා සංගමයට අයත් නොවන එක්සත් ජනපදය කැනඩාව හා ජපානය වැනි රටවල්ද මෙහි සාමාජිකයන් වේ.

සංවර්ධිත රටවල (OECD) රාජ්‍ය හිමිකාරිත්වය වැඩි රාජ්‍ය ආයතනවල එනම් 50%කට වඩා වැඩි හිමිකාරිත්වයක් සහිතව රජයට ඇති ව්‍යවසායයන් තුළ පමණක් මිලියන හයකට වැඩි රැකියා නියුක්තියක් ඇති අතර ට්‍රිලියන 02කට වැඩි වත්කම් ප්‍රමාණයන් අඩංගුව පවතී. මෙම රටවල බලශක්ති හා ප්‍රවාහන ක්ෂේත්‍රයේ වටිනාකම්වලින් 40%ක්ද රැකියාවලින් 43%ක්ද සැපයෙන්නේ රාජ්‍ය ව්‍යවසායයන් මඟිනි. යුරෝපා සංගමයේ රටවල් වෙනම ගෙන සලකා බැලූ විටද රාජ්‍ය ව්‍යවසායයන් සැලකිය යුතු කාර්යභාරයක් සිදු කරන බව පෙනේ. යුරෝපා සංගමයේ නව සාමාජික රටවල් වන පෝලන්තය, ක්‍රොඒෂියාව, රුමේනියාව, ස්ලෝවේනියාව  වැනි රටවල්වල රාජ්‍ය ව්‍යවසාය ප්‍රබල ලෙස පැතිර පවතී. යුරෝපයේ ආර්ථිකයන් අතරින් රාජ්‍ය ව්‍යවසායයන්ගේ වැඩිම දායකත්වයක් ඇත්තේ ස්ලෝවේනියාවේය. එරට වත්කම්වලින් 1/3ක් අයත් වන්නේ රාජ්‍ය ව්‍යවසායන්ටය. එපමණක් නොව යුරෝපා සංගමයේ ආරම්භක



**1970 වසරේ ඇතිවූ දිග්ගැසුණු ආර්ථික අර්බුදය බ්‍රිතාන්‍ය රාජ්‍ය ව්‍යසායයන් පෞද්ගලීකරණ වෙත ගෙන ගියේය. එරට රාජ්‍ය ව්‍යවසායයේ බහුතර ප්‍රමාණයක් පෞද්ගලීකරණය කරනු ලබන්නේ 1979 වසරත් 1997 වසරත් අතර කාලයේදී, කොන්සර්වේටිව් පක්ෂ පාලනයන් විසිනි.**

රටවල් 15 අතරින් ප්‍රංශය, ඉතාලිය හා ස්වීඩනය යන රටවල ආර්ථිකය තුළද රාජ්‍ය ව්‍යවසායේ කාර්යභාරය කැපී පෙනේ.

සාමාන්‍යයෙන් රටක මහජන මූල්‍ය, මූල්‍ය ස්ථාවරත්වයට හා වෙළඳපොළ ක්‍රියාකාරිත්වය පාලනයේදී රාජ්‍ය ව්‍යවසායකයේ බලපෑම හා වැදගත්කම පිළිබඳ නිතර කතා කෙරේ.

පසුගිය ආර්ථික අර්බුදයේදී අර්බුද තත්වයට ඔරොත්තු දීමේදී රාජ්‍ය ව්‍යවසායයේ හැකියාව වැඩි බව පෙනීගොස් තිබේ. උදාහරණයක් ලෙස ආර්ථික අර්බුදය සමයේදී යුරෝපා සංගමය තුළ බලශක්තිය හා දුම්රිය ක්ෂේත්‍රවල රාජ්‍ය ව්‍යවසායයන් ඊට ඔරොත්තු දෙමින් යහපත්ව හා ස්ථාවරව පැවතියේය. රාජ්‍ය ව්‍යවස්ථාව ප්‍රමුඛත්වය දරන යුරෝපා සංගමයේ නව සාමාජික රටවල රාජ්‍ය අංශය ආර්ථික අර්බුදයේදී කොටස් මත ලාභ ලැබීමේදී පුද්ගලික ව්‍යවසායයන්ට සාපේක්ෂව පසුපසින් සිටියද ලාභදායීත්වය අතින් රාජ්‍ය ව්‍යවසාය ඉදිරියට පැමිණ තිබේ.

අපි රටවල් කිහිපයක රාජ්‍ය ව්‍යවසායයන්ගේ තත්වය කෙටියෙන් සලකා බලමු.

## බ්‍රිතාන්‍යය

1980 සහ 1990 දශකයන්හිදී ක්‍රියාත්මක කළ පෞද්ගලීකරණ ක්‍රියාදාමයෙන් පසු බ්‍රිතාන්‍යය තුළ රජයේ හිමිකාරිත්වය සැලකිය යුතු ප්‍රමාණයකින් සීමාවී තිබේ. එසේ වුවද රජය පුද්ගලීකරණය කරන ලද ව්‍යවසායයන් නියාමනයට මැදිහත් වේ. බ්‍රිතාන්‍යයේ ජාතික සෞඛ්‍ය සේවයත්, බ්‍රිතාන්‍ය ගුවන් විදුලි සේවයත් දුම්රිය ප්‍රවාහන ක්ෂේත්‍රයේ සමාගම් කිහිපයකුත් මුළුමනින්ම රාජ්‍ය ව්‍යවසායන් ලෙස පවතී. බලශක්ති ක්ෂේත්‍රය සම්පූර්ණයෙන්ම පෞද්ගලීකරණ කර තිබේ. කොටස් හිමියන්ගේ විධායකය (SHAREHOLDER EXECUTIVE- ShEX) එක්සත් රාජධානියේ මූල්‍ය ආයෝජන ආයතනය (UK FINANCIAL INVESTMENT- UKFI) යන ව්‍යුහයන් දෙක මගින් මහජන කොටස් හිමි ව්‍යවසායයන් රජය විසින් නියාමනය කරනු ලබයි. ඒ අනුව පළමුව සඳහන් කළ ආයතනය විසින් මුළුමනින්ම රජය සතු හෝ කිසියම් රාජ්‍ය හිමිකාරිත්වයක් සහිත

සමාගම් 23ක් නියාමනය කරනු ලබයි. එකී සමාගම් 23 සංවර්ධනය, මාධ්‍ය, මහජන වාර්තා, මූල්‍ය සැලසුම්, න්‍යෂ්ටික හා ගුවන් මාර්ග පාලනයට ආදී විසිරුණු ක්ෂේත්‍ර ගණනාවකට අයත් වේ. ආර්ථික අර්බුදය සමයේදී රජය විසින් බේරාග නු ලැබූ බැංකු නියාමනය කරනු ලබන්නේ UKFI ආයතනය මගිනි.

1970 වසරේ ඇතිවූ දිග්ගැසුණු ආර්ථික අර්බුදය බ්‍රිතාන්‍ය රාජ්‍ය ව්‍යසායයන් පෞද්ගලීකරණය වෙත ගෙන ගියේය. එරට රාජ්‍ය ව්‍යවසායයේ බහුතර ප්‍රමාණයක් පෞද්ගලීකරණය කරනු ලබන්නේ 1979 වසරත් 1997 වසරත් අතර කාලයේදී, කොන්සර්වේටිව් පක්ෂ පාලනයන් විසිනි. එහි ප්‍රතිඵලයක් වශයෙන් එකතු කළ අගය මත රාජ්‍ය ව්‍යවසායේ කොටස 1979 වසරේදී 10.9% සිට 1990 වසරේදී 4% දක්වාත් 1997 වසර වන විට 2.2% දක්වාත් පහත වැටුණි. රාජ්‍ය



**ස්වීඩනය තුළ රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය ආරම්භ වන්නේ 1980 වසරේ සිටය. පළමුව පෞද්ගලීකරණය කරන්නේ රාජ්‍ය ඒකාධිකාරය යටතේ පැවති ප්‍රවාහන හා විදුලි බල ක්ෂේත්‍රයේය. ඉන්පසු 1992 දී පුද්ගලීකරණ පනත හඳුන්වාදුන් අතර රාජ්‍ය ව්‍යවසායන් 34ක් පෞද්ගලීකරණය කරන ලදී.**

අංශයේ සිටි මිලියනයක පමණ පිරිසක් පෞද්ගලික අංශයට වැටුණි. පෞද්ගලීකරණය එතනින් නැවතුණේ නැත. උදාරණයක් ලෙස 2015 වසරේදී බ්‍රිතාන්‍ය රාජකීය තැපැල් සේවයේ 30%ක රාජ්‍ය කොටස් හිමිකාරිත්වයෙන් අඩක් විකුණා දමනු ලැබීය.

එසේ වුවද උපාය මාර්ගික වශයෙන් වැදගත් ඇතැම් ක්ෂේත්‍රවල සතුරු විදේශ මැදිහත්වීම් වැළැක්වීම සඳහා එවැනි ව්‍යවසායකයන්ගේ කොටස්වලින් 51%ක් රජය සතුව තබාගැනීමේ ප්‍රතිපත්තියක් බ්‍රිතාන්‍ය විසින් පවත්වාගෙන යයි. එසේම මහජන සේවාවන් යහපත් අන්දමින් පවත්වාගෙන යාම සඳහා පෞද්ගලීකරණය කරන ලද ඇතැම් සමාගම් රජය මගින් නියාමනය කිරීම සිදුකරනු ලබයි. ඒ අනුව දුම්රිය, ස්වභාවික වායු හා බලශක්තිය, විදුලි සංදේශ, ජල සැපයුම්, බැංකු යන ක්ෂේත්‍රවල කටයුතු නියාමනය කෙරෙයි. ඒ සඳහා අරමුදල් සම්පාදනය කරනු ලබන්නේ ජනතා බදු මුදලින් නොව එකී ක්ෂේත්‍රවල උපයන මුදලිනි.

## ස්වීඩනය

ස්වීඩනයේ මධ්‍යම ආණ්ඩුව සතු රාජ්‍ය ව්‍යවසායයන්ගේ වටිනාකම එරට දළ ජාතික නිෂ්පාදනයෙන් 12%ක් පමණ වේ. ස්වීඩනය තුළ මුළුමනින්ම හෝ කොටස් වශයෙන් හෝ රාජ්‍ය හිමිකාරිත්වය සහිත ව්‍යවසායයන් 49ක් පවතී. ඉන් දෙකක් කොටස් වෙළඳපොළට විවෘත කර ඇත. මෙම ව්‍යවසායයන් තුළ පුද්ගලයෝ 163,000ක් පමණ (එනම් සමස්ත රැකියාවලින් 3.5%ක්) රැකියාවේ නියුක්ත වෙති. ස්වීඩනයේ වැඩිම රාජ්‍ය ව්‍යවසායන් ඇත්තේ කාර්මික/බලශක්ති හා විදුලි සංදේශ ක්ෂේත්‍රවලය. කාර්මික හා බලශක්ති ක්ෂේත්‍රයේ වටිනාකම්වලින් 32%ක්ද විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වටිනාකම්වලින් 18%ක්ද සේවා ක්ෂේත්‍රයේ වටිනාකම්වලින් 17%ක්ද දේපළ ක්ෂේත්‍රයේ වටිනාකම්වලින් 12%ක්ද මූල්‍ය ක්ෂේත්‍රයේ වටිනාකම්වලින් 10%ක්ද රාජ්‍ය ව්‍යවසායට අයත්ය.

මීට අමතරව ස්වීඩනයේ පළාත් ආණ්ඩු පළාත් පාලන ආයතන හිමිකාරිත්වය සහිත ව්‍යවසායයන්ද පවතී. 2014 වසරේදී ප්‍රාදේශීය පළාත් පාලන ආයතන හිමිකාරිත්වය ඇති ව්‍යවසායයන් 119ක් පැවතුණි. ඒවායේ රැකියා නියුක්තිය 22,000ක් පමණ වූ අතර ඉන් 80%ක්ම අයත් වූයේ අධ්‍යාපන හා සෞඛ්‍ය සේවාවලටය. නගර සභා හිමිකාරිත්වය සහිත ව්‍යවසායයන් 1750ක් පමණ පැවති අතර ඒවායේ රැකියා නියුක්තිය 48,000ක් පමණ විය. මෙම ව්‍යවසායයන් බොහොමයක්ම නගර සභාවලට අයත් නිවාස දේපළ හා ඉඩකඩම් ක්ෂේත්‍රයේ සමාගම්ය.

ස්වීඩනය තුළ රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය ආරම්භ වන්නේ 1980 වසරේ සිටය. පළමුව පෞද්ගලීකරණය කරන්නේ රාජ්‍ය ඒකාධිකාරය යටතේ පැවති ප්‍රවාහන හා විදුලි බල ක්ෂේත්‍රයේය. ඉන්පසු 1992 දී පෞද්ගලීකරණ පනත හඳුන්වාදුන් අතර රාජ්‍ය ව්‍යවසායන් 34ක් පෞද්ගලීකරණය කරන ලදී. ස්වීඩනයේ තැපැල් සේවාව පෞද්ගලීකරණය කරන්නේ 1990දීය. 1992 දී ගුවන් සේවයද, 1996 දී දුම්රිය භාණ්ඩ ප්‍රවාහනයද පෞද්ගලීකරණය කරන ලදී.

1853 වසරේ සිට 1993 වසර දක්වා රාජ්‍ය සමාගමක් ලෙස සේවාව සැපයූ ස්වීඩනයේ රාජ්‍ය විදුලි සංදේශ සමාගම වූ TELEVERET සමාගමේ කොටස්වලින් 30%ක් 2000 වසර වෙද්දී ස්ටොක්හෝල්ම් කොටස් වෙළඳපළේදී අලෙවි කරන ලදී. විදුලි සංදේශ සේවාව පෞද්ගලීකරණය කළ යුරෝපයේ පළමු රට ස්වීඩනයයි. පසුව ස්වීඩන් හා පින්ලන්ත විදුලි සංදේශ සේවාවන් ඒකාබද්ධ කර TELIA SONERA නම් සමාගම ගොඩනගන ලදී. 2002 වසර වන විට එකී සමාගමේ විශාලතම කොටස් හිමිකරුවන් වූයේ ස්වීඩන් හා ෆින්ලන්ත ආණ්ඩුය.

මේ අනුව පෙනී යන්නේ, සංවර්ධිත රටවල (OECD) පවා පෞද්ගලික ව්‍යවසායනුත් රාජ්‍ය ව්‍යවසායනුත් එකවිට පවතින බවය. සංවර්ධිත ධනේශ්වර රටවල පවා රාජ්‍ය ව්‍යවසායන්ටත් පෞද්ගලික ව්‍යවසායන්ටත් එකිනෙකට වෙනස් හා ඒ එක් එක් අංශයට අනුරූපී කාර්යභාරයක් පවතින බවය.

## ධනවාදයේ ගමන් මඟ තුළ ප්‍රශ්නය තේරුම් ගැනීම

ආර්ථික අර්බුදය හමුවේ සාකච්ඡාවට බඳුන්වී ඇත්තේ රාජ්‍ය ව්‍යවසායන්ට එරෙහිව පෞද්ගලික ව්‍යවසායයන් යන කරුණය. අර්බුදයට පිළියම රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය යන්නය. එහෙත් ඉන් සිදුවන්නේ අර්බුදයේ සැබෑ හේතුව සැඟවී යාමය; අර්බුදය තවත් තීව්‍ර වීමය.

ධනවාදයේ ගමන්මඟ තුළ නිදහස් ධනවාදය ඒකාධිකාරී ධනවාදය බවට පත්වන අතර පළමුවන ලෝක යුද්ධයෙන් පසු එයට රාජ්‍ය ඒකාධිකාරී ධනවාදය බවට පත්වීම ආරම්භ කරනු පෙනේ.

**"ප්‍රාග්ධන සංකේන්ද්‍රණය හා ජාත්‍යන්තරකරණය දැවැන්ත පිම් පනිමින් තිබේ. ඒකාධිකාරී ධනවාදය රාජ්‍ය ඒකාධිකාරී ධනවාදය බවට සංවර්ධනය වෙමින් තිබේ. රටවල් ගණනාවකම නිෂ්පාදනය හා බෙදා හැරීම සමාජය විසින් නියාමනය කිරීම බලහත්කාරයෙන් හඳුන්වාදෙනු ලැබේ."**

**(ලෙනින් රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂය (බොල්ෂෙවික්) හත්වන (1917 අප්‍රේල්) රුසියානු සම්මේලනය එකතු කළ කෘති, වෙළුම 24, පිටුව 305)**

මෙම තත්වය දෙවන ලෝක යුද්ධයට පසු තවත් වේගවත් විය. දෙවන ලෝක යුද්ධයෙන් පසු බිහිවූ සමාජවාදී රාජ්‍ය පද්ධතියේ බලපෑමත්, ධනේශ්වර අර්බුදය විසින් කේන්සියානු රාජ්‍ය සුභසාධනවාදී ආර්ථික ප්‍රතිපත්තියට මඟ විවර විය.

ඒ තුළ ධනපති රටවල ව්‍යවසායන්ගේ රාජ්‍ය කොටස ඉහළ නැංගේය. උදාහරණයක් ලෙස අධිරාජ්‍යවාදී රටවල ජාතික ධනයෙන් 15-25ක් දක්වා ප්‍රතිශතයක් රජය සතුවිය. බ්‍රිතාන්‍යයේ ගල් අඟුරු කර්මාන්තය, දුම්රිය, ස්වාභාවික වායු කර්මාන්තය, විදුලි බල උත්පාදනය මුළුමනින්ම රජයේ අයිතියට පත්විය. කාර්මික හා කාර්යාල සේවකයින්ගේ 20%ක් පමණ රාජ්‍ය ව්‍යවසාය තුළට අයත් වූයේය. එහෙත් 1970 දශකයට එළඹීමේදී රාජ්‍ය ඒකාධිකාරී මොඩලයද අර්බුදයට පත්විය. එය ප්‍රකාශයට පත්වන්නේ 1973දී ලෝක ආර්ථික අර්බුදය ලෙසය. ඉන්පසු ධනේශ්වර ආර්ථික විද්‍යාඥයෝ එක්වරම නව ලිබරල්වාදයට පිවිසි අතර රාජ්‍ය ව්‍යවසායට එදිරිව පෞද්ගලික ව්‍යවසායේ ගුණ වනන්නට වූහ. අප ඉහතින් සඳහන් කළ රටවල්වල උදාහරණයේදී එම රටවල පෞද්ගලීකරණ ක්‍රියාවලිය ඇරඹී ඇත්තේ ඊට සමාන්තරව බව පෙනේ. 1991 වසරේදී සෝවියට් දේශය ප්‍රමුඛ සමාජවාදී කඳවුර බිඳවැටීමෙන් පසු නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තිය ලෝකය පුරා නව ආකාරයකින් ක්‍රියාත්මක වන්නට විය. 2008 භාගයේ හටගත් ලෝක ආර්ථික අර්බුදය විසින් නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තියේ අසාර්ථකත්වයද ඔප්පු කර පෙන්වන ලදී.

ගැටලුව ඇත්තේ පෞද්ගලික ව්‍යවසාය තුළවත්, රාජ්‍ය ව්‍යවසාය තුළවත් නොව ධනේශ්වර ආර්ථික ක්‍රමය තුළය. මෙම අර්බුදය හුදෙක් පෞද්ගලික අංශයේ හෝ රාජ්‍ය අංශයේ සමානුපාතය විසින් පැන නංවන්නක් නොවේ. එය ධනේශ්වර ක්‍රමය තුළ ඇති අභ්‍යන්තරික පරස්පරතාවන් විසින් පැන නංවන්නක් මිස පෞද්ගලික ව්‍යවසායට එරෙහිව රාජ්‍ය ව්‍යවසායේ ගැටුමක් ලෙස තේරුම් ගැනීම නිවැරදි නොවේ.



# සමාජවාදී ආර්ථිකය හා පෞද්ගලීකරණය

*නිහාල් වීරසූරිය*

මේ දිනවල, ලංකාවේ පෞද්ගලීකරණ සංවාදය යළිත් දේශපාලන කරළියට පැමිණ තිබේ. ඒ ලංකාව මුහුණ දී ඇති බිහිසුණු ආර්ථික අර්බුදය හමුවේ ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පිහිට පැතීමත්, පාඩු ලබන රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය කිරීමට ඉන් ලැබුණු උපදෙසුත් සමගය. පෞද්ගලීකරණය පිළිබඳ බොහෝ දේ මෙහි මුල් ලිපි මඟින් දැනටමත් කතා කර තිබේ. කෙසේ වෙතත් මෙම ලිපිය පෙළගස්වා ගැනීමේ පහසුව සඳහා ඒ ගැන කෙටියෙන් හෝ යළි සාකච්ඡා කිරීම අවශ්‍යතාවයක් ලෙස පෙනේ.

### පෞද්ගලීකරණයක් ඇයි?

ධනවාදය යනු පෞද්ගලික දේපළ මත පදනම් වූ සමාජ ක්‍රමයකි. එහි දේපළ හෙවත් නිෂ්පාදන මාර්ග හා සේවා බිහිවන්නේම පෞද්ගලික දේ හැටියටය. එසේ නම් යළි පෞද්ගලීකරණය කිරීමක් ගැන කතා වෙන්නේ ඇයි? ධනවාදයේ ආරම්භක යුගයේ නිදහස් ධනවාදය හෙවත් රාජ්‍ය නිර්බාධිත ධනවාදය' තුළදී රජයට නිෂ්පාදන මාර්ග හෝ සේවා අයිති වූයේ නැත. එහෙත් පසුව ධනවාදය අධිරාජ්‍යවාදයට ගොස් ඒකාධිකාරී ධනවාදය නිර්මාණය වීමත්, අනෙක් අතින් 20 සියවස ආරම්භයේ සිට ලොව සමාජවාදී රාජ්‍ය පද්ධතියක් බිහිවීම හා එහි බලපෑමත් නිසා දියුණු ධනපති රටවල් සමහර සේවා හා නිෂ්පාදන මාර්ග රජයේ සෘජු හෝ වක්‍ර පාලනය තුළ පවත්වාගෙන යනු දැකිය හැකි විය. ඒ අතර පසුගාමී ධනේශ්වර සංවර්ධනයක් සහිත රටවල්, විශේෂයෙන්ම යටත්විජිතභාවයේ

සිට ඉන් නිදහස ලැබූ ධනවාදී රටවල් සමාජවාදී කඳවුරේ උදව්ද ලබමින් බොහෝ සේවා හා නිෂ්පාදන මාර්ග රජයේ පාලනය තුළ පවත්වාගෙන යන ලදී. ජනසතු කිරීම් ලෙස මේවා හැඳින්විණි. රට තුළ විශාල ප්‍රාග්ධන හිමියන් නොවීමත්, විවිධ දේශපාලන ප්‍රතිවිරෝධතාත් මෙයට අමතර හේතු සැපයීය. ලංකාවේ 56 හා 70-77 පාලන කාල තුළ මෙම ජනසතු කිරීම් දැකිය හැකි විය. ඇතැමුන් මේවා 'සමාජවාදී' පියවර ලෙස වැරදියට අර්ථකථනය කළද එය සැබැවින්ම එසේ නොවීය.

## රාජ්‍ය ඒකාධිකාරී ධනවාදය

ධනේශ්වර සමාජ ක්‍රමයක් තුළ එම රට මුහුණ දෙන සංවර්ධනයේ මට්ටමේ බලපෑම නිසාත් විවිධ දේශපාලන ප්‍රතිවිරෝධතා හා ජාත්‍යන්තර දේශපාලනයේ බලපෑම් නිසාත් මෙලෙස දේපළවල අයිතිය රජය සතුව තබා ගැනීම හෙවත් රජය නිෂ්පාදන මාර්ග හා සේවාවල අයිතිය තබාගැනීම හැඳින්වූයේ රාජ්‍ය ඒකාධිකාරී ධනවාදය ලෙසය. එක් එක් යුගයක ධනවාදය පවත්වාගෙන යාම වෙනුවෙන්ම කළ දෙයකි. එහෙත් එම ක්‍රමයත් ලොව දියුණු ධනපති රටවල්ද පවත්වාගෙන ගිය සුබසාධනවාදී ආර්ථික මොඩලයත් ඉක්මණින්ම අර්බුදයට ගිය අතර, ඒ වෙනුවට ගෝලීයකරණය සංකල්පය තුළ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය කරළිගත විය. පෞද්ගලීකරණය ආරම්භ වන්නේ ඒ සමගය. එනම් එතෙක් ධනේශ්වර රාජ්‍යය සතුව පවත්වාගෙන ආ නිෂ්පාදන මාර්ග හා සේවා මුළුමනින්ම හෝ කොටස් වශයෙන් හෝ අර්ධ වශයෙන් පෞද්ගලික අංශයට ලබාදීමය. මෙහිදී දේශීය මෙන්ම විදේශීය සමාගම් වෙත මෙම 'රාජ්‍ය දේපළ' ලබාදෙන ලදී. දැන් මේ උත්සාහ කරන්නේද එසේ ලබාදී අවසානයට ඉතිරි වූ රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය කිරීමටය.

## ජාතික ආරක්ෂාවේ ඇසින්

ධනවාදී හෝ සමාජවාදී රාජ්‍යයකදී සියලුම නිෂ්පාදන මාර්ග හෝ සේවා රජය විසින්ම පවත්වාගෙන යා යුතු යැයි කිසිවෙකුට තර්ක කළ නොහැක. ඒ අතර ආර්ථිකයේ සමහර නිෂ්පාදන මාර්ග පෞද්ගලික අංශය සතුව එහෙත් රජයේ නියාමනයක්ද සහිතව පැවතීම පොදුවේ ගත් කළ ගැටලුවක් නොවේ. එහෙත් යම් රටක ආර්ථික ස්වෛරීත්වයට හා ජාතික ආරක්ෂාවට අදාළ නිෂ්පාදන මාර්ග හෝ සේවා 'පාඩු ලබන' ලේබලය යටතේ විකුණා දමා රාජ්‍ය මැදිහත්වීම අත්හැරීම මාරාන්තික වරදක් වේ.

විශේෂයෙන් ලංකාව වැනි රටකදී බලශක්ති ක්ෂේත්‍ර මෙසේ රාජ්‍ය අයිතිය අත්හැරීම යනු යළි නිවැරදි කළ නොහැකි බරපතළ වරදක් වේ. මන්ද ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රයේ අයිතිය වෙනත් රටක සමාගම්වල පාලනයට ගිය තත්වයක් තුළ රටේ පවතින ඕනෑම ආණ්ඩුවක් තමන් ඉදිරියේ දණ ගැසීමට ආණ්ඩු පෙරළීමට එකී සමාගම්වලට හැකියාව ලැබෙන නිසාය. අනෙක් අතට ලාභය මත නොව රටක පුරවැසියාගේ පොදු පැවැත්මට අදාළ වන අධ්‍යාපන, සෞඛ්‍ය වැනි ඉතා වටිනා සේවාවල රාජ්‍ය මැදිහත්වීම හා රාජ්‍ය නියාමනය පැවැතිය යුතු අතර එය මුළුමනින්ම අත්හැරීමද හානිකරය.

## සමාජවාදී ආර්ථිකයේ දෘෂ්ටියෙන්

ධනවාදය තුළ සිදුකරන, ධනවාදී පාලනයේ හා ආර්ථිකයේ අසමත්කම නිසා සිදුකරන මෙම හානිකර පෞද්ගලීකරණයට වමේ අර්ථයෙන් විරුද්ධ වන විට ධනේශ්වර ප්‍රතිගාමී මතවාද දරන්නේ එය සමාජවාදය සමග පටලවා සමාජවාදය පිළිබඳ වැරදි විකෘති චිත්‍රයක් නිර්මාණය කිරීමටත්, එමගින් රටේ සමාජ පරිවර්තනයට දායක කරගත යුතු සමහර බලවේග බිය වැද්දීමටත් උත්සාහ කරති.

මේ වන විට අපේ රටේ ධනේශ්වර ආර්ථික ක්‍රමය මියගොස් තිබේ. එයට නැවත පණ දිය නොහැක. රනිල් - රාජපක්ෂ පාලනය මේ උත්සාහ කරන්නේ එම ආර්ථිකයට පණ දීමට නොව 'මළකඳ' කල්තබා ගැනීමට ක්‍රම සෙවීමටය. එසේම මියගිය ආර්ථිකයේ වටිනා ශරීර කොටස් විකුණා ගැනීමය. ධනවාදී ආර්ථික මළකුණ සඟවා, එයට සුවඳ ගල්වා එහි දුගඳ වැළැක්වීමට උත්සාහ කරන අතරම ධනපති ක්‍රමයේ ආරක්ෂකයෝ සමාජවාදය පිළිබඳ ජනතාව බියවැද්දීමටද උත්සාහ කරති. වමේ ව්‍යාපාරයන් ධනේශ්වර පෞද්ගලීකරණයේ සමහර තීරණවලට දක්වන විරෝධය වැරදියට අර්ථකථනය කර ජනතාව මුළා කිරීමට ඔවුහු උත්සාහ දරති. සමාජවාදය තුළ ආර්ථිකය පවතින ආකාරයත් පෞද්ගලීකරණය හා පෞද්ගලික දේපළ පිළිබඳ සමාජවාදී දැක්මේ සත්‍ය තත්වයත් අප පැහැදිලි කර ගත යුත්තේ මේ නිසාය.

## සමාජවාදය පිළිබඳ මිථ්‍යා මත

න්‍යායිකව හා ප්‍රායෝගික යන දෙඅංශයෙන්ම ගත් විට සමාජවාදය යනු නිශ්චිත සමාජ ක්‍රමයක් නොව පරිවර්තනීය අවධියක් වේ. එනම් ධනවාදී ක්‍රමයේ සිට වඩාත් දියුණු වඩාත් මානවවාදී, වඩාත් සාධාරණ කොමියුනිස්ට්වාදී රටාවක් වෙත ගමන් කරන සංක්‍රමණීය කාලය වේ. ඒ නිසාම සමාජවාදය තුළ පවතින දේපළ ආකාරවල ස්වභාවය තීරණය වන්නේ සමාජ

පරිවර්තනයකට ලක්වන යම් නිශ්චිත රටක් එකී මොහොතේ ධනවාදී සංවර්ධනය අත්පත් කරගෙන සිටි මට්ටමට අනුවය.

එහෙත් ධනේශ්වර මත දක්වන්නන් හා පාලකයන් විසින් සැලසුම් සහගතවත්, තවත් සමහරු කරුණු හරිහැටි නොදන්න නිසාත් සමාජවාදය පිළිබඳ අසුබවාදී චිත්‍රයක් සමාජගත කරමින් සිටිති. 'සමාජවාදය පරණය, එය යල්පැන ගිය පැරණි ක්‍රමයකි! එහි සියල්ල රජයට පවරා ගනී! ඒ තුළ මිනිස් නිදහස නැත. සියල්ල රජය විසින් තීරණය කරනු ලබයි!' වැනි වැරදි මත රැසක් ඒ අතර වේ. සමාජවාදයට එරෙහි නඟන මේ චෝදනා සියල්ල සැබෑ ලෙසම සිදුකරන්නේ ධනවාදය තුළය. යල් පැන ගිය පැවති ක්‍රමය වන්නේ දැනට අවුරුදු 500ක් පමණ පැරණි ධනවාදයමය. සැබෑ මානව නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය ජීවත්වීමේ අයිතිය, නිර්මාණශීලීත්වය අහෝසි කර ඇත්තේද ඒ තුළය. පෞද්ගලික දේපළවල අයිතියේ නාමයෙන් ජාවාරම් සිදුකරන්නේ, මහජන ධනය හොරකම් කරන්නේ, වංචා කරන්නේ ඒ තුළය. එසේ නැතිව සමාජවාදය තුළ නොවේ.

එහෙත් ලොව සමහර රටවල් සමාජවාදය ගොඩනැඟීමේදී අත්විඳ බලන ලද විවිධ විධික්‍රමවල සමහර අඩුපාඩුද සමාජවාදී ආර්ථිකයට එරෙහිව මෙම මතය ගොඩනැගීමට උපයෝගී කර ගන්නා බවද අප අමතක කළ යුතු නැත.

## සමාජවාදයේ දේපළ

සමාජවාදී පරිවර්තන අවදියකදී රටක් තුළ පවතින ප්‍රධාන දේපළ ආකාර 03ක් තිබේ. ඒවා නම් රාජ්‍ය දේපළ (සමාජවාදී රාජ්‍ය විසින් පාලනය කරන දේපළ) සාමූහික දේපළ හා පෞද්ගලික දේපළය. මෙම දේපළ වර්ග තුනේ ප්‍රමිතියක් හෝ ප්‍රමාණයක් තීරණය වන්නේ අදාළ රටේ ඒ වන විට පැවති ආර්ථික සංවර්ධනයේ මට්ටමට අනුවය. කිසියම් රටක් පවතින්නේ ධනේශ්වර සංවර්ධනයේ පසුපසින් නම් එම රටේ ආර්ථියේ සුළු පරිමාණ නිෂ්පාදනය විශාල පංගුවක් නම් එවිට එහි සුළු පරිමාණ හා මධ්‍යම පරිමාණ නිෂ්පාදනයන්ගේ පංගුව විශාල වන අතර ඒවායේ සාතිශය බහුතරය පෞද්ගලික දේපළ වේ.

සැබවින්ම සමාජවාදය තුළදීද රජයේ පාලනය යටතේ පැවතීම අනිවාර්යයෙන් විය යුත්තේ බලශක්ති ක්ෂේත්‍රය, අධ්‍යාපනය, සෞඛ්‍යය වැනි වැදගත්ම නිෂ්පාදන හා සේවාවන්ය. ඒවා තුළද රාජ්‍ය සැලසුමට අනුව, රජයේ නිරීක්ෂණය තුළ පවතින පෞද්ගලික ව්‍යවසායයන් යම් ප්‍රමාණයක් පැවතිය හැකිය. එහෙත් ඒවායේ ප්‍රධාන මෙහෙයවීම රජය විසින් දැරීම අත්‍යවශ්‍ය වේ.

ඒ අතර සමහර ක්ෂේත්‍ර රාජ්‍ය හෝ පෞද්ගලික අංශ දෙක විසින්ම



පොදු ආර්ථික සැලසුමක් තුළ පවත්වාගෙන යනු ඇත. ආර්ථිකයේ නිෂ්පාදන ක්ෂේත්‍රය වර්ධනය කර ගැනීම සඳහා පෞද්ගලික අංශය රාජ්‍ය සැලසුම තුළ දායක කර ගැනීමද සිදුවේ.

ඒ අනුව සමාජවාදය යනු පෞද්ගලික අංශයකින් තොර සෑම දෙයම රජයට පවරා ගත්, රජය විසින් පමණක්ම මෙහෙය වන්නක් නොවේ. ඒ නිසා ධනවාදී පාලනය තුළ සිදු කරන, රටට හානිකර පෞද්ගලීකරණයන්ට එරෙහි වීම යනු පොදුවේ ආර්ථිකය තුළ පෞද්ගලික අංශයක දායකත්වය ප්‍රතික්ෂේප කිරීමක් ලෙස වරදවා වටහා ගත යුතු නැත.

## ලෝක අත්දැකීම්

සමාජවාදී රටවල් ලෙස ලොව සලකන රටවල්වල ආර්ථිකය දෙස බැලීමෙන්ද මෙය තේරුම් ගත හැක. චීනය හා වියට්නාමය තම රටවල රාජ්‍ය මඟපෙන්වීම යටතේ පෞද්ගලික ව්‍යාපාර හා බහුජාතික සමාගම් පවා පවත්වාගෙන යමින් සිටී. (මෙම රටවල විවිධ දුර්වලතා තිබෙන බවද සත්‍යයකි) ලෝක තත්වයන්ට අනුවත් තම රටේ සංවර්ධනයේ මට්ටමට අනුවත් ඔවුන් විසින් තමන්ට ආවේණික ආර්ථික ක්‍රම පවත්වාගෙන යනු ලබන අතර, ඒ තුළ විශාල පෞද්ගලික අංශයක්ද සිටී.

එහි පවතින පෞද්ගලික අංශයට විශාල වාසියක් හා රැකවරණයක්ද තිබේ. ඒ, එක් අතකින් රජය එම ව්‍යාපාරවලට උදව් කිරීමය. අනෙක් අතින් ලංකාවේ මෙන් ව්‍යාපාරිකයින්ගෙන් කප්පම්, කොමිස් මුදල් නොඉල්ලීමය. එවිට පෞද්ලික ව්‍යාපාරිකයන්ට හා නිෂ්පාදකයන්ටද වගකීමක් සහිතව අනවශ්‍ය කරදරවලින් තොරව තම කාර්යය කිරීමේ හැකියාව ලැබේ.

1917 විප්ලවයෙන් පසු 1919 දී ලෙනින් විසින් 'නව ආර්ථික ප්‍රතිපත්තිය' (NEP) හඳුන්වා දෙමින් නොදියුණු රුසියාවේ නිෂ්පාදන මාර්ගවල සංවර්ධනය වේගවත් කිරීමේ අරමුණින් පෞද්ගලික අංශයටද සමාජවාදී රජය තුළ ආර්ථිකයට දායකවීමේ ඉඩදෙන ලදී. එමෙන්ම මීට වසර කිහිපයකට පෙර කියුබාවේද සමහර ආර්ථික හා නිෂ්පාදන ක්ෂේත්‍ර තුළ පෞද්ගලික අංශයේ දායකත්වය පුළුල් කළේය.

මේ සියල්ලෙන් කියැවෙන්නේ සමාජවාදය තුළ එම රටේ සංවර්ධනයේ මට්ටම හා ඓතිහාසික තත්වයන්ට යටත්ව වුවද පෞද්ගලික අංශයක් පවත්වාගෙන යන බවත් පෞද්ගලික නිෂ්පාදන මාර්ග මුළුමනින්ම අහෝසි නොකරන බවත්ය. රටට ආර්ථිකයට හිතැති, මිතුරු පෞද්ගලික අංශයක් බොහෝ ක්ෂේත්‍රවල පැවතීම සමාජවාදයේදී දැකිය හැකි වීමය.

අවසන් වශයෙන් කිව යුත්තේ, ලංකාව වැනි රටවල ධනවාදී පාලනය තුළ ආර්ථිකය විනාශ කර දමා අවසාන මොහොතේ අනිවාර්යයෙන්ම රටත් රාජ්‍යයත් සතුව පැවතිය යුතු එම රටේ ආරක්ෂාවට, ස්වෛරීත්වයට බලපාන රාජ්‍ය දේපළ විකුණා දැමීම විශාල වරදක් වන අතර වම ඊට විරුද්ධවීම සමාජවාදයේ ආර්ථික වැඩපිළිවෙළ සමග පටලවා නොගත යුතු බවය.





# අතීත සමාජ සංවිධාන තුළ පෞද්ගලික අයිතිය

**සුජීව දිසානායක**

ඈත අතීතයේ පටන් මහ පොළවත් ජලයත් පාලකයාට අයත්ය යන්න පිළිගත් සම්ප්‍රදාය වූ බව පෙනේ. ඒ නිසා ඒවායෙන් රට පාලනය කළ පාලකයෝ බදු අය කළ බව හඳුනාගත හැකිය. ඉතිහාසය දෙස බලන විට එලෙස බදු අය කිරීමේදී ශ්‍රී ලාංකේය බදු ප්‍රතිපත්තිය සකස් වීමේදී ඉන්දියාවේ කෞටිල්‍යය හෙවත් චානක්‍ය විසින් රචනා කරන ලද අර්ථ ශාස්ත්‍රයේ නියමයන් භාවිතා කළ බව කිව හැකිය. මෙරට ඉතිහාසයේ රජය විසින් අය කළ ප්‍රධාන බද්දක් ලෙස ජල බද්ද හඳුන්වා දීමට පුළුවන. රජයට අයත් වැවක හෝ ඇළක ජලය භාවිතා කළේ නම් බද්දක් අය කර ඇත. එය අස්වැන්නෙන් හෝ මුදලින් අය කළ අතර තුනෙන් එකේ සිට පහෙන් එක දක්වා ප්‍රමාණයක් එලෙස බදු ලෙස අය කර ගනු ලැබ තිබේ. දකපති, උදකපති, දකභාග, උදකභාග, දකබක හා උදකබක යනුවෙන් අභිලේඛනයන්ගේ හඳුන්වා ඇත්තේ එම බද්දයි. මජිබක, මජිබකපති, මතෙර මජිබකපති හා මත්ස්‍යය භාග යනුවෙන් හඳුන්වා ඇත්තේ මසුන් වෙනුවෙන් අය කරන ලද බද්දක් බව කියවේ. ඇතැම් විට මෙය ඇළ මාර්ගවලින් අය කරන ලද බද්දක් ලෙසද හැඳින්වේ. රජයට අයත් මහපොළොව යම් ආර්ථික කටයුත්තක් වෙනුවෙන් අය කළේ නම් ඒ වෙනුවෙන්

රජයට ගෙවන ලද බද්ද වූයේ බොජකපති යන්නයි. බොජියපති යන නාමයද එය හැඳින්වීමට යොදා ඇත.

වෙළඳ කටයුතුවලදීද මෙරට පාලකයන් බදු අය කළ බවට තොරතුරු ඇත. රට අභ්‍යන්තර වෙළඳාමේදී සුත්වත් නමින් බද්දක් අය කළ අතර එය අය කළ ස්ථානය මඩිගය නමින් හඳුන්වා තිබේ. වසභ රජුගේ පාලන කාලයේදී ඇත් වෙළඳාමෙන් හතිපති නමින් බද්දක් අය කළ බවද අභිලේඛන මූලාශ්‍රයන්ගෙන් හඳුනාගත හැකිය. එමෙන්ම විදේශ වෙළඳාමේදී තීරු බදුද රජයේ ප්‍රධාන ආදායම් මාර්ගයක් විය. පළමුවන ගජබාහු නම් පාලකයාට අයත් ගොඩවාය ලිපිය, වරායකින් තීරු බදු අය කළ බව විස්තර කරන්නකි. එලෙස අය කළ බදු ගොඩපවත නම් විහාරයට පූජා කර ඇත.

ශ්‍රී ලාංකේය ඉතිහාසය දෙස බලන විටද මෙරට ඇතැම් අතීත පාලකයන් විවිධ බදු සහන හා විවිධ ඉඩම් ප්‍රධානයන් මගින් භික්ෂූන් වහන්සේලාට මෙන්ම තම හිතවතුන්ට වරප්‍රසාදයන් ලබා දුන් බව පැහැදිලි වේ. ඒ අනුග්‍රහයන් හේතුවෙන් රජයට ලැබිය යුතු වූ ආදායම් මාර්ග යන් ඇහිරී ගිය බව පැහැදිලිය. මෙරට ඉතිහාසයේ ප්‍රථම වරට පෞද්ගලික ආරාම පූජාවක් සිදු කළේ අනුරාධපුර රාජධානියේ මුල්ම අවධියේ බලය දරන ලද වළගම්බා රජු විසින්ය. එයට ප්‍රධාන ලෙසම බලපෑවේ රජු ද්‍රවිඩයන් හා සටන් වැද පරාජයට පත්ව විවිධ දුෂ්කරතා මධ්‍යයේ වනාන්තරගතව සිටියේදී කුපික්කල මහා තිස්ස නම් හිමිනමක් රජුට දක්වන ලද අනුග්‍රහයන්ය. උන් වහන්සේ ගෙනා පිණ්ඩපාතයෙන් රජු ඇතුළු පවුලේ පිරිස වනවගතව සිටියේදී යැපී තිබේ. එවැනි මැදිහත්වීමක් තමන් වෙත සිදු කරන ලද නිසා රජු තමන්ට කළ උපකාරයන්ට කළගුණ සැලකීමක් වශයෙන් ප්‍රථම වරට උන් වහන්සේට වැටකේ පතක ලියා ගම්වරයක් පූජා කර ඇත. මෙය මෙරට ඉතිහාසයේ භික්ෂුවක් උදෙසා කළ පළමු පෞද්ගලික ඉඩම් පූජාව ලෙසද සලකනු ලැබේ.

ද්‍රවිඩයන් හා සටන් වැද ඔවුන් පරාජයට පත් කිරීමෙන් පසු රාජත්වයට දෙවන වර පත් වූ රජු කළ පළමු කටයුත්ත වන්නේ ගිරි නම් නිගණ්ඨාරාමය කඩා බිඳ දමා එම ස්ථානයේ අභයගිරි නමින් විහාරයක් ඉදි කිරීමය. මෙම විහාර සංකීර්ණයට පිරිවෙන් 12ක් අයත් වූ බවද මහාවංශයේ සඳහන් වේ. රජු මෙලෙස ඉදි කළ විහාර සංකීර්ණය තමන්ට සහාය දැක්වූ තෙරුන් වහන්සේලා දෙදෙනා කැඳවා උන්වහන්සේලාගෙන් මහා තිස්ස හිමිට පූජා කරවා තිබේ.

ශ්‍රී ලංකාව සතුව තිබූ සම්පත් විදේශ පාලකයන් තම අධිරාජ්‍යයන්හි අවශ්‍යතා වෙනුවෙන් භාවිතා කළ බවටද මෙරට ඉතිහාසය සාක්ෂි දරයි. ක්‍රි.ව. 992-93 කාලයේදී මෙරට ආක්‍රමණය කරන පළමු රාජරාජ නම් චෝල අධිරාජයා ලංකාවේ ගම් 05ක බදු ආදායම තම අගනගරයේ ඉදි කරන ලද බෘහදීශ්වර නම් දේවාලයේ තෙල් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා රැගෙන ගිය බව කියවේ.

චෝල පාලකයන් මෙරට තුළ අනුගමනය කරන ලද බදු ප්‍රතිපත්තිය අද මෙන්ම ජනයා පීඩාවට පත් කළ බවද ප්‍රකාශ කළ හැකිය. ජනනාථපුරම් සිට චෝලයන් මෙරට පාලනය මෙහෙයවමින් සිටියදී ක්‍රි.ව. 1065දී පමණ ඔවුන්ට එරෙහිව රජරට ප්‍රදේශයේ කැරැල්ලක් හටගෙන තිබේ. ඒ චෝලයන් අනුගමනය කළ බදු ප්‍රතිපත්තියට එරෙහිවය. චෝලයෝ මේ කැරැල්ල මැඩ පැවැත්වීම සඳහා අතිරේක හමුදාවක් ලංකාවට එවා එය මර්දනය කර වූ බව කියවේ.

අද මෙන්ම ඈත අතීතයේදීද මෙරට පාලකයන් තම පැවැත්ම උදෙසා මහජනයාට පරිහරණය කිරීමට තිබූ සම්පත් අවභාවිතා කළ බවද කිව හැකිය. නිශ්ශංකමල්ල

**ශ්‍රී ලංකාව සතුව තිබූ සම්පත් විදේශ පාලකයන් තම අධිරාජ්‍යයන්හි අවශ්‍යතා වෙනුවෙන් භාවිතා කළ බවටද මෙරට ඉතිහාසය සාක්ෂි දරයි. ක්‍රි.ව. 992-93 කාලයේදී මෙරට ආක්‍රමණය කරන පළමු රාජරාජ නම් චෝල අධිරාජයා ලංකාවේ ගම් 05ක බදු ආදායම තම අගනගරයේ ඉදි කරන ලද බෘහදීශ්වර නම් දේවාලයේ තෙල් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා රැගෙන ගිය බව කියවේ.**



රජු එවැනි පාලකයෙකි. මේ කටයුත්තේදී රජු තම පවුලේ සාමාජිකයන් සම්බන්ධ කරගෙන වාර්ෂිකව තුලාභාර දානයන් පිරිනමා ඇත. දොරටියාව සන්නසේ මෙන්ම රුවන්වැලි දාගැබ අසළ ඇති අභිලේඛනවල මේ තුලාභාර දාන පිළිබඳ තොරතුරු සඳහන් වේ. මේ දානයන් සඳහා නිශ්ශංකමල්ල රජතුමා තමාට අමතරව අග මෙහෙසියන් දෙදෙනා වන කාලිංඝ සුභද්‍රාද, කල්‍යාණවතී මහාදේවිය යන්නවුන්ද පුත් වීරබාහු කුමාරයාද සර්වාංග සුන්දරී නම් දියණියද සම්බන්ධ කරගෙන ඇත. මෙවැනි දාන 05ක් රජු වාර්ෂිකව සිදු කර ඇතැයි විශ්වාස කෙරේ. මෙම දානවලදී රාජකීයන්ගේ බරට සමාන වස්තු මහජනයා අතර බෙදා දී ඇත. මෙලෙස ලබාදුන් තුලාභාර දානවලදී බෙදා දුන් බොහෝ දේ රජුගේ පෞද්ගලික ධනය නොව මෙරට අසරණ මහජනයාට භුක්ති විඳීමට තිබූ සම්පත් බව ඉඳුරාම ප්‍රකාශ කළ හැකිය.

එමෙන්ම නිශ්ශංකමල්ල රජු සාමාන්‍ය ජනතාවට වසර 05ක බදු විරාමයක් ලබා දීමටද කටයුතු කර ඇත. ඊට අමතරව කැති අඩ, පිසඹුරුවත හා කටුකනබාය වැනි බදු අවලංගු කිරීමටද මේ රජු ක්‍රියාකර තිබේ. විශිෂ්ට ශිල්ප දැක්වූවන්ට ගම්වර ප්‍රදානය කිරීමටද මොහු කටයුතු කළ බව ඔහු විසින් නිකුත් කරන ලද දොරටියාව සන්නස තුළින් තහවුරු වේ. එම කටයුත්තේදී 'විජය ශ්‍රී මහපාය' නම් ගොඩනැගිල්ල ඉදි කරන ලද ලෝකේනාවන් නැමති ශිල්පියාට ගම්වරයක් ලබා දීමට රජු කටයුතු කර ඇත. එමෙන්ම පාණ්ඩ්‍ය දේශය සමග සබඳතා පැවැත්වීමට උදව් වූ පුද්ගලයාට අල්ලෙයි සන්නසින් ගම්වරයක් පිරි නැමීමටද රජු කටයුතු කර ඇත. මෙවැනි ක්‍රියාකරකම්වල රජු නිරත වූයේ සිය පෞද්ගලික ප්‍රතිරූපය ආරක්ෂා කර ගැනීම සඳහාම පමණි. මේවා පෞද්ගලික සහන සැලසීම් ලෙසද අපට අර්ථකථනය කළ හැකිය.

පෘතුගීසින් විසින් ක්‍රි.ව. 1597 වර්ෂයේදී කෝට්ටේ පාලක ධර්මපාල රජු මරණයට පත්වීමෙන් අනතුරුව එම රාජධානියේ රදලයන් සමග ගිවිසුමක් අත්සන් කර තිබේ. එම ගිවිසුම මගින් පෘතුගීසින්ට කෝට්ටේ රාජධානියේ බොහෝ දේ සිය පාලනය යටතට ගත හැකි විය. එලෙස අත්සන් කරන ලද ගිවිසුම මගින් සිංහල රජ දවස පාලකයන් අනුගමනය කළ ආර්ථික ප්‍රතිපත්තිය පෘතුගීසීහුද මෙරට අනුගමනය කරන්නට වූහ. සිංහල රජු රට වැසියන්ගෙන් අය කළ බදු පෘතුගීසි පාලනයේදීද එලෙසම අය කළහ. අනෙක් අතට පහතරට ජනයා රජු වෙනුවෙන් සිදුකරන ලද රාජකාරි සේවා මෙහෙයද පෘතුගීසින් විසින් ලබා ගැනීමට ක්‍රියා කරනු දැකිය හැක. කෝට්ටේ රාජධානි සමය තුළ මෙරට ජනයා කිනම් හෝ බද්ද සංවිධානයකට ඇතුළත්ව සිටි අතර පෘතුගීසින් එම බද්ද සංවිධානයන්ගෙන් තමන්ට වාසිදායක වූ දේ එලෙසම තබා ගැනීමට කටයුතු කළේ ඒ මගින් සිය ආදායම් වැඩි කරගත හැකි වූ නිසාවෙනි. ඒ අනුව පෘතුගීසීහු,

**මඩිගේ බද්දඃ**
ප්‍රවාහන කටයුතු සම්බන්ධ සේවය

**පොරෝකාරයෝ**:
යුද හමුදාව ගමන් කරද්දී මග එළි කළ අය

**රෙදි සෝදන්නෝ**:
උසස් නිලධාරීන්ට පාවඩ දමා පිළිගැනීම

**ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශයන් පාලනය කරද්දී පෘතුගීසිහු තම ආර්ථික ප්‍රතිපත්තියේදී සිය ආදායම වැඩි කර ගැනීම සඳහා විවිධ බදු වර්ගද හඳුන්වා දුන්හ. මෙරට ආර්ථික ක්‍රියාවලිය මෙහෙයවීමේදී පෘතුගීසීන් ඒ සඳහා රාජ්‍ය ආදායම් ලේඛන මිටිපොත් හෙවත් තෝම්බු යොදා දැනීමද විශේෂ ලක්ෂණයකි.**

**කනම්පල්ල:**
කපිතාන් ජෙනරාල් පැලැක්කි හා තුරුම් ගෙන ගිය අය
**මහ බද්ද:**
කුරුඳු තැලීම
**කුරුවේ බද්ද:**
අලි ඇතුන් ඇල්ලීම හා හීලෑ කිරීම

වැනි බද්ද කාර්යාංශ භාවිතා කළහ. පැදුරු විවීමේ කාර්යාංශය යටතේ වූ කින්නර බද්ද කාර්යාංශය, හුණු පිළිස්සීම ආශ්‍රිතව වූ හුණු බද්ද කාර්යාංශය, කුඹල් කර්මාන්තය ආශ්‍රිත බඩහැල බද්ද කාර්යාංශය, හකුරු තැනීම, කිරි හරකුන් තබා ගැනීම වැනි කාර්යාංශයන්හිද ආදායම් පෘතුගීසීන් සිය අවශ්‍යතා වෙනුවෙන් භාවිතයට ගත්තද ඒවා දියුණු කිරීමට ඔවුන් කටයුතු කළ බවක් පෙනෙන්නට නැත.

ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශයන් පාලනය කරද්දී පෘතුගීසිහු තම ආර්ථික ප්‍රතිපත්තියේදී සිය ආදායම වැඩි කර ගැනීම සඳහා විවිධ බදු වර්ගද හඳුන්වා දුන්හ. මෙරට ආර්ථික ක්‍රියාවලිය මෙහෙයවීමේදී පෘතුගීසීන් ඒ සඳහා රාජ්‍ය ආදායම් ලේඛන මිටිපොත් හෙවත් තෝම්බු යොදා දැනීමද විශේෂ ලක්ෂණයකි. ඊට අමතරව පෘතුගීසීහු තම ආර්ථික ප්‍රතිපත්තිය පවත්වා ගෙන යාමට මෙරටදී නිලධාරී යාන්ත්‍රණයක්ද යොදා ගත්හ. විදෝර්දා පසෙන්දා හෙවත් රාජ්‍යය ආදායම් පාලක සහ ෆැක්ටර් හෙවත් ගබඩා භාරකරු එම නිලධාරීන් අතර වැදගත්ම දෙදෙනෙකි. මෙලෙස තම ආර්ථික ප්‍රතිපත්තියේදී රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සඳහා හඳුන්වා දුන් බද්දක් වූයේ මරාල බද්දයි. මරාල බද්ද යනු පුද්ගලයෙකු මරණයට පත් වූ පසු ඔහුගේ මරණය ලියාපදිංචි කිරීම සඳහා අය කරනු ලබන බද්දයි. මෙහිදී අය කරන ලද බද්ද වතුපිටිවලින් හරකා බානෙන් ගහ කොළෙන් මෙන්ම මිල මුදලින්ද අය කරන ලදී. මෙම බද්දට අමතරව පෘතුගීසිහු තුප්පොටි බද්ද, දැල්පනම් බද්ද, ඔරු බද්ද, පොල් බද්ද වැනි බද්ද සංවිධානයන්ගෙන්ද බදු අය කිරීමට කටයුතු කර ඇත.


දේශීය පාලන සංස්ථාව තුළ භූමියේ අවසාන අයිතිය පැවතියේ රජු වෙතය. රජුට අයත් වූ භූමිය කොටස් කිහිපයකට බෙදා තිබුණි. ඒවා නම්, එයින් එක් වර්ගයක් ගබඩාගම් නමින් හැඳින් වූ අතර ඒවා රජුගේ පරිහරණ සඳහා වෙන්වූ ගම් විය. විහාරගම් හා දේවාලගම් යනු රටේ පැවති විහාර හා දේවාල නඩත්තුව සඳහා වූ ගම්ය. රජයේ නිලධාරීන්ගේ නඩත්තුව සඳහා වෙන් වූ ගම් නින්දගම් යනුවෙන් හැඳින්වුණි. පරවේණි ඉඩම් යනු සාමාන්‍ය ජනයා භුක්ති විඳි ඉඩම්ය. මෙම ඉඩම් භුක්ති ක්‍රමයේදී ඔවුන් වැඩි වශයෙන්ම අවධානය යොමු කළේ කෝට්ටේ රජු සතුව පැවති ඉඩම් හෙවත් ගබඩාගම් කෙරෙහිය. ඔවුන් එම ඉඩම් තම හිතවතුන් අතර වාර්ෂිකව අස්වැන්නේ සියයට 12ක ආදායමක් රජයට ලබා දෙන පොරොන්දුව පිට බෙදා දී තිබේ. මෙරට පෞද්ගලික ඉඩම් පරිහරණය කෙරෙහි ජනයා පෙළඹීමට හේතුව වූයේ මෙම ප්‍රතිපත්තියයි. මේ තීරණයද පෞද්ගලීකරණය කෙරෙහි යොමු වූ අවස්ථාවක් ලෙස සැලකිය හැක.


එමෙන්ම පෘතුගීසි දිසාවේවරුන් සාම්ප්‍රදායික සිරිත් විරිත් නොසලකා රජය සතු ඉඩම් තම හිතවතුන්ට බෙදා දීමද සිදු කර ඇත. මෙයින් සිදු වූයේ එකම ඉඩම පරම්පරා ගණනක් භුක්ති විඳි ජනකොටසක් බිහි වීමය. මෙලෙස පෘතුගීසි දවස ඉඩම් ලද්දන් මෙරට පාලනය තුළදී ක්‍රියාත්මක වූ ඉඩම් භුක්ති ක්‍රමය නොදත් නිසා පැවති ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම අවුල් විය. මෙම ඉඩම් බොහෝ විට පවරා දීම සිදු වූයේ කපිතාන් ජෙනරාල්ගේ හෝ දිසාවේගේ අභිමතය නිසා එම ක්‍රියාවලිය සාර්ථක නොවීය. තමන්ට ලැබුණ ඉඩම් තුළින් උපරිම ලාභයක් ලැබීම මේ නිලධාරීන්ගේ අපේක්ෂාව වූ බවද කිව යුතුය. කෙසේ වෙතත් එතරම් ලාභ ගෙන නොදුන් රදා බද්ද, කින්නර බද්ද,

බඩහැල බද්ද වැනි බද්ද සංවිධාන පෘතුගීසින් විසින් නොසලකා හැරීම ඔවුන්ගේ ආර්ථික ප්‍රතිපත්තියේ දක්නට ඇති අනෙක් විශේෂ ලක්‍ෂණයයි.

ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශයන් පාලනය කළ ඉංග්‍රීසි වෙළඳ සමාගමද මෙරට ජනයා පීඩනයට පත් කරමින් විවිධ බදු අය කිරීමට කටයුතු කර ඇත්තේ සිය ප්‍රධාන අරමුණ වූ ලාභ අපේක්ෂාවෙනි. වෙළඳ සමාගම මුහුදුබඩ ප්‍රදේශයන්ගෙන් බදු අය කිරීමට නිලධාරි යාන්ත්‍රණයක්ද භාවිත කරන ලදී. මෙහිදී ඔවුන් 'රෙසිඩන්ට්වරයෙකු' පත් කළ අතර ඔහුගේ සහායට 'කලෙක්ටර්වරුන්' පත් කර තිබේ. කලෙක්ටර්වරුන්ගේ සේවා මධ්‍යස්ථානය කච්චේරිය නමින් හඳුන්වන ලදී. ඔවුන්ගේ සහායට 'අවුමිල්දාර්වරුද' වෙළඳ සමාගම විසින් පත් කරන ලදහ. වෙළඳ සමාගමද සිය ආදායම් වැඩි කර ගැනීමට විවිධ බදු ක්‍රියාවට නංවා ඇත. පොල් ගස් බද්ද එවැන්නකි. ඉඩමක පොල් ගස් දහයට වඩා ඇත්නම් ඒ සෑම ගසකින්ම රිදී පනම බැගින් අය කිරීම එවැනි එක් බද්දකි. ලුණු, මාළු, අරක්කු, රා වැනි නිෂ්පාදනයන්ගෙන්ද මොවුන් විසින් බදු අය කරනු ලැබ තිබේ. මෙම බදු ප්‍රතිපත්තිය යටතේ බදු අය කිරීමේ යාන්ත්‍රණය වෙන්දේසියේ විකිණීමටද වෙළඳ සමාගම විසින් කටයුතු කර ඇත. වෙළඳ සමාගමේ මෙම ප්‍රතිපත්තියට එරෙහිව ක්‍රි.ව. 1797 වර්ෂයේදී මුහුදුබඩ ජනයා විසින් කැරැල්ලක්ද ඇති කර තිබේ. වෙළඳ සමාගම් පාලනය මෙම නැගිටීම මර්දනය කර ඒ පිළිබඳ සොයා බැලීමට 'දි මියුරන්' නම් හමුදා නිලධාරියාගේ නායකත්වය යටතේ කොමිසමක්ද පත් කර ඇත.

1848 අරගලයට බලපෑ ආසන්නම හේතුව ලෙස සලකන්නේද රජය විසින් අය කළ බදු ප්‍රතිපත්තියයි. 1840 වර්ෂයේ සිට ක්‍රමයෙන් වර්ධනය වෙමින් ආ ආර්ථික අවපාතය පියවා ගැනීම සඳහා රජය සිදු කළේ මහජනයා මත එය පටවා බදු අය කිරීමට කටයුතු කිරීමයි. මේ නිසා පීඩාවට පත් මහජනතාව රජයට විරුද්ධව දැවැන්ත අරගලයක් සිදු කරන ලදී. බලු බද්ද, ඇඟ බද්ද හෙවත් පාර බද්ද, කරත්ත බද්ද, වෙළඳ බද්ද, කඩ සාප්පු බද්ද, තුවක්කු බද්ද වැනි බදු එලෙස රජය විසින් අය කිරීමට කටයුතු කර ඇත. එදා සිටම අද දක්වා රජය තම හිතවතුන්ට බදු වරප්‍රසාද හා සහන සපයා ඇති අතර සාමාන්‍ය ජනයා පීඩාවට පත් කළ බව මෙම කරුණු තුළින් තහවුරු වන සත්‍යය බව පැහැදිලිය.






# “අපව විනාශ කළ හැක්කේ අපගේම වැරදිවලට මිස අන් කිසිවකට නොවේ”

රුසියානු කොමියුනිස්ට් කම්කරු පක්ෂයේ පළමු ලේකම්
**වික්ටර් ටුල්කින්** සහෝදරයා

**Left :- ඔබ ගෝර්බචොෆ් සමඟ පක්ෂ නායක මණ්ඩලය තුළ කටයුතු කළ කෙනෙක්. ඔහු පිළිබඳ ඔබගේ පුද්ගලික අදහස කුමක්ද? ඔහු දක්ෂ කුමන්ත්‍රණකරුවෙක්ද?** CIA **සාමාජිකයෙක්ද? ඔබට අනුව ඔහු කවුද?**

**ටුල්කින් සහෝදරයා**:- ඇත්තටම මම ගෝර්බචොෆ් සමඟ පක්ෂය තුළ වැඩ කළා කියන එක සෝවියට් කොමියුනිස්ට් පක්ෂය තුළ මගේ මට්ටම අනවශ්‍ය තරම් ඉහළට ඔසවා ගැනීමක් කියලයි මම හිතන්නේ. 1988දී ඒ කියන්නේ, පෙරෙස්ත්‍රොයිකාවේ අවසාන කාලයේදී ඉතාම විශාල වශයෙන් අවි ආයුධ නිෂ්පාදනය කරන රාජ්‍ය සමාගමක පක්ෂයේ ලේකම් ලෙස ඡන්දයෙන් මා තෝරා ගත්තා. මෙම තනතුරත්, වගකීමත් සමඟමයි මම පක්ෂයේ අභ්‍යන්තර අරගලය එනම්, ‘මූලාරම්භක කොමියුනිස්ට් ව්‍යාපාරයට’ (Communist Initiative Movement) සම්බන්ධ වෙන්නේ. අප පැහැදිලිවම රට තුළ කරගෙන යන ලද වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණවලටත්, එමෙන්ම සෝවියට් කොමියුනිස්ට් පක්ෂය යළි අවස්ථාවාදී ලෙස පිහිටුවීමට ගත් උත්සාහයටත්, ගෝර්බචොෆ්ටත් එමෙන් ම ඔහුගේ ‘පෙරෙස්ත්‍රොයිකාව’ නමින් හැඳින් වූ

වැඩපිළිවෙළටත් විරුද්ධ වුණා. එමෙන්ම පෙරෙස්ත්‍රොයිකාව නම් වැඩසටහනේ රහසිගත තේරුම ලෙස අප හැඳින්වූයේ 'ක්‍රමය වෙනස් කිරීමත්, ධනවාදය දෙසට යොමු කිරීමත්' ලෙසයි. මම සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ ලෙනින්ග්‍රෑඩ් ප්‍රාදේශීය කමිටුවේ සාමාජිකයකු වූ අතරම, රුසියානු ෆෙඩරේෂණයේ කොමියුනිස්ට් පක්ෂය ආරම්භ කිරීමේ සමුළුවේ නියෝජිතවරයකුද වුණා. එමෙන්ම මා එම සමුළුවේදී එහි මධ්‍යම කාරක සභිකයකු ලෙසද තේරීපත් වුණා. එමෙන්ම මා සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ අවසාන සමුළුව වූ 28 වැනි සමුළුවේද සමුළු නියෝජිතයකු වශයෙන් සහභාගී වුණා. මෙම කාලය තුළ දී - 1989, 1990 කාලය තුළදී - මා අවස්ථා කිහිපයක දීම ගොර්බචොෆ් මුණගැසුණා. ඇත්තම කතා කළහොත්, මා ඔහු වෙත දුව ගොස් ඔහු මුණගැසුණා. ගොර්බචොව් සී. අයි. ඒ. නියෝජිතයකු ලෙසවත්, එමෙන්ම අරමුණු සහගතව කොමියුනිස්ට්වාදයට එරෙහිව සටන් කළ මතවාදී සටන්කරුවකු ලෙසවත් මා දකින්නේ නැහැ. ඔහු කිසි විටෙක එවැනි කෙනකු වූයේ නැහැ. ඔහු සාමාන්‍ය මට්ටමේ අවස්ථාවාදියෙක්. එමෙන්ම අවස්ථාවාදී ලෙස තම රාජකාරී ඉටු කිරීම මගින් ඉතාම ඉහළ තනතුරකට නැඟ ගත් පුද්ගලයෙක්. ඔහු දේශපාලනයට මඟපෙන්වීම සඳහා මාක්ස්වාදය වෙනුවට අප සාමාන්‍යයෙන් හඳුන්වන සාමාන්‍ය දැනීම යොදා ගත් පුද්ගලයෙක්. උදාහරණයක් ලෙස ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී රටවල දේශපාලනඥයන් මෙන්. ගොර්බචොෆ්ගේ සහායකයකු වූ ඇලෙක්සැන්ඩර් සිත්කොව් වරෙක ගොර්බචොව් පිළිබඳ ඔහුගේ මතකයන් මෙසේ ලියා තැබුවා: "අපට පෙනුණේ සෑම දෙයක්ම ඉතාම සරල දේ ලෙසයි. අපට යළි මාක්ස් සහ ලෙනින් වෙතට යාමට සිත් වුණා. එවිට සෑම දෙයක්ම මෙයට වඩා හොඳින් කර ගත හැකි



ඔහු අරමුණු සහගතව කොමියුනිස්ට්වාදයට එරෙහිව සටන් කළ මතවාදී සටන්කරුවකු ලෙසවත් මා දකින්නේ නැහැ. ඔහු කිසි විටෙක එවැනි කෙනකු වූයේ නැහැ. ඔහු සාමාන්‍ය මට්ටමේ අවස්ථාවාදියෙක්. එමෙන් ම අවස්ථාවාදී ලෙස තම රාජකාරී ඉටු කිරීම මගින් ඉතාම ඉහළ තනතුරකට නැඟ ගත් පුද්ගලයෙක්.

ආකාරය පිළිබඳව අපට වැටහුණා. නමුත්, ඒ වන විටත් අප තවදුරටත් මාක්ස්වාදීන් වී සිටියේ නැහැ." සාමාන්‍ය මනුෂ්‍යයකු ලෙස මම ඔහුගේ චරිත ස්වභාවය දකින්නේ, අවංක නොවූ, කපටි, වංචාකාරී පුද්ගලයකු ලෙසයි. ගොර්බචොෆ් සිය ජීවිතයේ අවසාන හුස්ම දක්වාම කොමියුනිස්ට්වාදියකු ලෙස ජීවත් වන බවට මා හට පොරොන්දු වුණා. එය සමුළුවේ මා සමඟ සිටි අනෙකුත් සැලකිය යුතු පිරිසක් එය දුටුවා. ඒ 1990 අප්‍රේල් 04 වැනිදා. සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ ප්‍රාදේශීය බලප්‍රදේශ නියෝජනය කරන නියෝජිතයන් සමඟ සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ කොටසක් ලෙස රුසියානු කොමියුනිස්ට් පක්ෂය ගොඩනැඟීම පිළිබඳ කරුණු සාකච්ඡා කිරීමට මෙම සාකච්ඡාව යොදා තිබුණා. මම මගේ කතාව තුළ දී රුසියානු කොමියුනිස්ට් පක්ෂයේ සංවිධාන ව්‍යුහය පිළිබඳව වැඩි අවධානයක් යොමු කළේ නැහැ. මා වැඩි අවධානයක් යොමු කළේ පක්ෂයේ ප්‍රතිපත්ති නිසා පක්ෂයේ නව උපත පිළිබඳ කරුණු පිළිබඳවයි. මා එහි දී ප්‍රකාශ කළා කොමියුනිස්ට් මූලාරම්භක ව්‍යාපාරයේ ඇස්තමේන්තු අනුව නම්, සෝවියට් කොමියුනිස්ට් පක්ෂය එහි නිර්ධන පාංතික හරය අහිමි කර ගනිමින්, එය සමාජ - ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක් බවට පරිවර්තනය වෙමින් පවතින බව. ගොර්බචොව් මේ පිළිබඳව ඔහුගේ යම් පැහැදිලි කිරීම් කිහිපයක් සිදු කළ පසු මෙම රැස්වීමේ විවේක කාලය තුළ දී මා වෙත පැමිණියා. මා වෙත පැමිණි එම සාකච්ඡාව දිගට ම පවත්වාගෙන ගිය අතර, ඔහු මා වැරදි බව ප්‍රකාශ කර සිටියා. එම අවස්ථාවේදී ඔහු මටත්, මා සමඟ සිටි අනෙකුත් සහෝදරවරුන්ටත් ඇසෙන පරිදි සහතික වෙමින් පැවසුවේ, කිසිදු ආකාරයක සැකයක් තබා නොගන්නා ලෙසයි. තමන් තමන්ගේ අවසාන හුස්මපොද දක්වා, අවසාන දවස දක්වා කොමියුනිස්ට්වාදියකු ලෙස ජීවත් වන බවයි. ඔහු කොමියුනිස්ට්වාදයට එරෙහි මතවාදී සටන්කරුවකු ලෙසට වන වෙස්මුහුණ පැළඳ ගත්තේ,

සම්පූර්ණයෙන්ම නිෂ්ඵල වූ ඔහුගේ දේශපාලන විගඩම අසාර්ථක වීමෙන් පසුවයි. ඔහු පැහැදිලිවම සාමාන්‍ය අවස්ථාවාදියෙක්. ඔහු අනවරතව තත්වයන්ට අනුව හැඩගැසුණා. පසුව එම තත්වයන් පාලනය කළ නොහැකි ලෙස වෙනස් වූ විට ඔහු පසුබෑවා. ඉන් පසු ඔහු සියල්ල අතහැරියා; සියලු දෙනාම පාවා දුන්නා. ඔහු තුළ කිසිදා සටන්කාමියකුගේ ලක්‍ෂණ තිබුණේ නැහැ.

එමෙන්ම කෙළින්ම පවසන්නේ නම්, ඔහු බටහිර රටවලින් ලැබුණු ත්‍යාගවලින් දූෂණය වී, ඒවායින් අල්ලස් ලබා ගත් පුද්ගලයකු බවට පත් වුණා. ඔහු තුට්ටු දෙකට වැටුණා. ඒ සඳහා ඇමෙරිකානු ‘පීසා’ නිෂ්පාදන ආයතනයක වෙළෙඳ දැන්වීමක් වෙනුවෙන් ඔහු පෙනීසිටීම දැක්වීමම ප්‍රමාණවත්. 2010දී ‘ටයිම්’ සඟරාව මෙම දැන්වීම ගැන සඳහන් කළේ ‘ලෝකයේ ප්‍රසිද්ධ පුද්ගලයන් පෙනී සිටි නරකම වෙළෙඳ දැන්වීම් දහයෙන් එකක් බවයි. සමාජවාදී සෝවියට් සංගමය බිඳවැටීමෙන් පසු ගොර්බචොෆ් විශාල වශයෙන් උත්සාහ කළා, ලෝක මට්ටමේ නායකයකු ලෙස පෙනීසිටීමට. නමුත්, ඔහුට ඒ සඳහා වන කිසිදු සහායක් හෝ පිළිගැනීමක් අධිරාජ්‍යවාදීන්ගෙන් ලැබුණේ නැහැ. පසුව ඔහු කිසිදු සහායක් නැති අසරණයකු බවට පත් වී ඔහුගේ ජීවිතය අවසන් වුණා.

මම මේ දෙබස පිළිවෙළට සඳහන් කළේ කොමියුනිස්ට්වාදීන් වන අප විසින් ගොඩනඟනු ලබන්නේ කුමක්ද යන්නත්, එය කෙසේ ගොඩනැඟිය යුතුද පිළිබඳවත් අපට අවබෝධයක් තිබිය යුතු බව සඳහන් කරන්නටයි. මෙම ප්‍රශ්නයට අපේ පක්‍ෂය මෙවැනි පිළිතුරක් ලබා දී තිබෙනවා. අප සතුව තිබුණේ, කුමන වර්ගයේ සමාජවාදයක්ද? එමෙන්ම එය කුමන වර්ගයේ එකක් විය යුතුව තිබුණේද යන ප්‍රශ්නයයි.

ඔක්තෝබර් විප්ලවයට වසර 100ක් පිරීම නිමිත්තෙන් අප පක්‍ෂය විසින් ප්‍රකාශයට පත් කරන ලද වී.ඕ.එස්.ආර්. ප්‍රකාශනයෙන් පිළිතුරු සපයා ඇත්තේ, මේ ආකාරයටයි. මාක්ස් - ලෙනින්වාදී න්‍යාය අනාගත සමාජය පිළිබඳ සම්පූර්ණ විස්තරානුකූල වට්ටෝරු හෝ පරමාදර්ශී මොඩල හෝ යෝජනා කරන්නේ නැහැ. මාක්ස් සහ එංගල්ස් කොමියුනිස්ට් ක්‍රමය හැඳින්වූයේ එය නිශ්චිත රාජ්‍යයක් හෝ නිශ්චිත තත්වයක් හෝ ස්ථාපනය කිරීමක් ලෙස නොවෙයි. එමෙන්ම අනෙක් අතට විෂයමූල යථාර්ථයට එකඟ විය යුතු පරමාදර්ශයක් ලෙසද නොවේ. ඔවුන් විසින් කොමියුනිස්ට් ක්‍රමය ලෙස හඳුන්වනු ලැබුවේ විශ්ලේෂණය කරනු ලැබුවේ - වර්තමාන සමාජයේ සංවර්ධනය අභුරා තබන එමෙන්ම වර්තමාන සමාජය තුළ ඉතාම අසාධාරණ තත්වයක් ඇති කර තිබෙන වත්මන් තත්වය අහෝසි කරන සැබෑ මහජන ව්‍යාපාරයක් ලෙසයි.

සමාජවාදය යනු, එම නිශ්චිත මොහොතේ පවතින තත්වයන් තුළින් ධනපති ක්‍රමය පරාජයට පත් කරමින්, එය තුළින් බිහි වන සමාජයක්. සමාජවාදය යටතේදී පංති අරගලය අවසන් වන්නේ නැහැ. එය නව ආකාර ගන්නවා. එනම්, නිර්ධන පංතියේ අරගලයත්, කොමියුනිස්ට්වාදය නිර්මාණය කරන ප්‍රවණතාවත් එමෙන්ම සුළු ධනපති පෞද්ගලික දේපළ ක්‍රමය රකින ප්‍රවණතාවත් අතර ගැටුමයි. සමාජවාදයේ අත්‍යවශ්‍ය එක් නිශ්චිත ලක්‍ෂණයක් වන්නේ නිර්ධන පංතිය විසින් නිර්ධන පංති ආඥාදායකත්වය රාජ්‍ය බලය තුළ පවත්වාගෙන යාමත්, එමඟින් ධනාත්මක කොමියුනිස්ට් ප්‍රවණතාවේ ජයග්‍රහණය සහතික කිරීමයි. ලෙනින්ට අනුව දේශපාලන ක්ෂේත්‍රයේදී සමාජවාදය සංලක්ෂිත වන්නේ පංති විනාශ කිරීම මඟින් පංති අසමානතාව අහෝසි කිරීමත්, මානසික ශ්‍රමය සහ කායික ශ්‍රමය අතර පවතින වෙනස්කම් අහෝසි කිරීමත්ය.

වී. අයි. ලෙනින් පැහැදිලි කළ ආකාරය අනුව පංති අහෝසි කිරීම දිගු, දුෂ්කර, අඛණ්ඩ පංති අරගලයකි. ප්‍රාග්ධනයේ ආධිපත්‍යය මුලිනුපුටා දැමීමෙන් පසුවත්, ධනේශ්වර රාජ්‍යය මුලිනුපුටා දැමීමෙන් පසුවත්, නිර්ධන පංති ආඥාදායකත්වය ස්ථාපනය කිරීමෙන් පසුවත් පංති අරගලය පවතී. සිදු වන්නේ එය පවත්වාගෙන යන ආකාරය වෙනස් වීම පමණි. බොහෝ අංශවලින් මෙම පංති අරගලය වඩ වඩාත් වියරු සහ ප්‍රචණ්ඩ විය හැකිය. ආර්ථික ක්ෂේත්‍රයේ දී සමාජවාදය යන්නෙන් අදහස් වන්නේ ඍජු සමාජ නිෂ්පාදනයේදී වෙළෙඳපොළ උපකරණවල බලපෑම අහෝසි කිරීමයි. සදාචාරමය ක්ෂේත්‍රයේදී සමාජවාදය යන්නෙන් අදහස් කරන්නේ තනි තනි පුද්ගලයාගේ නිදහස් සංවර්ධනය සඳහා වඩ වඩාත් වැඩි අවස්ථා බිහි කිරීමයි. අපගේ මෙම සංවාදය අවසන් කිරීම සඳහා අපගේ පක්‍ෂයේ මධ්‍යම කාරක සභාවේ ඉහත සඳහන් වාර්තාව උපුටා දැක්වීමට මම කැමැතියි. “අපගේ වැඩපිළිවෙළ වන්නේ කම්කරු පංතිය තුළින්ම මෙම අරගලය ගොඩනඟා ගැනීමට, වර්ධනය කර ගැනීමට දායක වීමයි. යම් හෝ ජයග්‍රහණයක් අත්පත් කර ගත හැක්කේ සටන් කිරීමෙන් මිස

ආයාචනය කිරීමෙන් හෝ යැදීමෙන් හෝ නොවේ. අප ජනතාව තුළින් සටන්කරුවන් නිර්මාණය කළ යුතු වනවා මිස පෙත්සම්කරුවන් නිර්මාණය කිරීම නොකළ යුතුය." විශිෂ්ට සෝවියට් කිවියකු වූ යෙව්ගෙනි ඩොල්මටොව්ස්කි විසින් රචනා කරන ලද 'හෑන්ඩ්ස් ඔෆ් ගුවේරා' යනුවෙන් වූ කවියක කොටසක් මම මෙහිදී උපුටා දැක්වීමට කැමතියි. "අරගලය තුළම පසුබැසීම් තිබේ. එහෙත්, ඒ පසුබැසීම් තුළට ළං වී බැලුවහොත්, ජයග්‍රහණයේ අංශු වේදනාකාරී ලෙස එහි පතුලේම ගුළි වී ඇති බැව් ඔබට පෙනෙනු ඇත. ඒවා හෙට දිනයේදීත් ගින්න අවුළුවා දමනු නියතය." අප මෙම යුගයේ මුහුණ දෙමින් සිටින්නේ ඉතාමත් ශක්තිමත්ව ප්‍රහාර එල්ල කරන ප්‍රතිගාමීත්වයේ අවධියකටයි. මෙහිදී අප අපගේ ස්වයං පාලනය තබා ගනිමින්ම, විප්ලවයේ දැනුම හා විප්ලවයේ ගින්න ජනතාවගේ ශක්තිය නම් අංශු තුළට නිසි මොහොතේ, නිවැරදි මොහොතේ එල්ල කර එමඟින් ගින්න ඇවිළවීමයි.
ලෙනින් වරෙක මෙසේ ප්‍රකාශ කළා: "විප්ලවයක් ඇති වේද, නැද්ද යන්න අප මත පමණක් තීරණය වන්නක් නොවේ. නමුත්, අපි අපේ වැඩ කොටස ඉටු කරමු. එම වැඩ කොටස කිසිදා නාස්ති වන්නේ නැත." අපි සෑම කෙනකුම ලෙනින් දෙසත්, බොල්ෂෙවික් පක්ෂය දෙසත් බලමු. අපගේ සිතුවිලි තුළදී මෙන්ම අපගේ ක්‍රියා තුළදීත් එය දෙස බලමු. වරෙක ජර්මන් සහෝදරවරුන් පිරිසක් විසින් මා හට ප්‍රකාශ කළා, ජර්මනියේ තිබෙන මාක්ස්ගේ සහ එංගල්ස්ගේ සමරු ස්මාරයක ජර්මන් කම්කරුවන් මෙසේ ලියා ඇති වග. "අවුලක් නෑ... ඊළඟ සැරේ මීට වඩා හොඳට මේක කරනවා." අපටද එය එලෙසම විශ්වාසයි.

**Left :- 1985-1992 දක්වා ගෝර්බචෝෆ් කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම් වූ අවස්ථාවේ සිට සමාජවාදයත්, සෝවියට් සංගමයත් විනාශ කිරීම සඳහා දැනුවත්ව සිදු කළ කටයුතු මොනවාද? විශේෂයෙන්ම ප්‍රතිවිප්ලවය ප්‍රසිද්ධියේම ආරම්භ වූ 1989න් පසු ගෝර්බචෝෆ් ඇතුළු පිරිස සිදුකළ කොමියුනිස්ට් විරෝධී තීරණාත්මක කටයුතු මොනවාද?**

**ටුල්කින් සහෝදරයා**:-
කොමියුනිස්ට්වාදීන් විදියට අප දැඩිව අවධාරණය කර ගත යුතු කරුණක් තමයි, සෝවියට් සංගමය තුළ සමාජවාදය විනාශ කිරීමත්, එලෙසම සෝවියට් සංගමය විසුරුවා හැරීමත් කුමන්ත්‍රණවලට හෝ යම් යම් පුද්ගලයන්ගේ නපුරු ක්‍රියාවලට හෝ විශේෂයෙන්ම ගෝර්බචෝෆ් වර්ගයේ පුද්ගලයන්ගේ ක්‍රියාවලට සීමා කරමින්, එයට ප්‍රධාන හේතුව එය ලෙස හඳුනා ගැනීම ඉතාම බරපතළ වැරැද්දක් ලෙස මම දක්වන්නට කැමැතියි. නමුත්, ඒ සමඟම ගෝර්බචෝෆ් සහ ඔහුගේ කණ්ඩායම විසින් අරමුණු සහගතව සිදු කරන ලද විනාශකාරී ක්‍රියා විසින් සෝවියට් සංගමය බිඳදැමීමත්, සෝවියට් සංගමය තුළ සමාජවාදය විනාශ කිරීමත් සිදු වීමට ඉතා පැහැදිලිවම උදව් වූ බව සත්‍යයක්.
අපි මෙහිදී මුලින්ම සලකා බලමු, ඔහු ඇතුළු කණ්ඩායම විසින් සෝවියට් දේශය තුළ වෙළෙඳපොළ ක්‍රමය ආරම්භ කිරීම සඳහා ගනු ලබන ලද ක්‍රියාමාර්ග. අප පැහැදිලිවම න්‍යායාත්මකව දන්නා කරුණක් වන්නේ අපගේ රුසියානු සමාජ - ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ පළමු වැඩසටහනේදීම සඳහන් කර ඇති දෙයක් වන්නේ වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදනය විසින් වැළැක්විය නොහැකි ලෙසම ධනපති ක්‍රමයට උපත ලබා දෙන බවයි. ධනවාදය යනු එහි නිර්වචනය අනුව ඉතාම ඉහළ මට්ටමෙන් වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන, ශ්‍රමය වෙළෙඳ භාණ්ඩයක් බවට පත් කරන සමාජ ක්‍රමයක්. එම නිසාම එය වෙළෙඳපොළ ක්‍රමය වෙත වන පරිවර්තනයක්. එමෙන්ම සමාජවාදී ආර්ථිකයට ධනේශ්වර ආර්ථික උපකරණ හඳුන්වා දීම - එය විවිධ නම්වලින් විය හැකියි. සමුපකාර, සමාජවාදී ව්‍යාපාර යන කුමන නමකින් හැඳින්වුවත් - එය අනිවාර්යයෙන්ම වැළැක්විය නොහැකි ලෙසම සමාජවාදය බිඳදැමීමේ දිශාවට කටයුතු සිදු කරනවා.
සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ 28 වැනි සමුළුවේදී කොමියුනිස්ට් මූලාරම්භක ව්‍යාපාරය වෙනුවෙන් - එය නියෝජනය කරමින් - කතා කිරීමට මට අවස්ථාවක් ලැබුණා. එහිදී මා විසින් කොමියුනිස්ට් මූලාරම්භක ව්‍යාපාරය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ලියවිල්ලේ මේ කරුණ සඳහන් කළා. එම ලියවිල්ල සමුළුව තුළ බහුතරයෙන් අනුමත නොවුවත්, එයට සැලකිය යුතු එකඟතාවක් ලැබුණා. එම ලියැවිල්ල 1990 ජූලි මස 13 වැනි දින මා විසින් සමුළුවට ඉදිරිපත් කරනු ලැබුවා. එහි මෙසේ සඳහන් වනවා: "අප මෙහි දී මුළු රටේම සියලුම කොමියුනිස්ට්වාදීන් වෙත බරපතළ අනතුරු හැඟවීමක් සිදු කිරීමට අවශ්‍ය යැයි සලකනවා. වෙළෙඳපොළ ක්‍රමය පොදු ආර්ථික ක්‍රමවේදයට පරිවර්තනය කිරීම, එමෙන්ම ධනවාදී වෙළෙඳපොළක් සහ ශ්‍රම වෙළෙඳපොළක් ඇති කිරීම මඟින් අනිවාරණීය

වශයෙන්ම සිදු වන්නේ සෝවියට් සංගමය තුළ ධනේශ්වර සබඳතා ගොඩනැඟීමයි. එමෙන්ම බලහත්කාරී සහ ප්‍රචණ්ඩකාරී ලෙස සමාජවාදය තුළ ධනපති ක්‍රමය ස්ථාපනය කිරීම මගින් වැළැක්විය නොහැකි ලෙසට සිදු විය හැක්කේ ප්‍රකාශ කර ඇති ක්‍රියාවලියට එරෙහිව එය වෙනුවට නිෂ්පාදනය සහ ජනතාවගේ ජීවන මට්ටම ඉහළ දමනවා වෙනුවට නිෂ්පාදනය සහ ජීවන මට්ටම පහත වැටීමත්, එමඟින් සමාජය තුළ පැතිරුණු විශාල මට්ටමේ මහජන කැළඹීම් සහ විරෝධතා නිර්මාණය වීමත්, එමඟින් ජනතාව ඉතාම ඉහළ මට්ටමේ පීඩාවන්ට, දුෂ්කරතාවන්ට ගොදුරු වීමත්ය. පක්ෂයට තවදුරටත් පෙරෙස්ත්‍රොයිකාව පවත්වාගෙන යා නොහැකිය. මන්ද යත්, එමඟින් ජන ජීවිතවල මට්ටම - ජනතාවගේ ජීවන මට්ටම - බරපතළ ලෙස බිඳදමා ඇති බැවිනි. මෙම දැවැන්ත තෙරපුමට මුහුණ දීමට කොමියුනිස්ට් පක්ෂයට කිසිසේත්ම නොහැකි වනු ඇත. එම නිසාම අවසානයේදී කොමියුනිස්ට් ව්‍යාපාරයේ අරමුණු, ඉලක්ක ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් කිසිවෙක් ඉතිරි නොවනු ඇත.” සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ 28 වැනි සමුළුවේ නියෝජිතයන්ගෙන් 1,259 දෙනෙක් අප විසින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනාවට ඡන්දය ලබා දුන්නා. ඒ ශාලාව තුළ රැඳී සිටි සමස්ත සාමාජිකත්වයෙන් තුනෙන් එකකට වැඩි පිරිසක්. ජීවිතය සහ ප්‍රායෝගිකත්වය විසින් පෙන්වා දී තිබෙන්නේ මෙම යෝජනාවේ සහ මෙම අනාගත දැක්මේ නිවැරදිභාවයයි. එමෙන්ම මේ සමඟම තේරුම් ගත යුත්තේ, මෙම ආර්ථික පදනමේ සිදු කරන ලද වෙනස්කම් පැහැදිලිවම, නිශ්චිතවම දේශපාලන පදනම තුළද ප්‍රකාශයට පත් වූ බවයි. මෙම ධනේශ්වර වුවමනා නියෝජනය කරන විවිධ පුද්ගලයන් සහ කණ්ඩායම් දේශපාලන ක්ෂේත්‍රය තුළ ස්වාධීන දේශපාලන පක්ෂ ලෙසත්, ව්‍යාපාර ලෙසත් පමණක් නොව කොමියුනිස්ට් පක්ෂය තුළමත් මතු වුණා. මෙම අවස්ථාවේදී බොහෝ දෙනෙක් ප්‍රධාන ප්‍රශ්න දෙකක් ඇසුවා. එනම්, ලෙනින්ගේ ‘නව ආර්ථික ප්‍රතිපත්තිය’ අතර



> “
> **මා ඉතා පැහැදිලිවම යෝජනා කරන්නේ, මෙම තත්ත්වය තේරුම් ගැනීමට වර්තමානයේ චීන කොමියුනිස්ට් පක්ෂය මුහුණදී සිටින තත්වය - චීන කොමියුනිස්ට් පක්ෂයේ උදාහරණය - අධ්‍යයනය කිරීම වැදගත් බවයි.**

සහ මෙම පෙරෙස්ත්‍රොයිකා වැඩසටහන අතර වෙනස කුමක්ද යන්නයි. එමෙන්ම මහජන චීන ආණ්ඩුවේ, චීන කොමියුනිස්ට් පක්ෂයේ වර්තමාන ආර්ථික ප්‍රතිපත්තිය සහ මෙම වැඩපිළිවෙළ අතර වෙනස කුමක්ද යන්නයි. කෙටියෙන්ම පවසන්නේ නම්, සමාජවාදය යටතේ එනම්, සමහර නිශ්චිත තත්වයන් යටතේදී විවිධ ආර්ථික මොඩල එක විට පැවැතිය හැකි බවයි. පැහැදිලිව සඳහන් කළොත්, ‘නව ආර්ථික ප්‍රතිපත්ති’ (එන්.ඊ.පී.) නම් වූ මෙම ධනේශ්වර ආර්ථික ක්‍රියාමාර්ග සමාජවාදී ආර්ථික ක්‍රමයට හඳුන්වා දීමේදී පැහැදිලිවම එය පියවරක් පසුපසට යාමක් බවත්, පැහැදිලිව තේරුම් ගෙන සිදු කරන ලද්දක් බවත් බොල්ෂෙවික්වරු ප්‍රකාශ කළා. එමෙන්ම එම අවස්ථාවේදී බොල්ෂෙවිකවරුනුත් ඉතා පැහැදිලිවම මෙම ධනේශ්වර කණ්ඩායම්වලට සහ පුද්ගලයන්ට පක්ෂයට ඇතුළු වීමට කිසිදු ඉඩක් ලබා දුන්නේ නැහැ. එමෙන්ම ඔවුන්ට මැතිවරණවලදී ඡන්දය ලබා දීමට ඉඩ ලබා දුන්නේ නැහැ. එමෙන්ම ඔවුන් කිසිවකුට රාජ්‍ය ආයතනවල තනතුරු ලබා දුන්නේ නැහැ. නමුත්, ගොර්බචොව් ප්‍රකාශ කළේ මෙම ක්‍රියාවලිය සමාජවාදයේ සංවර්ධනය සඳහා ඉදිරියට යාමක් බවයි. එම ඉදිරියට යාමෙන් සිදු වූ ඛේදවාචකය අද අපි කවුරුත් දන්නවා. මා ඉතා පැහැදිලිවම යෝජනා කරන්නේ, මෙම තත්වය තේරුම් ගැනීමට වර්තමානයේ චීන කොමියුනිස්ට් පක්ෂය මුහුණ දී සිටින තත්වය - චීන කොමියුනිස්ට් පක්ෂයේ උදාහරණය - අධ්‍යයනය කිරීම වැදගත් බවයි. චීනය තුළ ධනේශ්වර ප්‍රවණතාවන් ඉතා පැහැදිලිවම වර්ධනය වෙමින් තිබේ. එමෙන්ම චීන කොමියුනිස්ට් පක්ෂය තම ව්‍යවස්ථාව පවා මෙයට ගැළපෙන ලෙස වෙනස් කරමින්, පක්ෂයේ සමාජ පදනමෙන් කොටසක් ලෙස ව්‍යාපාරිකයන් පිළිගෙන තිබෙනවා. නමුත්, කොමියුනිස්ට් පක්ෂය එහි නිර්වචනය අනුවම එය කම්කරු පංතියේ පක්ෂයයි.

**Left** :- **බොහෝ අය සිතා සිටින්නේ**

**සමාජවාදී සෝවියට් දේශය බිඳ වැටුණේ ආර්ථික දුෂ්කරතා භාණ්ඩ හිඟය, ප්‍රජාතන්ත්‍රවාදය නොමැතිවීම, නිලධාරිවාදය වැනි කරුණු නිසා බවයි. නමුත් 1990 පැවති ජනමත විචාරණයේදී සෝවියට් ජනතාව සියයට හැත්තෑ හයක් සෝවියට් සංගමයේ පැවැත්ම වෙනුවෙන් ඡන්දය ලබා දුන්නා. ඔබ මෙය මෙම තත්වය පැහැදිලි කරන්නේ කෙසේද?**

**ටුල්කින් සහෝදරයා**:- ආර්ථික දුෂ්කරතා භාණ්ඩ හිඟය ජීවන මට්ටම කඩාගෙන වැටීම යන මේ සියල්ලම ඉතා ගැඹුරු ක්‍රියාවලියක ප්‍රකාශනයක් පමණයි. ප්‍රශ්නයට පිළිතුර ඉතාමත් කෙටියෙන් නිශ්චිතව දක්වන්නේනම් පිළිතුර මෙයයි. මෙය මෙසේ සිදු වූයේ ඇයි?
සෝවියට් ආණ්ඩුව පරාජය සිතන ආකාරයට තාවකාලික පරාජයක් පමණි. එමෙන්ම සෝවියට් දේශය තුළ සමාජවාදය බිඳ  බිඳවැටුනේ ඇයි?
මන්දයත් ආණ්ඩුව තවදුරටත් සෝවියට් නොවුණා සේම පක්ෂයද තවදුරටත් කොමියුනිස්ට් පක්ෂයක් නොවීමයි. සිදු වූ වැරදි සහ අතපසුවීම් සියල්ල ගොර්බචොෆ්ගේ කාලයටත් ගොර්බචොෆ්ටත් පැටවීම නොකළ යුතුයි. වැරදීම් විශාල වශයෙන් ඒකරාශී වී තිබුණා න්‍යායාත්මක වැරදි දේශපාලන වැරදි ආර්ථික වැරදි ඒකරාශී වී තිබුණා. මෙම වැරදීම් සහ අඩුපාඩු පිළිබඳව ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයේ සිය වන සංවත්සරය වෙනුවෙන් අප පක්ෂය විසින් සකස් කරන ලද වැඩසටහනේ සහ එමගින් පළ කරන ලද වාර්තාවේ හොඳින් සඳහන් වෙනවා.
නමුත් මෙහිදී ප්‍රශ්නය වන්නේ ඔහු සමස්ත මහ ජනතාවක් රැවැට්ටුවේ කෙසේද යන්නයි,
ජනතාව එයට එරෙහිව නැගී සිටියේ නැත්තේ ඇයිද යන්නයි.
එම කරුණ විශ්ලේෂණය කර ගත යුතුයි.
පළමුකොටම අවස්ථාවාදීන් සහ ප්‍රති විප්ලවවාදීන් රහසය ලෙස කටයුතු කළා පමණක් නොව ඔවුන් තම කටයුතු සියල්ල සිදුකළේ, සමාජවාදය වර්ධනය කිරීම, සමාජවාදය මානුෂික මුහුණුවරක් සහිතව ගොඩනැගීම, සුභසාධනය වර්ධනය කිරීම සඳහා සමාජවාදී වෙළඳපොළ ක්‍රම යොදා ගැනීම පක්ෂ ජීවිතය තුළ ලෙනින්වාදී ගුණාංග යළි මතු කර ගැනීම ආදී සටන් පාඨවලට මුවාවෙමිනුයි. ගොර්බචොෆ් අවසන් හුස්ම පොද දක්වා කොමිනිස්ට්වාදියෙකු ලෙස ජීවත් වන්නේ යෑයි ප්‍රකාශ වූ ආකාරය පිළිබඳ මා මෙයට පෙර සඳහන් කළා. එක්දහස් නවසිය අසූ නමයේදී යෙල්සින්ද එලෙසම කළා. ඔහු සෝවියට් සමූහාණ්ඩුවේ මහජන නියෝජිතයන් තේරීමේ මැතිවරණයට තරග කරන ලද්දේ මොස්කව් අංක එක දිස්ත්‍රික්කයෙනි. එහිදී මාධ්‍යවේදීන් ඔහුගෙන් තම පරමාදර්ශී දේශපාලන චරිතය හා පරමාදර්ශි පුද්ගලයා කවරෙක් දැයි විමසනු ලැබුවා. යෙල්සින් කිසිදු සැකයකින් තොරව Lenin යැයි පිළිතුරු දුන්නා. අපට මෙහිදී පැහැදිලිව පේන කරුණක් වන්නේ සෝවියට් දේශය ධනේශ්වර රටක් බවට පත් වූයේ සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය යටතේම සමාජවාදී සටන් පාඨ යටතේම බවයි. ඔවුන් තම වෙස්මුහුණු අත්හරින ලද්දේ හදිසි අවස්ථා කමිටුව පිහිටවීමෙන් හා ප්‍රතිවිප්ලවකාරී කුමන්ත්‍රණය 1991දී සිදු කිරීමෙන් පසුවයි. රතු ධජය පහත හෙළනු ලැබුවා. සමාජවාදී සටන් පාඨ අත්හැර දමනු ලැබුවා .යෙල්සින් විසින්ම සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ කටයුතු තහනම් කරන ලැබුවා.
මේ නිසා අප පැමිණිය යුතු නිගමනය වන්නේ අප විසින් ජනතාවට වචන පමණක් විශ්වාස නොකරන ලෙසත් දේශපාලනය තේරුම් ගන්නා ලෙසත් දේශපාලනයට සහභාගි වන ලෙසත් තම අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරන ලෙසත් ඉල්ලීමයි. නමුත් අද වුවද තමන් කොමියුනිස්ට්වාදී යැයි හඳුන්වාගන්නා පක්ෂ නායකයන්ගේ කතා ඇසෙන විට ඔවුන්ගේ පැහැදිලි කිරීම් දෙස බලන විට පැහැදිලි වන්නේ එකම වරද නරක දූෂිත පෞද්ගලීකරණය බවයි. ඔවුන් සමහරෙක් අනුව එම අවස්ථාවේදී සාධාරණව හා නිවරදිව පුද්ගලීකරණය කළ හැකිව තිබූ බවත් පෞද්ගලිකවම සොයා බැලීම් මගින් පරීක්ෂා කළ හැකිව තිබූ බවත් ප්‍රකාශ කෙරෙනවා. එවන් විකල්පයක් තිබූ බව සෝවියට් කොමියුනිස්ට් පක්ෂයෙ මධ්‍යම කාරක සභාවේ, ගෙනඩි සුගානොව්ගේ නායකත්වයෙන් යුත්, සමහර අංශවලින් සලකා බැලූ බව පැහැදිලි කරුණක්. හරියට ඔවුන් ඕනෑම ආකාරයක පෞද්ගලීකරණය ධනවාදය ස්ථාපිත කිරීමේ ක්‍රියාවලියට උදව් කරන බව නොදන්නවා මෙනුයි.
මේ නිසා කොමියුනිස්ට් පක්ෂයක කොමියුනිස්ට් හරය රැක ගැනීමේ අරගලය කොමියුනිස්ට්වාදීන් විසින් කිසිදා අත්හැරිය යුතු නැති අත් හැරිය නොහැකි අරගලයක්.

**Left :- සෝවියට් දේශය බිඳ වැටීමේ චෝදනාව ගොර්බචොෆ්ට පමණක් පැවරිය හැකිද? ඔබද ඇතුළු මිලියන විස්සක් පමණ වූ සෝවියට් කොමියුනිස්ට් පක්ෂ සාමාජිකයන් එය වැළැක්වීම සඳහා කරන ලද කටයුතු මොනවාද? ඒවා අසාර්ථක වුයේ ඇයි?**

**ටුල්කින් සහෝදරයා:-**
ගොර්බචොෆ්ව විවේචනය කිරීම හා චෝදනා කිරීම කළ හැකි මෙන්ම කළ යුතුයි. එසේ වුවද සම්පූර්ණ බිඳවැටීමේ වගකීම ඔහුට හෝ කුමන්ත්‍රණකාරී බලවේගවලට පැටවීම ඉතා බරපතළ වැරැද්දක්. ලෙනින් අපට ඉගැන්වූ පරිදි" අපව විනාශ කළ හැකි අපගේම වැරදිවලට මිස අන් කිසිවකට නොවේ."
සමාජවාදී සෝවියට් සංගමය තුළ සමාජවාදය බිඳ වැටීමට බලපාන ලද්දේ ප්‍රධාන වශයෙන් අප විසින්ම සිදුකළ අඩුපාඩුයි. එසේ වුවද සෝවියට් ජනතාව විසින් පෙන්වන ලද සාර්ථකත්වයේ බලපෑම මුළු මහත් ලෝක ඉතිහාසය එම ගමනට පැහැදිලි බලපෑමක් සිදු කළා තරම් නුෂ්‍ය වර්ගයාට එම මාවත හැර වෙනත් මාවතක් නොමැති බව ඉතා පැහැදිලිව පෙන්නුම් කරනු ලැබුවා. එමෙන්ම සෝවියට් කොමියුනිස්ට්වරු තමන්ගේ ස්ථාවරයන් අරගලයකින් තොරව අත්හැරියේ යැයි කිසිවෙකුත් විශ්වාස නොකළ යුතුයි. සෝවියට් කොමියුනිස්ට් පක්ෂය තුළ ගොර්බචොෆ්වාදයට එරෙහිව පැහැදිලි අරගලයක් තිබුණා. නිශ්චිතවම සඳහන් කළහොත් පක්ෂය දියාරු කර හැරීමට එරෙහිව ප්‍රබල අරගලයන් පක්ෂය තුළ තිබුණා.
නමුත් අවාසනාවකට පක්ෂයේ මිලියන විස්සක් වූ නිල සාමාජිකත්වය පක්ෂ සැබෑ ශක්තිය පිළිබඳ නිවැරදි ප්‍රකාශනයක් තිබුණේ නැහැ. පක්ෂය තුළ තිබූ කොමියුනිස්ට් හරය තවදුරටත් ඉතිරිව තිබුණේ නැහැ. ඔහු කොමියුනිස්ට් පක්ෂයේ 28 වැනි සමුළුව ආර්ථික ක්‍රියාවලිය පිළිබඳ කොමියුනිස්ට් මූලාරම්භක ව්‍යාපාරයේ නියෝජිත මහාචාර්ය ඒ.ඒ. සර්ජියෙව් සමුළුවේ තම කතාව ආරම්භ කළේ මේ ආකාරටයි.
"කොමියුනිස්ට්වාදී සහෝදරවරුනි, නිල මාක්ස්වාදී සහෝදරවරුනි, ඒ සමගම සමාජවාදීනි, වාමාංශික හා දක්ෂිණාංශික සමාජ



> **"ගොර්බචොෆ්ව විවේචනය කිරීම හා චෝදනා කිරීම කළ හැකි මෙන්ම කළ යුතුය. එසේ වුවද සම්පූර්ණ බිඳවැටීමේ වගකීම ඔහුට හෝ කුමන්ත්‍රණකාරී බලවේගවලට පැටවීම ඉතා බරපතළ වැරැද්දක් වනු ඇත. ලෙනින් අපට ඉගැන්වූ පරිදි "අපව විනාශ කළ හැකි අපගේම වැරදිවලට මිස අන් කිසිවකට නොවේ."**

ප්‍රජාතන්ත්‍රිකයනි සහ පක්ෂයේ අනෙකුත් සාමාජිකයනි..."
(1990 ජූලි 06 - සභාව සිනා සයුරක ගිලුණු අතරම සුවිශාල අත්පොළසන් නාදයක්ද මතු වුණා.)
සැබැවින්ම මෙය විහිළුවක්. 1990න් පසුව සහ යෙල්සින් විසින් සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ කටයුතු තහනම් කිරීමෙන් පසුව සියලුම ධනේශ්වර හා බලවේගවල සහ ආයතනවල නායකත්වය ගෙන කටයුතු කළේ හිටපු සෝවියට් කොමියුනිස්ට් පක්ෂ සාමාජිකයනුයි. 1991 රුසියාවේ පැවති ජනාධිපතිවරණය සඳහා යෙල්සින්ට විරුද්ධව කොමියුනිස්ට් පක්ෂයේ අපේක්ෂකයෙක් ඉදිරිපත් කිරීමට අප විසින් සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ රුසියානු ෆෙඩරේෂණ ශාඛාව වන රුසියානු කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාව තුළ විශාල අරගලයක් කළා. නමුත් පක්ෂයේ අවස්ථාවාදී නායකත්වය එයටම ගැලපෙන සූත්‍රයක් ගෙන ආවා. එනම් විවිධ පක්ෂවලින් ඉදිරිපත් වී තිබූ සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකත්වය දරන අපේක්ෂකයන්ට එනම් ජනාධිපති සහ උප ජනාධිපති අපේක්ෂකයන්ට සහයෝගය ලබා දිය යුතුය යන තීන්දුවයි. ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් වී සිටි ජනාධිපති සහ උප ජනාධිපති අපේක්ෂකයන් සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයන් වූ අතර යෙල්සින් සහ සිරිනොව්ස්කිද ඒ වනවිටත් කොමියුනිස්ට් පක්ෂ සාමාජිකයන්ව සිටියා.
මෙය එතරම් පුදුම සහගත තත්වයක් නොවේ. පක්ෂය 28 වැනි සමුළුව පවත්වන අවස්ථාවේදී Kremlin මන්දිරය ඉදිරිපිට අපගේ සහෝදරවරුන් සටන් පාඨ පුවරු රැගත් පිකටින් උද්ඝෝෂණ සිදු කළා. ඉන් එක පෝස්ටරයක තිබුණේ "සෝවියට් කොමියුනිස්ට් පක්ෂය කොමියුනිස්ට් පක්ෂයක් කරමු" යන සටන්පාඨයයි. ප්‍රතිවිප්ලවය නතර කිරීමට අපට නොහැකි වුණා. කෙසේ වුවද කොමියුනිස්ට්වාදීන්ට සහ ජනතාවට කුමන්ත්‍රණයක් සිදුවෙමින් පවතින

බවත් එයට එරෙහිව සටන් කිරීමට සූදානම් යුතු බවටත් අනතුරු ඇඟවීමට අප සමත් වුණා.
අප පක්ෂය තුළ කොමියුනිස්ට්වරුන්ගේ අරටුවක් කොමියුනිස්ට් මූලාරම්භක ව්‍යාපාරය නමින් සූදානම් කළා. 1991 අගෝස්තුවේදී යෙල්සින් විසින් සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ සියලු කටයුතු තහනම් කිරීමෙන් පසු 1991 නොවැම්බරයේ කොමියුනිස්ට් මූලාරම්භක ව්‍යාපාරය විසින් රුසියානු කම්කරු කොමියුනිස්ට් පක්ෂය පිහිටුවන ලැබුවා. ධනේශ්වර රුසියාවේ වත්මන් කාලය තුළ පිහිටුවන ලද ඒ ආකාරයේ එකම පක්ෂය එයයි. රුසියානු ෆෙඩරේෂණයේ කොමියුනිස්ට් පක්ෂය සුගානොව් විසින් පිහිටුවන ලද්දේ 1993 පමණ කාලයේදීයි.

**Left :- ඔබට කාලයේ පිටුපසට යාමට ලැබුණොත් ඔබ සෝවියට් සමාජවාදය ආරක්ෂා කිරීම සඳහා, ගොඩනැගීම සඳහා යළි අරඹන තැන කුමක්ද? ඔබ සිදුකරන ප්‍රධාන වෙනස්කම් මොනවාද?**

**ටුල්කින් සහෝදරයා**:- ඇත්තටම මේක පිළිතුරු දෙන්න අමාරු ප්‍රශ්නයක්. ඒකට හේතුව කාලයේ පිටුපසට යන්න බැරි නිසා නොවෙයි. මොකද ඉතිහාසයේ ඉතාමත්ම නිශ්චිත මොහොතකට පවා නිශ්චිත අවස්ථාවකට පවා සදා නිම කරපු වට්ටෝරුගත විසඳුම් නොමැති නිසයි.
සෑම අවස්ථාවකටම ගැළපෙන සූත්‍රයක් නොමැති බව ලෙනින් ඉතාම පැහැදිලිව ප්‍රකාශ කළා. ඔබ ඔබේ උරහිස මත ඇති හිස පාවිච්චි කර සමාජවාදය ගොඩනැගීමේ ප්‍රධාන මූලධර්ම සහ නියමයන් යොදාගෙන ඔබ විසින්ම එය කරගත යුතුයි. මම රුසියානු පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් සිටියදී 2007 වර්ෂයේදී මට අවස්ථාවක් ලැබුණා හියුගෝ චාවේස් සමග සංවාදයකට සම්බන්ධ වන්න ඔහුගෙන් ප්‍රශ්නයක් අහන්නත්. ඔහු ඒ වන විට සමාජවාදී පක්ෂයක් ගොඩනගමින් සිටි අතරම ඒ ඉතාමත්ම විශාල වනු ඇති බවත් කොමියුනිස්ට්වාදීන් පවා එයට එකතු විය යුතු යයි ඔහු විශ්වාස කරන බවත් ප්‍රකාශ කළා. මේ කරුණ මත පදනම් වෙලා මම චාවේස්ගෙන් ප්‍රශ්නයක් ඇහුවා. මම අහපු ප්‍රශ්නය වුණේ ඉතාම විශාල පක්ෂයක් ගොඩනැගීම පිළිබඳ අවධානය යොමු කිරීම ඉතාම හොඳ වුවත් නිවැරදි විද්‍යාත්මක වැඩපිළිවෙළක් නොමැති වුණොත් එය විනාශ වී යා හැකි බවයි. සමාජවාදය ගොඩනැගීමේ මාවතේ ඉතා දිගු දුරක් සෝවියට් සංගමයත්, සෝවියට් කොමියුනිස්ට් පක්ෂයත් ගමන් කළද සිදු වූ පීලිපැනීම් සහ අත්වැරදීම් නිසා සෝවියට් සංගමය පරාජයට පත්වුණා. ඔබ කොපමණ ප්‍රමාණයකට මෙම අනතුර තේරුම් අරගෙන තිබෙනවාද, ඔබේ ක්‍රියාකාරකම් පදනම් කර ඇත්තේ කුමන පදනමක් මතද කුමන මූලික නියමයන් මතද සමාජවාදය ගොඩනැගීමේ අත්දැකීම් හැරුණුකොට ඔබේ වැඩපිළිවෙල පදනම් වන්නේ කුමක් මතද?
මම මෙහිදී එක් කරුණක් පැහැදිලි කළ යුතුයි. චාවේස් මගේ ප්‍රශ්නය සහ ඒ තුළ ගැබ්වූ මූලික හරය හොඳින් තේරුම් ගත්තා පමණක් නොව ඔහුට සුපුරුදු ආකර්ෂණීය, පැහැදිලි සහ ඉතාමත් නිවැරදි ආකාරයට පිළිතුරු ලබා දුන්නා.

ඔහු පිළිතුරු දීම ආරම්භ කළේ මේ ආකාරයට. ඔබ කියුබානු අත්දැකීම්වලින් පිට උදාහරණ ලබා දෙන ලෙස කිව්වත් මම ෆිදෙල්ගෙන්ම පටන් ගන්නම්. මට මතකයි එක් අවස්ථාවකදී මාධ්‍යවේදීන් ෆිදෙල්ගෙන් ප්‍රශ්න කරපු ඒක තමයි කියුබානු විප්ලවයේ ආරම්භක කාලෙදී ඔහු විසින් සිදුකරන ලද ප්‍රධානම වැරැද්ද කුමක්ද කියන එක. ෆිදෙල් එයට මෙහෙම පිළිතුරු දුන්නා.

"ඔව් සත්‍ය වශයෙන්ම මගෙන් වැරදි වුණා. ඒ වැරදි අතරින් ප්‍රධානම වරදක් වුණේ මම ඒ කාලේ විශ්වාස කරා ලෝකෙ කවුරුහරි කෙනෙක් හරියටම සමාජවාදය ගොඩනඟන්නෙ කොහොමද කියලා දන්නවා කියලා!"

ඊළඟට චාවෙස් පැහැදිලි කළා ඔහු විප්ලවකාරී ක්‍රියාකාරීත්වයට ආවෙ කොහොමද කියන එකත්, ඔහුගේ ජීවිතේ පළවෙනි වතාවට ඔහු සැබෑ ලෙසම බිය යනු කුමක්ද යන්න අත් දැක්ක ආකාරය පිළිබඳවත් චාවේස් මෙහෙම කිවුවා.

"මම සොල්දාදුවෙක්! හමුදාව තුළ කැරැල්ලක් ඇති කළ පුද්ගලයෙක්! සිරගෙට නියම වූ පුද්ගලයෙක්! ඉන් පස්සෙ හිරෙන් නිදහස් වුණාට පස්සේ මට ජනාධිපතිවරණයට ඉදිරිපත් වන ලෙස බොහෝ දෙනා පෙළඹෙව්වා! ඡන්දයට ඉදිරිපත් වුණා! දින්නා!!
ආයෙත් කුමන්ත්‍රණයකින් මාව සිරගත කළා. ජනතාව මිලියන ගණනින් පාරට බැහැලා උද්ඝෝෂණය කළා. මාව පැහැරගෙන ගිය ඇමරිකානු ගැති බලධාරීන්ට මාව නිදහස් කරන්න සිද්ධ වුණා!
මාව නිදහස් කළාට පස්සේ තිබුණු ජන රැලියට මම යනකොට මා ඉදිරිපිට මිලියන ගණන් ජනතාව

පොදි කකා හිටියා.
අන්න ඒ අවස්ථාවේදී මම බය වුණා! මම සොල්දාදුවෙක් මම මැරෙන්න බය නැහැ මම ඕන වෙලාවක ජීවිතේ දෙන්න සූදානම්! ඒත් මෙතන මම ඉදිරිපිට ලක්ෂ සංඛ්‍යාත මිනිසුන් ප්‍රමාණයක් ඔවුන්ගේ ජීවිත මවිසින් වෙනස් කරනු ඇතැයි කියන විශ්වාසයෙන් මා දෙස බලා සිටිනවා. මාව විශ්වාස කරන්න. එය සිදු කළ හැක්කේ කෙසේ දැයි කිසිදු අදහසක් මට තිබුණේ නෑ. මට ඔවුන්ගේ බලාපොරොත්තුවලට සාධාරණය ඉටු කිරීමට නොහැකි වනු ඇති බවත්, මම ඔවුන්ගේ විශ්වාසය පළුදු කරනු ඇති බවත් මට සිතුණා. මම එයින් බිය වුණා."

මේ සිදුවීමෙන් පස්සේ චාවේස් විසින් කියුබාවට ආරාධනාවක් යවනු ලැබුවා. කියුබානු කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ මාසයක පමණ වැඩසටහනකින් පසු කැරලිකරුවෙක් ලෙස එම වැඩ සටහනට ඇතුළත් වූ චාවේස් සමාජවාදියෙක් ලෙස පිටව ගියා.

මා මෙය දෙබස් සහිතවම ඉදිරිපත් කළේ අපගේ සහෝදරවරුන්ගේ අවධානයට හොඳින්ම ලබාගන්න කොමියුනිස්ට්වාදීන් වන අප ගොඩනැඟීමට යන්නේ කුමක්ද යන්න එය ගොඩනඟන්නේ කෙසේද යන්න දැන සිටිය යුතුයි.

ඔක්තෝබර් විප්ලවයට වසර සියයක් පිරීම නිමිත්තෙන් අපගේ පක්ෂය විසින් සංවිධානය කරන ලද වාර්තාවේ එය මෙසේ සඳහන් වෙනවා.
"අප සතුව තිබූ සමාජවාදය කුමක් වැනිද? එය කෙසේ විය යුතුව තිබුණිද? යන ඉතා වැදගත් ප්‍රශ්න දෙකයි."
මාක්ස්වාදී න්‍යාය කිසි විටෙක සමාජය පිළිබඳව වට්ටෝරු පරමාදර්ශී න්‍යාය යෝජනා කර



> **ලෙනින්ගෙ නිර්වචනය අනුව දේශපාලන ක්ෂේත්‍රයේ දී සමාජවාදය යනු පංති විනාශ කිරීමයි. එනම් සමාජවාදය යනු පංති අතර වෙනස්කම් අහෝසි කිරීම ඉලක්ක කරගත්, කායික සහ මානසික ශ්‍රමය අතර වෙනස්කම් අහෝසි කිරීම ඉලක්ක කරගත්, එකකි.**

නැහැ.
මාක්ස් සහ එංගල්ස් ඒ වෙනුවට ප්‍රකාශ කළේ කොමියුනිස්ට් ක්‍රමය යනු තහවුරු කළ යුතු ව්‍යුහයක් හෝ තත්වයක් නොවන බවයි. ඔවුන්ට අනුව කොමියුනිස්ට් ක්‍රමය යනු සමාජයේ සංවර්ධනයට බාධා කරන අසාධාරණ තත්වය වෙනස් කරන, එය අහෝසි කරන සැබෑ ව්‍යාපාරයක් බවයි.

සමාජවාදය එය පැන නගින ධනවාදයේ ස්වරූපය හා පවතින කොන්දේසි මත සකස් වන එකක් විය හැකියි. සමාජවාදය තුළදී පංති අරගලය නතර වන්නේ නැහැ. අලුත් ආකාර ගන්නවා පමණයි. එම පංති අරගලය සමාජවාදය තුළදී නිර්ධන පාංතික කොමියුනිස්ට්වාදී ප්‍රවණතාවය සහ සුළු ධනපති පුද්ගලික දේපළ ප්‍රවණතාව අතර ගැටුමක් ලෙස ඉදිරියට ගමන් කරනවා. සමාජවාදය තුළ ඇති අනිවාර්ය ලක්ෂණයක් වන්නේ නිර්ධන පංති ආඥාදායකත්වය ක්‍රියාත්මක කිරීමත් එමඟින් නිර්ධන පාංතික ප්‍රවණතාවයේ ජයග්‍රහණය සහතික කිරීමය.

ලෙනින්ගෙ නිර්වචනය අනුව දේශපාලන ක්ෂේත්‍රයේදී සමාජවාදය යනු පංති විනාශ කිරීමයි. එනම් සමාජවාදය යනු පංති අතර වෙනස්කම් අහෝසි කිරීම ඉලක්ක කරගත්, කායික සහ මානසික ශ්‍රමය අතර වෙනස්කම් අහෝසි කිරීම ඉලක්ක කරගත් එකක්. ලෙනින් විසින් පැහැදිලි කළ පරිදි,
"ප්‍රාග්ධනයේ ආධිපත්‍යය පැරදවීමෙන් පසු ධනේශ්වර රාජ්‍යය විනාශ කිරීමෙන් පසු,
නිර්ධන පංති ආඥාදායකත්වය ස්ථාපිත කිරීමෙන් පසු,
ඒවාට සාපේක්ෂව
පංති විනාශ කිරීම යනු දිගුකාලීන දුෂ්කර අඛණ්ඩ අරගලයකි."

ආර්ථික ක්ෂේත්‍රයේදී සමාජවාදය යනු සමාජීය නිෂ්පාදනය සඳහා වෙළෙඳපොළ උපකරණවල බලපෑම අහෝසි කිරීමය.

සදාචාරමය වශයෙන් සමාජවාදය යනු හැම කෙනාගෙම නිදහස් සංවර්ධනය සඳහා වඩාත් වැඩි අවස්ථාවන් ලබා දීමයි."

අපගේ සාකච්ඡාව අපගේ මධ්‍යම කාරක සභාව විසින් සකස් කරන ලද ඉහත වාර්තාවේ උපුටා ගැනීමකින් අවසන් කිරීමට මා කැමතියි.

"අපගේ වැඩපිළිවෙළ සමන්විත වන්නේ කම්කරුවන් තුළින්ම අරගලය වර්ධනය කිරීමයි. යමක් ලබාගත හැක්කේ ආයාචනා කිරීමෙන් නොව සටන් කිරීමෙන් පමණි. අප ජනතාව තුළින් සටන්කාමීන් මිස පෙත්සම්කරුවන් බිහි කිරීමට බලාපොරොත්තු නොවෙමු."

විශිෂ්ට හා ආකර්ෂණීය සෝවියට් කවියකු වන යෙව්ගෙනි ඩොල්මටොව්ස්කි විසින් රචිත Hands of Guevara කවියේ මෙසේ සඳහන් වෙනවා.

"අරගලය තුළම පසුබැසීම් තිබේ එහෙත් ඒ පසුබැසීම්වලට ළංවී බැලුවහොත් ජයග්‍රහණයේ අංශු වේදනා බරිතව පතුලේ ගුළි වී ඇති බව ඔබට පෙනෙනු ඇත. ඒවා හෙට දිනයේ ගින්න අවුළා දමනු නියතය"

අප මේ මොහොතේදී ඉතාම දරුණුම ආකාරයේ ප්‍රතිවිප්ලවකාරී ක්‍රියාවලට මුහුණ දෙමු. නමුත් අපි ස්වයං පාලනයක් සහිතව විප්ලවයේ දැනුම සහ විප්ලවයේ ගින්න නිවැරදි මොහොතේදී ජනතාව නැමති අංශු තුළ ඇවිළවීම වෙනුවෙන් සටන් කළ යුතුයි.
ලෙනින් ප්‍රකාශ කළ පරිදි විප්ලවය සිදු වේද නැද්ද යන්න සහමුලින් අප මත තීරණය නොවේ. අපි අපේ කාර්යය ඉටු කරමු. එය කිසිදා අපතේ නො යනු ඇත. අපගේ සිතීමේදී ක්‍රියාවේදී හැමවිටම ලෙනින් වෙතටත් බොල්ෂෙවික් පක්ෂය වෙතටත් ගමන් කිරීමට අදිටන් කරගනිමු.

ජර්මනියේ තිබෙන මාක්ස්ගේ සහ එංගල්ස්ගේ ස්මාරකයක ජර්මන් කම්කරුවන් මෙසේ ලියා තිබේ. "කණගාටුයි සහෝදරයා ඊළඟ සැරේ මීට හොඳට මේක කරනවා" අපිද එය විශ්වාස කරමු!



සංස්කරණය: තලතා ගුණසේකර



# ලිය කවි කළල..

කෞශල්‍යා ජයලත්
('සහස් කඳු තරණ මංපෙත්' කාව්‍ය සංග්‍රහය)

අමු මිරිස් ලූනු ලියනාතර
අඹ මාළු දැලි පෙරි අත්වල
තැලී ඇඹරී ගැබ් නැසී
ලිය කවි කළල අපමණ

කිලිටි රෙදි කඳුවල සැඟවුණ
කොසු ඉදල දැවට අතු ගෑවුණ
වදන් පිහි තුඩු අග ඇමිණුන
වදන් කවි පොත් කොපමණ

හාවා හඳ දකින්නා සේ
කවක් පණ ගසනාතර
"අම්මී ඇක්කා" වදනින
සහස් කවි මල දියෙහි සේදින

සැමියන් සැක සැතින් සිදුරුව
රුහිරු වගුරා දිවි හළ
කවි ඉලන්දාරී කැළ
සරති හද තුළ අඳුරු ගුල්වල

කලාතුරකින් මල්වර
කවි ළමිස්සියෙකුගෙ ඉඟ සුඟ
පුම පඬි සභා මැද
නිරුවත් වීම උරුමය

ජනිත වීමම කවි බිළින්දෙකු
ඉතිරි හද විළිරුදා විඳ විඳ
අරුම කවියකි වියතුනි
සිඳිනු ගෙල කිම සැතකිනි?

# ඔයා
## එනවද මාත් එක්ක..

ඔයා එනවද මාත් එක්ක
වෙන මාසෙකට පැනලා යන්න
ඔයා එනවද මාත් එක්ක
වෙන අවුරුද්දකට පැනලා යන්න
ඔයා එනවද මාත් එක්ක
වෙන සියවසකට පැනලා යන්න

අපිට බැරිවෙන එකක් නෑ

පෘථිවියෙන් ඈතට
ආලෝක වර්ෂ කීපයක දුරකින්
වෙනත් ආවාටයක
උපදින්න

හැමෝගෙම ඇස්වලින් හැංගෙ
න්න


මගේ අත තදින් අල්ල ගන්න
එන්න
(මේ මිනිස්සුන්ට වෙන වැඩ
නැද්ද ඇත්තටම)
මේ කහ ඉර තරණය කරන්න

නිදි වගේ පෙනුනට
මේ නිහඬ නගරයත්
හැමදාම ඉන්නේ ඇස් ඇරගෙන

හවස් වෙනකම් ඉවසමු
බාගදා අපිට පුළුවන් වෙයි

අපේම හෙවණැලි අස්සෙම
වුණාත්
හැංගෙන්න.

**පවන් අංජන**
**(වළාකුළු නිම්නයට එන්න)**



# ලැවැන්ඩර
## සුබ සිහින..

විසල් නිල්මිණි  අහස වලාරැලි
හිම උනන
ලකල් තුරුපත්  ළපටි සිතැඟි
රේඛා අඳින
සියල් සන්තක සිහින මද පවන
මුදු කරන
ලැවැන්ඩර මල්ගොමුව
කෝ කොහිද  ගුමු ගුමුව

සීතලද මාර්යා මේ දැදුරු හිම
පතන?
පා නගන සූර්යයා හීත සිතිවිලි
මුදන
මිහිදුමේ දෝංකාරෙන් බියව
පොර බදන
ලාක් කූජන  නැගෙන  අරුමයකි
වන අරණ

උඩු හුළඟ උඩුකුරුව
හෙමිහෙමින් හැමුවේ
මකරන්ද  වගුරුවන මල්
මොහොත හමුවේ
වසත් කල පොසි කැකුළු
දෑසටම යොමුවේ
මාර්යා කිම තවම ලැවැන්ඩර
ගොමුවේ?

**ඩිල්ෂානි චතුරිකා දාබරේ**
**(පෙමාතුර චෙරි කුසුම)**

# චෙස් ලෑල්ලක ජීවිත..

උකස් කර ජීවිතේ ඔක්කොම රකින්නට
රජුගේ සත්තම දිවි දුන් 'පෝන්වරු'
වෙනුවට හැඬුමක හඬද නොඅසන
ආචාර වෙඩිමුර මොකටද?
මිතුරන් ඉදිරියට පිය මැන පිරිත් පැන්
ඉහින එක ඇරුණම සතුරන්ට එව කියා
දවසක ඇත්ත බණ පද දේශනා කළ
'බිෂොප්වරු' කවුරුවත් හිටියද?

'කිං' - 'කාසලින්' කෙරුවම
කෙරුමෙක් වගේ පෙනුණාට
දොරටුපාලයෝ රජ වෙන
මේ වගේ පුංචි දූවක
කාව රවටා ගන්නද?

කිරුළ හිස හිඳුවාගෙන
කඩුව කොපුවෙහි ලාගෙන
'කිංලා' හැංගෙනු දුටුවේද?

එවන් නපුරුම තැන්වල
ආදරේ ලෝකෙන්ම හංගන
'නයිට්වරු' විතරමයි හිටියේ
'ක්වීන්' බේරා ගන්නට

**චලක ප්‍රමුදිත ලුණුවිලගේ**
**(සමනළ කවුළු තටු)**

# සතුටින්ම විඳින හැටි දුක..

ඉස්සරම දවසක අපි බැඳපු අලුතක බල බලා විහාරේ සිතුවම්
උඹ කිව්ව හැටි තාම මතකයි ජයේ බලන්න යසෝදරා
දේවීගේ ඇස්වල තෙත
බල බලා වඩින හැටි බුදු හිමි
ඒත් හිනාවෙන හැටි තොල් දෙක
ඒකයි මම කියන්නෙ
ගෑනු විතරයි දන්නේ
"සතුටින්ම ඉවසන්න දුක"

ආයෙමින් දවසක් ලොකු පුතා එන්නත් කලියෙන්
නොපිපීම පරවුණ තරු කැකුළ ගැන දැනගෙන හංගා
ගෙන උඹේ කඳුළු,
පිස දැමූ හැටි මගේ කඳුළු
ඇත්තමයි
ඉන්පසු දී දරු පැටවු තුන් දෙනෙක්
මැකූ හැටි ඒ දුක


ඔව් ඇත්ත.
ගෑනු විතරයි දන්නේ සතුටකට හරවන්න දුක
ඉතින් ඉන් පස්සෙ
අවුරුදුම මහ හුඟක්
ඉරටත් හොරෙන් ඇහැරී
කරමින් මෙහෙවර නෙක
නොදී මට වෙහෙසක්
නොහෙළා එක කඳුළක්
උඹම තනියෙන් විඳි හැටි දුක
අනන්ත හිතී ඇත මට
ගෑනු විතරයි දන්නෙ
සතුටින් විඳින්න දුක
ඉනික්බිති.

කුරුලු පැටවුන් කැදලි තනාගෙන ඉගිලුණී පළාතම
සෙවණ කළ මහා රූස්ස ගහක් පෙරළුණී.
ඉතින් දැන් නිදි නේන රෑක
සතුටු මතකෙන් ඇවිදින්න තනිකම දවසින් දවස
පැටවු ගහන විට හිනැහෙමින් ඉවසන්න

උඹේ සුවඳ වැටී ඇති තැන්වල කඳුළු නොහෙළා
ඉන්න,
යන්න කලියෙන් අහගන්න බැරි වුණා මට,
"සතුටෙන් විඳින හැටි
සතුටකට හරවන හැටි දුක"

**මේබලා උදාරි ලියනගේ**
**(හෙටත් ලියවිය යුතුය තව කවි)**





# 2030දී සඳ මතුපිට මිනිස් කඳවුරක්..

*වෛද්‍ය සුසිල් රණසිංහ*

"Passengers" යනු 2016 වසරේ දී නිකුත් වූ රසවත් විද්‍යා ප්‍රබන්ධයක් තේමාව කර ගත් ඇමෙරිකානු චිත්‍රපටියකි. පෘථිවියේ සිට ආලෝක වර්ෂ 60ක දුරින් පිහිටි හෝම්ස්ටෙඩ් "Homestead" නම් මිනිස් ජනාවාසයට සුදුසු ග්‍රහලෝකය කරා පෘථිවියේ සිට මඟීන් ප්‍රවාහනය කරමින් සිටින අභ්‍යවකාශ යානාවක් තුළ සිදුවන කතාවක් මෙහි දිගහැරේ. මුළු ගමනට වසර 120ක් ගතවේ. යානාව තුළ මඟීන් 5000කි. මේ මඟීන් සියලුදෙනා කුටීර තුළ ශිශිරතරණය නොහොත් Hybernate තත්වයට පත්කරනු ලැබ තිබේ. එහෙයින් ආලෝක වර්ෂ 60ක් එහා නව ගමනාන්තයේ ගොඩබසින තෙක් ඔවුන් වයසට නොයනු ඇත. යානාවේ සිටින මඟීන් වසර 120 තුළදීම බලාගැනීම, බලශක්තිය නිපදවා ගැනීම, අනතුරු හඳුනාගැනීම, යානාවේ අභ්‍යන්තර පද්ධතියේ සිදුවෙන බිඳවැටීම් සොයාගැනීම හා ඒවා අලුත්වැඩියා කරගැනීම ආදී සෑම අතින්ම යානාව සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වේ. එහෙත් වසර 120ක ගමනේ 90 වන වසරේදී යානාවේ පද්ධතියේ සිදුවන යම් දෝෂයක් නිසා අනපේක්ෂිතව එක් මඟියෙක් ස්වයංක්‍රීයවම ප්‍රකෘති තත්වයට පත්වේ.

විද්‍යා ප්‍රබන්ධකරණයේ අද්විතීය රචකයෙකු වන ආතර් සී. ක්ලාක් මහතා විසින් රචිත 3001 කෘතියේ ගෙනහැර දක්වන කතාව තුළ මිනිසුන් බ්‍රහස්පතී ග්‍රහයාගේ චන්ද්‍රයන් වන ගැනිමීඩ් (Ganymede) සහ කැලිස්ටෝ (Callisto) යන ග්‍රහලෝකයන්හි ජනාවාස තනා තිබේ. එමෙන්ම පෘථිවි මතුපිට සිට එනම් සමකයේ සිට පෘථිවි කක්ෂය වෙත ඉදි කෙරුන සෝපාන (Space elevator) හතරක් තනා තිබේ. රොකට්ටු භාවිත නොකොට අභ්‍යවකාශ යානා පෘථිවි කක්ෂය වෙත යැවෙන ඉනිමං ලෙස මේවා භාවිත වේ. මේ කෘතියේ පළ වූ මේ


සිතුවිල්ල පිළිබඳව උත්සුක වන ජපාන ආයතනයක් මෙම ඉනිමං තැනීම අත්හදා බැලීමට සැරසෙන අතර 2050 වනවිට ඒවා තනානිම කිරීමේ ඉලක්කයක සිටී. එහෙත් චීනය 2045 වනවිට එය නිම කිරීමට අදහස් කරයි.

විද්‍යා ප්‍රබන්ධයන් යනු හුදු සිහින හෝ කයිවාරු කතා නොවේ. ඒවා තාක්ෂණික සංවර්ධනයේ අනාගතය පිළිබඳ පුරෝකතනයන් වැන්න. ඒවායෙහි සඳහන් වන පරිදිම නොවුනත්, ඒ කාලවකවනුවලදීම සිදුනොවුණත් විද්‍යා ප්‍රබන්ධයන්ගේ තිබුණු, විශේෂයෙන් අභ්‍යවකාශ තාක්ෂණයට අදාළ බොහෝ දේ සැබෑ වෙමින් තිබේ. ඒ අනුව ගත්කළ ග්‍රහලෝකයන් හා ඒවායේ සම්පත් මිනිස් පරිහරණයට යොදාගැනෙන අභ්‍යවකාශ යුගය වැඩි ඈතක නොවනු ඇත.

අභ්‍යවකාශ තාක්ෂණයට අතගැසූ ඇමෙරිකාව මිනිසුන් සහිතව යානා අභ්‍යවකාශය වෙත යැවීමේ තුන්වන වැඩසටහන ලෙස ඇපලෝ වැඩසටහන සැලසුම් කළේය. එය මල්පල ගන්වමින් 1969 ජූලි 20 වන දින ඇපලෝ 11 යානය මඟින් නීල් ආම්ස්ට්‍රෝන්ග් සහ එඩ්වින් ඕල්ඩ්‍රින් මිනිස් ඉතිහාසයේ පළමුවරට සඳ මත පාතැබූහ. ඉන්පසු ඇපලෝ වැඩසටහනේ අවසන් මෙහෙයුම ලෙස 1972 වසරේදී ඇපලෝ 17 මඟින් ගගනගාමීන් සඳ මතට යවනු ලැබුයේ පස් වන වතාවට වන අතර එම වතාවන් පහේදී ගගනගාමීන් 12 දෙනෙක් සඳමත පාතැබූහ. ගගනගාමීන් සහිතව අභ්‍යවකාශ යානා යැවීමේ තාක්ෂණයේ අත්හදා බැලීම් මෙන්ම චන්ද්‍රයාගේ භූ විද්‍යාත්මක තතු අධ්‍යයනය ඇපලෝ මෙහෙයුමෙන් සාර්ථක කෙරිණි.

ඉන්පසු දිගින් දිගටම සිදුකෙරුණු අභ්‍යවකාශ තාක්ෂණික පර්යේෂණයන්ගේ ඊළඟ කඩඉම වන්නේ අන්තර්ජාතික අභ්‍යවකාශ මධ්‍යස්ථානයයි. ඇමෙරිකාව, රුසියාව ප්‍රමුඛ රටවල් කිහිපයක දායකත්වයෙන් ගොඩනැගුණ මෙම මධ්‍යස්ථානය පෘථිවි පෘෂ්ඨයේ සිට කිමී 413ක් ඉහළින් පෘථිවි පහත කක්ෂයේ පිහිටුවා ඇත. මෙය මීට වසර 23කට එපිට දී එනම් 1998 දී නිල වශයෙන් ස්ථාපිත කළ අතර දැනට මීටර් 100ක දිගින් සහ මීටර 70 පළලින් යුතුය. මෙහි ගගනගාමීන් 07දෙනෙකු පූර්ණකාලීනව රැඳවිය හැකි අතර පහළ ගුරුත්ව බලයන් සහ අභ්‍යවකාශ පරිසරයක් තුළ ජීවවිද්‍යාත්මක ක්‍රියාදාමයන් සහ භෞතික විද්‍යාත්මක දෑ සිදුවන්නේ කෙසේදැයි යන පර්යේෂණයන් මෙහි සිදුකෙරේ. සඳෙහි සහ අඟහරුගේ දීර්ඝකාලීන මෙහෙයුම් සඳහා අවශ්‍ය දෑ කෙසේ විය යුතුද යන්න මෙහි සිට සැලසුම් කරමින් සිටී.

මේ අතර පෘථිවි කක්ෂය මත චන්ද්‍රිකාවක් ස්ථාන ගත කළ



පස්වැනි රට බවට පත්වෙමින් චීනය 1970 තම ප්‍රථම චන්ද්‍රිකාව ගුවන් ගත කළේය. ඉන්පසු ගගනගාමීන් සහිත සිය පළමුවන යානය 2003 වසරේදී ගුවනට යැවුණේ එසේ කළ තුන්වන රට බවට පත්වෙමිනි. මෙය Project 921 ලෙස නම් තැබූ ව්‍යාපෘතියේ පළමුවන මෙහෙයුමයි. එහි දෙවන මෙහෙයුම වූයේ අභ්‍යවකාශයේ පරීක්ෂණාගාර ස්ථාපිත කිරීමයි. 2016 වන විට එම පරීක්ෂණාගාර ටියැන්ගොන්ග් 1 සහ ටියැන්ගොන්ග් 2 ලෙස අභ්‍යවකාශ ගත කර එමඟින් විවිධ පර්යේෂණ සාර්ථකව සිදුකෙරුණි. Project 921හි තුන්වැනි සහ අවසන් මෙහෙයුම ලෙස සැලසුම් වූයේ අභ්‍යවකාශ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමයි. 2022 අප්‍රේල් මාසයේදී මෙම මධ්‍යස්ථානයේ පළමුවන මොඩියුලය දියත් කළ අතර බලාපොරොත්තු වූ අයුරින් එහි කටයුතු සිදුවෙමින් තිබේ.

ගගනගාමීන් නොමැතිව සඳ ගවේෂණය චීනයේ ඊළඟ මෙහෙයුම වූ අතර යානාවක් සඳෙහි කක්ෂ ගත කිරීම, සඳ මතුපිටට ගොඩබැස්වීම සහ වැදගත් සාම්පල සහිතව නැවත පෘථිවිය මතට ගෙන්වා ගැනීම එහි අදියර ත්‍රිත්වයයි. ඒ අනුව 2018දී චන්ද්‍රිකාවක් චන්ද්‍ර කක්ෂය මත රැඳවීමටත් 2019 දී රෝවරයක් සඳ මතුපිටට සාර්ථකව ගොඩබැස්වීමටත් චීනය සමත්ව සිටී. මෙම රෝවරය එකතුකරග න්නා දත්ත චන්ද්‍ර කක්ෂය මත රඳවා ඇති චන්ද්‍රිකාව මගින් පෘථිවිය මතට සම්ප්‍රේෂණය කිරීම මානව අභ්‍යවකාශ ගවේෂණ ඉතිහාසයේ එක් වැදගත් සන්ධිස්ථානයක් ලෙස සැලකේ. එමෙන්ම 2020 දී දියත් කළ මෙහෙයුමකින් සඳේ පාෂාණ සාම්පල සාර්ථකව පෘථිවිය මතට ගෙනඑන්නට සමත්වූ ලොව තෙවැනි රට බවට චීනය පත්විය.

අභ්‍යවකාශ ගවේෂණයේ ඊළඟ පියවර ලෙස චීනයේ ග්‍රහලෝක ගවේෂණ වැඩසටහන පිළිබඳව චීන රජය විසින් ප්‍රකාශයට පත්කළේ 2020 වසරේදීය. ඒ, අඟහරුගෙන් ආරම්භ කර විවිධ ග්‍රහක සහ බ්‍රහස්පති මෙන්ම තවත් ග්‍රහලෝක ගවේෂණය කිරීමයි. මෙහි පළමු මෙහෙයුම ලෙස ටියන්වෙන්-1 අඟහරු ගවේෂණ මෙහෙයුම 2020 ජූලි මස 23 අරඹමින් 2021 පෙබරවාරි වනවිට එකී යානය අඟහරුගේ කක්ෂය වෙත සම්බන්ධ කිරීමටත් 2021 මැයි වනවිට රෝවරයක් අඟහරු වෙත සාර්ථකව ගොඩබැස්සවීමටත් චීනයට හැකි විය.

2029 වනවිට චීනය සඳ මතට ගගනගාමීන් සහිත යානා යවමින් සඳෙහි දක්ෂිණ ධ්‍රැවයෙහි පර්යේෂණායතනයක් ගොඩනැගීමට අපේක්ෂා කරයි.

මේ අතර ඇපලෝ මෙහෙයුමෙන් වසර 50කට පසු නැවත මිනිසුන් සඳ මතට යැවීමේ මෙහෙයුමක් ඇමෙරිකාව විසින්ද සැලසුම් කරමින් සිටී. අනෙකුත් රටවල් විශේෂයෙන් චීනය චන්ද්‍ර ගවේෂණයට අතගසා සිටීම ඇමෙරිකාවට බලපෑමක්ව තිබේ. චීනයේ සඳ මතට රොබෝවරුන් යැවීමේ මෙහෙයුම සම්බන්ධයෙන් අදහස් දක්වන ඇමෙරිකානු නාසා ආයතනයේ පරිපාලක බිල් නෙල්සන් ටයිම්ස් සඟරාවට මෙසේ පවසා තිබේ. “ඔවුන් කුමක් කියාවිදැයි කියා අප සැලකිලිමත් විය යුතුයි. ඔවුන් කිවුවොත් සඳේ මේ කලාපය අපට අයිතියි! ඔයාල පැත්තකට වෙන්න කියලා”

ඇමෙරිකාවේ මීළඟ චන්ද්‍ර මෙහෙයුම “ආර්ටිමිස්” ලෙස නම් කර තිබේ. ආර්ටිමිස් යනු ඇපලෝගේ නිවුන් සොහොයුරියක් වන සඳට අධිපති ග්‍රීක දේවතාවියයි. ඇමෙරිකාව සමඟ සාම්ප්‍රදායිකවම අභ්‍යවකාශ ගවේෂණයට එක්ව සිටි ජපාන, කැනඩා මෙන්ම යුරෝපා අභ්‍යවකාශ ඒජන්සි හා එක්ව මෙම මෙහෙයුම සැලසුම් කර ඇති අතර තවත් රටවල් ගණනාවක් සහ පෞද්ගලික සමාගම් ගණනාවක් සමඟද ගිවිසුම් ගතවෙමින් මෙම මෙහෙයුම ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. මුල් මෙහෙයුම ලෙස ආර්ටිමිස් 1 මඟින් මිනිසුන් රහිත යානාවක් චන්ද්‍රයාගේ කක්ෂයට යවා තොරතුරු ඒකරාශි කිරීමක් බලා පොරොත්තු වන අතර මෙම සැප්තැම්බරයේ දියත් කිරීමට යොදාගෙන තිබූ එම මෙහෙයුම තාවකාලිකව කල් දැමුණි. ආර්ටිමිස් 2 ලෙස මෙම මෙහෙයුමේ දෙවන අදියර 2024දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන අතර එහිදී ගගනගාමීන් සිව්දෙනෙකු රැගත් යානාවක් සඳ ආසන්නයට යැවීමටත් එහි සැරිසරමින් විවිධ පර්යේෂණාත්මක කටයුතුවල නියැලීමටත් බලපොරොත්තු වන දින දහයක මෙහෙයුමකි. ඉහත මෙහෙයුම් දෙක සාර්ථක වන්නේනම් ආර්ටිමිස් 3 මෙහෙයුම 2025 දී ක්‍රියාත්මක වනු ඇත. එහිදී ගගනගාමියෙකු සහ පළමු කාන්තාව සඳ මතුපිටට ගොඩ බසිනු ඇත. චන්ද්‍රයාගේ දක්ෂිණ ධ්‍රැවය ප්‍රදේශයට ගොඩබෑසීමට සැලසුම් කර ඇති අතර එහි සතියක් ගතකිරීමට මොවුහු බලාපොරොත්තු වෙති. මෙම ආර්ටිමිස් මෙහෙයුම සාර්ථක වුවහොත් සඳෙහි කක්ෂයෙහි සහ සඳ මතුපිට ස්ථිරව කඳවුරු බැඳීමට නාසා ආයතනය සැලසුම් කරයි.

"අනාගත පරම්පරාව අපේ සෞරග්‍රහ මණ්ඩලයේ සෑම තැනකම විසිරී සිටිනු ඇත. එහෙත් ඒ සඳහා පළමු නැවතුම සඳෙහි විය යුතුයි. එය සාක්ෂාත් කරගන්න බැරිවුව හොත් අඟහරු වෙත යාමට නොහැකි වේවි." මේ නාසා ආයතනයේ ප්‍රබලයෙකු ගේ ප්‍රකාශයයි. එනම් මෙම ආර්ටිමිස් මෙහෙයුම මගින් සඳ මතුපිට කඳවුරු බඳිමින් එහි විවිධ ද්‍රව්‍යයන් විශේෂයෙන් අභ්‍යවකාශ යානාවන්හි බලශක්තිය ලෙස අයිස් යොදාගනිමින් අඟහරු වෙත යෑමේ සැලසුම් මෙන්ම සඳෙන් විවිධ ප්‍රයෝජන ගැනීමේ හැකියාව මෙන්ම සඳ මතුපිටට වාණිජමය සංචාරයන් දියත් කිරීමද දීර්ඝ කාලීන අරමුණු අතර වේ.

ඇමෙරිකානු ප්‍රබලයා සමඟ කරට කර සිටි සමාජවාදී කඳවුරේ ප්‍රධානියා වූ සෝවියට් රුසියාව අතර විශේෂයෙන්ම දෙවන ලෝක යුද්ධයෙන් පසු අභ්‍යවකාශ තරගයක් ඇතිවිණි. තම තමන්ගේ ජාතික අරක්ෂාව පතා බැලස්ටික් මිසයිල අත්හදා බලීමෙන් ඇරඹි මේ තරගය කෘත්‍රිම චන්ද්‍රිකා ගුවන වෙත යැවීම, රොබෝවරු සහිත අභ්‍යවකාශ යානා දියත් කිරීම, ගගනගාමීන් අභ්‍යවකාශයට යැවීම හා සඳ මතට මිනිසුන් ගොඩබැසීම දක්වාම වූ තරගයක් විය. මෙහෙදී පළමු චන්ද්‍රිකාව ලෙස ස්පුට්නික් 1, 1957දී අභ්‍යවකාශ ගත කිරීමට හා අභ්‍යවකාශයට මිනිසෙක් යැවූ පළමු රට බවට පත්වෙමින් 1961 අප්‍රේල් 12 වොස්ටොක් 1 යානයෙන් යූරි ගගාරින් පෘථිවි කක්ෂයට යැවීමට සෝවියට් රුසියාව සමත් විය. මේ අභ්‍යවකාශ තරගයේදී 1969 ජූලි 20 සඳ මතුපිටට පළමු මිනිසා යැවීමට සමත් වුයේ ඇමෙරිකාවයි. දැන් අභ්‍යවකාශ තරගය ඇති වී තිබෙන්නේ චීනය සහ ඇමෙරිකාව ප්‍රමුඛ කඳවුර අතරය.

එතෙක් මෙතෙක් සිදුකළ අභ්‍යවකාශ මෙහෙයුම්වලින් අප ලබාගත් ජයග්‍රහණයන් අතිමත්ය. මිනිස් සංහතියේ පැවැත්ම උදෙසා තාක්ෂණය මෙන්ම නිෂ්පාදනයන්ද දියුණුවීම අනිවාර්යකි. එහි දිගුව ලෙස අභ්‍යවකාශය, ග්‍රහලෝක සහ එහි සම්පත් යොදා ගැනෙන අභ්‍යවකාශ යුගයද යථාර්ථයක් විය යුතුය. එය වේගවත් වීම සඳහා තරගයක් අත්‍යාවශ්‍යය. එහෙත් මිනිස් සංහතියේ සුභ සිද්ධියට වඩා බලතණ්හාවට, ආධිපත්‍යය අතට ගැනීමට, ප්‍රබලයා තමන් බවට පත්වීමට තරග කිරීම මිනිස් සංහතියේ විනාශයට මඟ පෑදෙන බව ලෝකය පුරා සිදුවූ සහ සිදුවන යුද්ධ සහ මහා පරිමාණ පරිසර විනාශයන්ගේ අත්දැකීම් අපට මොනවට පැහැදිලි කර දේ.

මෙම ලිපිය අවසන් කිරීමට, ශ්‍රේෂ්ඨ සෝවියට් ලේඛකයෙකු වූ චිංගීස් අයිත්මාතව්ගේ "සියක් වසක් පවත්නා දවස" කෘතියෙන් කොටසක් උපුටා දක්වමු. සෝවියට් සමාජවාදය අළලා 1980දී ලියැවුණ මෙම නවකතාවේ කතාව තුළද අභ්‍යවකාශ මධ්‍යස්ථානයක් අරභයා විස්තරයක් තිබේ. මෙයින් ලේඛකයාගේ අභිමතාර්ථය කුමක්වීද සහ ලෙෆ්ට් සඟරාවේ මේ ලිපියට එය අදාළ කර ගත යුත්තේ කෙසේදැයි තීරණය කිරීමට පාඨක ඔබට භාරකරමු.



එම කෘතියේ සඳහන් වන පරිදි අභ්‍යවකාශ වස්තූ පරීක්ෂණය කිරීම සඳහා වන ඇමෙරිකානු සෝවියට් ඒකාබද්ධ වැඩසටහනක් "ඩෙමියුර්ගෝස්" නමින් ක්‍රියාත්මකය (ඩෙමියුගෝර්ස් යනු ප්ලේටෝගේ විශ්වයේ නිර්මාතෘය). මෙම වැඩසටහනේ අභ්‍යවකාශ මධ්‍යස්ථානය "සමානයෝ" ලෙසින් හැඳින්වෙන අතර එය ස්ථාන ගත කර තිබෙන්නේ ට්‍රැම්පෝලයින් යන සංකේත නාමයෙන් හඳුන්වන වෙනත් කක්ෂයකය. මෙම වැඩසටහනේ ඒකාබද්ධ පාලක මධ්‍යස්ථානය නැවක් තුළ පිහිටුවා ඇති අතර එය "ඔබ්ට්සෙනූජ්ර්" නම් වෙයි. මෙම නෞකාව ස්ථාන ගත කර තිබුණේ දෙරටෙහි නගර දෙකක් වන ව්ලැඩිවොස්ටොක් හා සැන්ප්‍රැන්සිස්කෝ දෙනුවරට හරියටම ගුවනින් සමාන දුරකින් පැසිපික් සාගරයෙහි ස්ථානයකය.


"සමුදුරෙහි මේ ගුවන්යානා ප්‍රවාහන නෞකාව නවත්වා තබන ලද ස්ථානය කෙසේවත් අහම්බයක් නම් නොවූයේය. ඩෙමියුර්ගෝස් වැඩසටහන සැලසුම් කිරීමේදී හා නිර්මාණය කිරීමේදී මුල පටන්ම පැහැදිලිතාවය, විචක්ෂණශීලී බව හා දුරදර්ශීබව පිළිබඳ මනාව ප්‍රදර්ශනය කරන ලද්දේය. වෙනකක් තබා යාත්‍රාව ස්ථාන ගත කිරීමේදී පවා අසමසම විද්‍යාත්මක හා තාක්ෂණික සහයෝගී ප්‍රයත්නයේ පාර්ශ්වයන්හි පූර්ණ සමාන අයිතිවාසිකම් පිළිබඳ මූලධර්මය මනාව නිරූපණය කරන ලද්දේය.

අවශ්‍ය සියලුම උපකරණයන්ගෙන්, බලශක්තිය හා සම්පත් අතින් සම්පූර්ණ වූ කොන්වෙන්ෂන් නම් ගුවන්යානා ප්‍රවාහන යාත්‍රාව වෙත පාර්ශ්වයන් දෙකටම එක හා සමානව හිමිකම් පැවති සේම වැඩසටහන මෙහෙයවන රටවල් දෙකම එහෙයින් මේ සහයෝගී යාත්‍රාව සම අයිතිකරුවන් වූයේය. එසේම ඊට නොවාඩා හා සරෝසෙක් ගගන මධ්‍යස්ථාන සමඟින් සෘජු මෙන්ම සමගාමී ගුවන්විදුලි-දුරකථන මෙන්ම රූපවාහිනී සන්නිවේදන පහසුකම් පැවතියේය. මේ ගුවන්යානා ප්‍රවාහන නෞකාව මත ජෙට් යානා අටක් රඳවා තිබුණේය. ඒ එක් පාර්ශ්වයක හතර බැගිනි. එසේම කොන්වෙන්ෂන් යාත්‍රාවේ එක සමාන බලතල සහිත කපිතාන්වරු දෙදෙනෙක්ද සිටියෝය. ඉන් එකෙක් සෝවියට්වරයෙකි. අනෙකා ඇමෙරිකානුවෙකි. ඔවුන් හඳුන්වනු ලැබුවේ කපිතාන් 1-2 හා කපිතාන් 2-1 වශයෙනි. මේ දෙදෙනාටම සිය රාජකාරී සම්බන්ධයෙන් පූර්ණ බලතල හිමිවූයේය. එසේම යාත්‍රාවේ කාර්යමණ්ඩලයද සෑම අවස්ථාවකම එක සමාන සංඛ්‍යාවකින් යුක්ත වූයේය. ඒ අනුව රටවල් දෙකෙන් සමාන සංඛ්‍යාවක නැවියෝ, කාර්මිකයෝ, විදුලි කාර්මිකයෝ, යාත්‍රාපදවන්නෝ හා ආවතේවකරුවෝ එහි වූවෝය. එපමණක් නොවේ. ඒ මධ්‍යස්ථානයේ විද්‍යාත්මක හා කාර්මික කාර්ය මණ්ඩලයද පත්කරන ලද්දේද ඒ අයුරින්මය. ඒ අනුව වැඩසටහනේ ප්‍රධාන අධ්‍යක්ෂවරුන්ගේ සිට ප්‍රධාන අභ්‍යවකාශ විද්‍යාඥයින් සියලුම විද්‍යාත්මක හා කාර්මික කාර්යමණ්ඩල හා අනෙක් විශේෂඥයින් දක්වා වන පිරිස් එක සමාන වන අයුරින් පත්කරනු ලැබ තිබුණේය. මීට සමාන අයුරින්ම පෘථිවියේ සිට දුරින්ම පිහිටි කක්ෂයේ ස්ථානගත කෙරුණු ඉංග්‍රීසියෙන් පැරිට් හා රුසියානු බසින් පැරිවෙට් යනුවෙන් හඳුන්වන ලද අභ්‍යවකාශ මධ්‍යස්ථානයේද කටයුතු පෘථිවියේ අනුගමනය කරන ලද පූර්ණ සමානාත්මතා මූලධර්මයට අනුවම කෙරීගෙන ගියේය."

"ඩෙමියුගෝර්ස් වැඩසටහන මඟින් නියෝජනය කරන ලද්දේ සියවසෙහි අභ්‍යවකාශ ගවේෂණයේ ඉතාම භාරධූර වූද සුවිශාල වූද කර්තව්‍යයකි. එනම් 'එක්ස්' ග්‍රහලෝකය පිළිබඳ ගවේෂණය කිරීමයි. එහි අරමුණ වූයේ ග්‍රහයා තුළ පිහිටි පෘථිවියේ මිනුම් දඬුවලට අනුව මිනිය නොහැකි තරම් වූ වටනා ඛනිජ සම්පත්, බලශක්ති සංචිත ප්‍රයෝජන ගැනීමට මං සෙවීමයි."

සියක් වසක් පවත්නා දවස කෘතියේ සඳහන් "ඩෙමියුර්ගෝස්" අභ්‍යවකාශ වැඩසටහන ඇමෙරිකාව සහ සෝවියට් රුසියාව යන දෙරටේ ඒකාබද්ධ වැඩසටහනකි. සැබැවින් අවශ්‍ය වන්නේ ඉන් ඔබ්බටත් යමින් දෙරටක පමණක් නොව සමස්ත ලෝකයම එක්ව එක් මානව ප්‍රජාවක් ලෙස අනාගත පරපුරේ යහපැවැත්ම සහ සුභසිද්ධිය වෙනුවෙන් අභ්‍යවකාශ තාක්‍ෂණය භාවිත කරන වටපිටාවකි.

# මිනිස් මොළයේ විශිෂ්ටතම අභිරහසක්



වර්ෂ 1587දී ව්‍යවච්ඡේදක සහ ශල්‍ය වෛද්‍ය ජුලියස් සීසර් ඇරන්ටියස් විසින් මිනිස් මොළය විච්ඡේදනය කරන විටදී එහි අභ්‍යන්තරයේ වූ මුහුදු අශ්වයෙකු හා සමාන අපූරු කුඩා ව්‍යුහයක් නිරීක්ෂණය කළේය. එය ඉන් පෙර කිසිවෙකුත් දැක නොතිබූ දෙයකි. ඒ නිසා එහි හැඩය සලකා බැලූ ඇරන්ටියස් ග්‍රීක මිථ්‍යා කතාවල එන මුහුදු අශ්වයෙකු වූ "හිපෝකැම්පස්" (Hippocampus) ගේ නාමයම ඒ නව ව්‍යුහයටත් ලබා දෙන ලදී.

හිපෝකැම්පසය මොළයේ අභ්‍යන්තරයේ එක් මස්තිෂ්ක අර්ධ ගෝලයට එක බැගින් පවතින නිවුන් ව්‍යුහයකි.

මනෝවිද්‍යාවට අනුව මානව බුද්ධිය ප්‍රධාන ශාඛා දෙකකට වෙන් කර දැක්විය හැකි බව මනෝවිද්‍යාඥ රේමන්ඩ් කැටෙල් විසින් 1963දී පැවසුවේය. ඒ ස්ඵටික බුද්ධිය (Crystallized intelligence) සහ ගතිකමය හෝ තරලමය බුද්ධිය (Fluid Intelligence) වශයෙනි. ගතික බුද්ධියට දිය දහරක් ගලා යන්නා සේ නම්‍යශීලීව නව මාවත් ඔස්සේ ඇදී යා හැකිය. නව අත්දැකීම් වේගයෙන් ග්‍රහණය කරගත හැකිවීම, වෙනස්කම්වලට ඉක්මනින් අනුවර්තනය විය හැකිවීම, නව ගැටලු විසඳීම, නිර්මාණශීලී චින්තනය ගතික බුද්ධියට අයත්ය. ස්ඵටික බුද්ධිය මතකය හා බැඳී පවතී. පළිඟුවක අංශු සැකසී ඇති අන්දමට පිළිවෙළින් තොරතුරු මොළය තුළ ගබඩා කිරීම සහ ඒවා සුදුසු පරිදි ආවර්ජනය කිරීමට හැකිවීම ස්ඵටික බුද්ධියට අයත් ඒවායි.

ඖපපාතිකව ජනනය වීමේ හැකියාවක් මතකයට නැත. එය ගොඩනැගෙන්නේ


එදිනෙදා අපි අත්දකින, අහන-ඇහෙන, කියවන, ඉගෙනගන්නා නානාවිධ දෑ තුළිනි. සිරුරේ ඇති පංචේන්ද්‍රියන් මෙකී සංඥා හසුකර මොළය කරා යොමු කිරීමේ රාජකාරිය සිදුකරයි.

වස්තුවක් මතින් පරාවර්තනය කරන ආලෝකය ඇසේ දෘෂ්ටි විතානය මත වැටීමෙන් රූපයත්, ධ්වනි තරංගයක් කණෙහි කර්ණ පටහ පටලය (කණ් බෙරය) කම්පනය කිරීමත්, එමගින් ඇතුල් කණෙහි ශ්‍රවණ ස්නායු උත්තේජනය වීමෙන් ශබ්දයත්, රසායනික අංශු නාසයේ සංවේදක ස්නායු උත්තේජනය කිරීමෙන් ගන්ධයත් අපට දැනේ. දිවෙන් රසයත්, සමෙන් ස්පර්ශයත් ග්‍රහණය කරගන්නේ එසේමය. ඒ අනුව ගෙවෙන සෑම මොහොතකම පාහේ සවිඥානිකව සහ අවිඥානිකව දස දහස් ගණනක් සංවේදන අපගේ මොළය වෙත යා යුතුය. නිදසුනක් ලෙස අප මාවතක ඇවිදමින් යන්නේ නම් අපගේ අවදානයෙන් බැහැරව වුව අපට ඇසෙන, පෙනෙන, දැනෙන සියලුම දෑ, වාහන, ශබ්ද, ඇඟේ හැපෙන මිනිසුන් ආදී සියලුම දෑ පිළිබඳ දත්ත මොළයට ලැබිය යුතුය. නමුත් පසුකාලීනව අපට ඒ සියල්ල ආවර්ජනය කළ නොහැකිය. එනම් අපගේ පංචේන්ද්‍රියන්ට ග්‍රහණය වූ ඒ සියලු දෑ අපගේ මතකයේ නොපවතීමයි. එසේවීමට නම් සංවේදන ලැබීම සහ මතකය ගොඩනැගීම අතර ගමන් පථයේ එක් තැනක "සුවිචයක්" තිබිය යුතුය. 1950 වසරේදී අතිශය අහඹු ලෙසින් එකී ස්විචය මුහුදු අශ්වයාගේ හැඩයෙන් යුතු හිපෝකැම්පසය බව සොයාගැනිණ.

අපගේ පංචේන්ද්‍රියන්ට ග්‍රහණය වන සියලු දත්ත මොළයට යැවුණු පසු හිපෝකැම්පසය තුළදී විද්‍යුත් රසායනික ආවේග බවට පත්වී තාවකාලික මතකය ලෙසින් තැන්පත් වේ. නමුත් ඉන් අනවශ්‍ය දෑ පෙරා අවශ්‍ය දෑ පමණක් ස්ථිර මතකය ලෙසින් මොළයේ තැන්පත් කිරීමේ රාජකාරිය හිපෝකැම්පසය සිදුකරයි. එකී මතක ගබඩාවට අවශ්‍ය උපාගම සබඳතා (synapses) ගොඩනැගීමට අවශ්‍ය රසායනයන් හිපෝකැම්පසය විසින් නිපදවනු ලබයි. මොළයට දෛනිකව යැවෙන තොරතුරුවලින් 99%ක්ම මෙලෙස පෙරාදමා ඉතිරි 1%ක ප්‍රමාණයක් පමණක් මොළය තුළ ස්ථිර මතකය ලෙසින් ගබඩා වේ. නැතිනම් පෙටා බයිට් 2.5ක් හෙවත් ගිගාබයිට් මිලියන 2.5ක මානව මොළයේ මතක ධාරිතාව අනවශ්‍ය තොරතුරුවලින් පිරී යනු ඇත.

**(සංකල්ප ගුණතිලක**
FB **පිටුවෙන් උපුටාගන්නා ලදී)**

# මගේ බිරිඳ
# වැඩ කරන්නෙ නෑ



ස්වාමිපුරුෂයෙකු (H) සහ මනෝවිද්‍යාඥයෙකු (P) අතර සංවාදය

P: ඔබ ජීවත් වීමට කුමක් කරන්නේද බන්ඩි මහතා?

H: මම බැංකුවක Accountant කෙනෙක් විදිහට වැඩ කරනවා.

P: ඔබේ බිරිඳ?

H: ඇය වැඩ කරන්නේ නැහැ, ඇය ගෘහණියක් පමණයි.

P: ඔබේ පවුලේ අයට උදේ ආහාරය හදන්නේ කවුද?

H: මගේ බිරිඳ, මොකද ඇය වැඩ නොකරන නිසා.

P: ඔබේ බිරිඳ උදේ ආහාරය සෑදීමට අවදි වන්නේ කීයටද?

H: ඇය උදේ 5ට පමණ අවදි වන්නේ. ඒ ඇය උදේ ආහාරය සෑදීමට පෙර නිවස පිරිසිදු කරන බැවිනි.

P: ඔබේ දරුවන් පාසලට යන්නේ කෙසේද?

H: මගේ බිරිඳ ඔවුන්ව පාසලට රැගෙන යනවා, ඇය වැඩ නොකරන නිසා.

P: ඔබේ දරුවන් පාසලට රැගෙන ගිය පසු, ඇය කුමක් කරන්නේද?

H: ඇය වෙළඳපොළට ගොස් නැවත ගෙදර යනවා, ඉවුම් පිහුම් සහ රෙදි සේදීම සඳහා. ඔබ දන්නවා ඇය වැඩ කරන්නේ නැහැ කියලා.

P: හවස office ගිහින් ගෙදර ගියාට පස්සෙ මොකද කරන්නේ?

H: දවස පුරා වැඩ නිසා මට මහන්සියි නිසා විවේකයක් ගන්නවා.

P: එතකොට ඔයාගේ බිරිඳ මොනවද කරන්නේ?

H: ඇය ආහාර පිළියෙල කරනවා, අපේ දරුවන්ගේ වැඩ කරනවා, මා වෙනුවෙන් ආහාර පිළියෙල කරනවා, පිඟන් පිරිසිදු කරනවා, නිවස පිරිසිදු කරනවා, ඉන්පසු දරුවන්ගේ වැඩ.

ඉහත කතාවෙන් වඩා වැඩ කරන්නේ කවුද කියලා ඔබ සිතන්නේ?
ඔබේ භාර්යාවන්ගේ දෛනික චර්යාවන් උදෑසන සිට රාත්‍රිය දක්වා ආරම්භ වන අතර ඔබ එය වැඩ කරන්නේ නැහැ යැයි හැඳින්වූයේද? ඔව්, ගෘහණියන්ට අධ්‍යයන සහතිකය අවශ්‍ය නොවේ, ඉහළ තනතුරක් පවා, නමුත් ඔවුන්ගේ භූමිකාව ඉතා වැදගත්ය!

කාන්තාවකගෙන් "ඔයා වැඩ කරන කාන්තාවක්ද නැත්නම් ගෘහණියක්ද?" යනුවෙන් ඇසූ පැනයට
ඇය පිළිතුරු දුන්නේ මෙසේය.
ඔව්, මම පූර්ණ කාලීනව වැඩ කරන ගෘහණියක්.
මම දවසට පැය 24ම වැඩ කරනවා.
මම අම්මා කෙනෙක්.
මම බිරිඳක්.
මම දුවක්.
මම ලේලියෙක්.
මම අනතුරු ඇඟවීමක්.
මම කෝකියෙක්.
මම සේවිකාවක්.
මම ගුරුවරියක්.
මම වේටර් කෙනෙක්.
මම අත්තම්මා කෙනෙක්.
මම හෙදියෙක්.
මම නිරූපන ශිල්පිනියක්
මම ආරක්ෂක නිලධාරියෙක්.
මම උපදේශකයෙක්.
මම සැනසිල්ලක්.
මට නිවාඩු නොලබන්නියක්.
මට අසනීප නිවාඩු ලැබෙන්නේ නැහැ.
මම දිවා රාත්‍රිය පුරා වැඩ කරනවා.

ඉතින් ඇය දවස පුරා කරන්නේ කුමක්ද??
ගැහැනියකට ඇත්තේ ලුණු වැනි අසමසම චරිතයකි. ඇගේ පැමිණීම කිසි විටෙකත් මතක නැත. ඇගේ නොපැමිණීම සියල්ල නීරස කරයි.

**(FB සමාජ ජාලයෙනි)**

# දැනෙන ආදරය



එක් කුඩා දරුවෙක් ගුරුතුමා වෙත පැමිණ “ගුරුතුමනි... ආදරය කියන්නේ මොකක්ද...? මට එය පෙන්වන්න” යැයි ඉල්ලා සිටියේය.

ගුරුවරයා සිතුවේ දරුවා ඇසූ බුද්ධිමත් ප්‍රශ්නයට නිසි පිළිතුරක් ලැබිය යුතු බවයි.

ඔවුන් ඒ වන විටත් විවේකයෙන් සිටි නිසා, පාසැල් භූමිය වටා ඇවිද ගොස්, තමන් ආදරය කිරීමට කැමති ඕනෑම දෙයක් හෝ තමන් තුළ එම හැඟීම අවදි කරන ඕනෑම දෙයක් රැගෙන එන ලෙස ඔහු තම ශිෂ්‍යයන්ගෙන් ඉල්ලා සිටියේය.

කුඩා දරුවන් පිටතට දිව ගිය අතර, ඔවුන් ආපසු පැමිණි විට ගුරුවරයා සෑම කෙනෙකුටම තමන් සොයාගත් දේ පෙන්වන ලෙස පැවසීය.

පළමු ශිෂ්‍යයා මෙසේ කීය. “මම මේ මල ගෙනාවා... ඒක ලස්සනයි නේද...?”

එවිට තවත් සිසුවෙක් මෙසේ පැවසීය... “මම කුරුලු කූඩුවක ඉඳලා සොයාගත්තු මේ කුරුලු පැටියා ගෙනාවා. මම කුරුලු පැටියන්ට හුඟක් ආදරෙයි”

සියලු ළමෝ තමන් මිදුලේදී එකතු කරගත් දේ එකින් එක ගුරුතුමාට හා අනෙක් අයට පෙන්වමින් සිටියහ.

ඔවුන් පෙන්වා අවසන් වූ විට ගුරුවරයා දුටුවේ, එක් ගැහැනු ළමයෙක් කිසිවක් ගෙනැවිත් නැති බවය; ඇය පංතියේ ළමයින් කතා කරන අතරතුර නිහඬව සිටන බවය.

ඇයට පෙන්වීමට කිසිවක් නොවූ බැවින් ඇය ලැජ්ජාවට පත් වී සිටියාය.

ගුරුවරයා ඇයට කතාකොට... “හරි, ඔයාට මොකද වුණේ? ඔයාට ආදරය කරන්න පුළුවන් මොනවත් හම්බ වුණේ නැද්ද...?”

සිසුවිය ඉතා තියුනු ලෙස ගුරුවරයාගේ දෑස් දෙස බලා මෙසේ පිළිතුරු දුන්නාය. “ අනේ, මට සමාවෙන්න සර්.... මමත් මල් දැක්කා... ඒවයෙ මිහිරි සුවඳත් වින්දා... ඒත් මම මල්වලට ආදරෙයි. මල් කඩන්න යන කොට පාට පාට ලස්සන සමනලයෙක් මලේ වහනවා දැක්කා... ඉතින් මට මල හඩන්න හිතුණෙ නෑ... අතහැර දැම්මා. මමත් කුරුලු පැටවුන්ට ආදරෙයි. කූඩුව ඇතුළෙ පැටියෙක් ඉන්නවා මාත් දැක්කා. ඒත්... ගහට නගින කොට, ඒකෙ කුරුලු අම්මා දුකෙන් බලන් හිටියා. ඉතින් මම ගහෙන් බැහැලා ආවා...

ඉතින් මල්වල මිහිරි සුවඳයි, සමනල්ලුන්ගේ නිදහසයි, කුරුලු අම්මගෙ ඇස්වල මම දැකපු ස්තූතියි කියපු බැල්මයි මම මගෙ හිතෙන් අරන් ආවා... ඒක මම පෙන්වන්නේ කොහොමද? මට පුළුවන් ඒ කියන්න විතරයි...” ඇය හැඬුම්බරව කීවාය.

ගුරුතුමා සිසුවියට බොහෝ සෙයින් ස්තූතිය පළ කළේය. අප ආදරය කරන දේ කුසලානයක් නොවන බවත්, එය අපගේ හදවත් තුළ රැගෙන යන දෙයක් බවත් කී ඔහු එය තේරුම් ගත් එකම කෙනා ඇය බව ඇයට ප්‍රශංසාත්මකව පැවසුවේය.

ආදරය යනු දැනෙන දෙයකි.

සංවේදී වන්නන්ට එහි ජීවත් විය හැකිය.

**(FB සමාජ ජාලයෙනි)**

# වැටරවුම

කෙටියෙන්ම තද වැස්ස කියන්නේ දුප්පත් එවුන්ගේ බඩගෝස්තරේට විනේ කැටීම තමයි. ඒ වුණාට බඩගින්නට නින්ද තරම් බෙහෙතක් තව කොයින්ද? උදේට වැස්ස එක්ක සීතල. හවසට සීතල එක්ක වැස්ස. පෝරිසාද වැව රවුමේ බෝක්කුව යට කොන්ක්‍රීට් පිලේ තුන්වේලම බුදි. තුන්වේලම හීන දකිනවා.

"කං කං බුරූ" ඔන්න හිටපු නායකයා විසිල්සිංහ සෙල්ලම පටන්ගත්තා.

"හී හී හී පියාණෙනි, මට මේගොල්ල බූරුවා කීවා." මෙන්න පුතානෝට තරහ ගිහිල්ලා.

"බූරුවා, තොට කව්ද බූරුවා කිවුවේ. මගේ කාලේ නම් මම එක ටෙලිපෝන් කෝල් එකෙන්ම"

"අහෝ මගේ පියාණන් වහන්ස, මම කොල්ලෝ ටික බය කරගන්න ඔබ වහන්සේ ආමන්ත්‍රණය කළේ. එතකොටම ඔබවහන්සේ ඇත්තටම වැඩම කරලා. මට හරීරීරීරීරී සතුටුයි."

"උඹට බඩගිනිද? මයේ පුතේ. උඹ හාමත් වෙලා. කාලෙකින් හරියට කාලත් නෑ. අනික මේ යස කුඩයක් අතේ තියන් මොකටද තෙමෙන්නේ. යමන් මරදානට බුරියානි එකක්වත් අරන් දෙන්න."

ඔන්න ඔහොමයි හීනෙන්ම පියානෝ පුතානෝව මරදානට ගෙනාවේ. කඩේට ගොඩවෙන පඩිය අල්ලාගෙන පුතානෝ කඩේට ගොඩ වෙලා බුරියානි කන්න ගත්තා. ඒක දැක්ක පියානෝ "රට බාරයි නුඹට පුතේ" කියාගෙන වාත වේගයෙන් පිටව ගියා.

"අනේ ඉතින් අනාගත රටේ නායකයා නෙවෙයිද මේ නිහතමානිව සාමාන්‍ය හෝටලයකින් කන්නේ "කියාගෙන පාක්ෂිකයෝ වටකළා හෝටලය.

"හා හා උඹලට බුරියානි නෙවෙයි ප්‍රයිඩ් රයිස්ම හම්බෙනවා. දස දහස් ගණනින් පොලිස් හමුදාවක්ම නෑ නෑ මහ  පෙළපාළියක්ම මඟ එනවා."

"ජයවේවා නායක තුමාට. අපි දන්නවානේ කවදත් නායකතුමාගේ පියානන්ගේ නාමයෙන් සෙනඟ අඩුවක් නෑ කියලා. පුතානෝට ජයවේවා. නායකතුමා අරගලේට පොලිසියත් ගෙනල්ලා. "

"කෝ මේ මල්ලිලා. මගේ යුතුකම මම කළා. කෝ අර අර ගෙනාව කියපු සෙනඟ ගෙනාවද?."

"සෙනඟ ප්‍රශ්නයක් නෑ සහෝදරයා. පිරිස මඟ එනවලු." නවගුණ වැලක් කරේදාගෙන සජ්ජා සරණං ගච්ඡාමි කියාගෙන එකෙක් ආවා කඩපිලට.

"සහෝදරයා කිව්වා නේ? මගේ හිතාධර, භයාධර, පයෝධර පියානන් වහන්සේ හිටියා නම් සහෝදරයා යන වදනට මීට වඩා ප්‍රතිචාරයක් එන්න තිබුණා. දැනට කමක් නෑ. ඔටුන්න දාගන්නකන් සහෝ නෙවෙයි අහෝ කියන්න. හැබැයි බලය ගත්තට පස්සේ උස නම් සිකුරිටි. මිටි නම් කම්කරු මතක තියා ගන්න දෙකක් නෑ. මිටි නම් කම්කරු."

"පොදු සතුරාට එරෙහිව අපේ උපායමාර්ගය අනුව ඔබේ පියාණන් වහන්සේ හිටියා නම් අපි ඔහු සමඟ."

"මගේ පියාණන් සිටියා නම් එතුමාගේ උපාය ඔබගේ අපාය බව මම දිවුරා සහතික වෙනවා. මම වුණත් බලයට සපැමිණි වහාම එතුමාණන් වහන්සේ අනුගමනය කරනවා."

"පොදු සතුරාට එරෙහිව අපි එකඟයි නායක තුමනි."

"එකඟයි. එකඟයි. කවුද හැබෑටම කෙල්ලනි, කොල්ලනි, තොපගේ පොදු සතුරා."

"කව්ද? කව්ද? මේ මේ අර අර ජෙ ජෙ ජෙ ජෙප් ජ් ජ් ජ්"

“ආ.......පෝ මගේ පරචිත්ත විජානනයට අනුව මට තේරෙනවා. මට තේරෙනවා. ඔව් ඒ අපේත් පොදු සතුරා තමයි. එතකොට මල්ලිලා සිකුරිටි හරිනේ. ”

“හරි එහෙනම් අරගලේ පටන් ගමු. කෝ මේ ස්ටේජ්. කෝ මයික්. කෝ කැමරා.”

“අරගලේ ටෙක්නිකල් හන්දියේ. ස්ටේජ් එක මරදාන හන්දියේ. සර් තවම වන්ඩියේ. ”

“එතකොට කෝ ගෙනාව සෙනඟ” පෙරට ආව මල්ලි කෙනෙක් ඇහුවා.

“මල්ලී කී පාරක් කියන්නද ආ...හරි කෝ ඔහෙලා ගේනවයි කී ශිෂ්‍යයෝ.”

“මඟ මඟ මඟ ඇති.”

“එහෙනම් අපේ දැවැන්ත සෙනඟත් මඟ ඇති. පිපාසිත ටික දෙනෙක් බාර් ළඟ ඇති”

“නායක සර්, එහෙම කියලා බෑ. පොලිස් පෙළපාළිය ටෙක්නිකල් හන්දියට ඔන්න මෙන්න.”

“මගේ සදාදරණීය විශේෂ කාර්ය බලකා ආරක්ෂකයිනි, අපි ප්‍රජාතන්ත්‍රවාදීව පොලීසියට අරගල කිරීමට තිබෙන අයිතිය පිළිඅරන් මාර්ගයෙන් ඉවත් වෙමු. එහෙනම් කොල්ලෝ අපි ගියා ටටා බයි බායි.”

“නායක තුමා තවම අත්සන වේලිලත් නෑ ඇයි දාල යන්නේ. මුන් ගහන පාටකුත් නෑ. අපරාදේ මීඩියා. ”

“තමුන්ලගෙම එකෙකුට හොඳටම නෙළලා මීඩියා දානවා. එච්චරනේ. අරගලයට ජයවේවා. අපි ගියා.”

“එහෙම එපා සර්, ශිෂ්‍යයෝ නාවෙත් ඔබතුමාගේ මූණෝ ඔබතුමාගේ තාත්තා පේනවා කියලා.”

“හෝව් හෝව් කං කං බූරු....පිස්සු කෙළින්නේ නැතිව ප්‍රජාතන්ත්‍රවාදීව අපි ගිවිසුමේ හැටියට සෙල්ලම කරගෙන යමු.” හිටපු නායක දැන් රටේ ලොක්කා විසිල් රාජපක්ෂ එන්ටර් වුණා.

“කං කං බූරු”

“සිං සිං නෝරු” පාක්ෂික සහ නිර්පාක්ෂික පාක්ෂික සියල්ල

“මං කියනදේ අහනවද?”

“ඕ....ව්”

“එහෙනම් දුවලා දුවලා දුවලා ගිහින් ලොකු හට්ටියක් ගේනවද?”

“ඕ......ව්”

පාක්ෂික, නිර්පාක්ෂික පාක්ෂික හැමෝම දුවලා ගිහින් ලොකූ හට්ටියක් ගෙනාවා.

“කට්ටියට බඩගිනිත් ඇතිනේ ඕකට වතුර එකාක් පුරවන්න.”

“පුරවනවා ලොක්කා පුරවනවා.”

“දැන් කරේ තියෙන හිඟන මල්ලෙන් කවුරුත් හාල් මිට මිට දමන්න.”

“මේ දානවා මේ දානවා.”

“ඔන්න මාත් මිටක් දැම්මා. දැන් හැළිගානවාලා අයිසේ හැදිගානවාලා”

“මේ හැළිගානවා හැළිගානවා.”

“දැන් බෙලෙක් තැටි අරන් එන්න කැඳ බොන්න.” තැටි අරන් පෝලිම එනවා.

මුලින්ම පුතානෝලා දෙවනුව සතානෝලා පෝලිමේ එනවා.

“මගේ ජාත්‍යන්තර සබඳතා අනුව කියන්නේ කෝ කැඳ? මේ උණු වතුර විතරයි.” විසිල් සිංහ රාජපක්ෂ කීවා.

“ඉතින් කෝ සර්ගේ මිට”


“ඒකට හිලව්වට තමයි නිරායුද, නිරහංකාර, නිර්පාක්ෂික, අහිංසක පොලිස් බලකායක් එව්වේ.”


“එහෙනම් දැන් කැසිල්ල අවසන්නේ. මම යනවා පරිසර සමුළුවට. ටටා බායි අරගලයට ජයවේවා.”

“එහෙනම් නම් කම්කරු හොඳේ ”කියාගෙන පුතනෝද යන්න ගියා.

පෝරිසාද එවන් තව වලත්ත හීනෙකට කලින් නැගිටින්න හදද්දී කලබලේට සරම පැටලිලා ඇදං වැටුණා.

“දඩිං බිඩිං ජබොක්”


ARTS
EDUCATION
SCIENCES
HEALTHCARE
WAR






දශක තුනකට වැඩි කාලයකට පසු බ්‍රිතාන්‍යයේ දැවැන්තම දුම්රිය සේවක වැඩවර්ජනය පසුගිය දෙසැම්බර් මස මැදදී (13-17) දියත් කෙරිණි. උද්ධමනය ඉහළ නැගීම හමුවේ බ්‍රිතාන්‍ය දුම්රිය සේවකයින් සාධාරණ වැටුප් වැඩිවීමක් ඉල්ලා සිටි අතර දුම්රිය මෙහෙයුම් සමාගම් දාහතරක් නියෝජනය කරමින් 40,000කට ආසන්න කම්කරුවෝ එම වැඩවර්ජනයට එක්ව සිටියහ.

රාජගිරිය, කලපළුවාව, අංක 298 හි පදිංචි ටී.එම්.ජී. කණිෂ්ක රශ්මින් වන මා විසින් ටී.ඩී.එල්. ප්‍රින්ටර්ස්හි මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.